## සිව්වැනි කොටස

---

# මහ බැංකුවේ හා ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල වැඩ කටයුතු හා මෙහෙයවුම් වලට අදාළ

## 1979 ප්‍රධාන නීති අණපනත්

---


| | | |
|---|---|---|
| 1. | 1979 අංක 2 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකු පනත | I |
| 2. | 1979 අංක 14 දරන මුදල් නීති (සංශෝධන) පනත | XXIV |
| 3. | 1979 අංක 19 දරන බැංකු හර බදු (ඉවත් කිරීමේ) පනත | XXV |
| 4. | 1979 අංක 26 දරන ශ්‍රී ලංකා බැංකු කරුවන්ගේ ආයතන (සංස්ථාගත කිරීමේ) පනත | XXVI |
| 5. | 1979 අංක 27 දරන මුදල් සමාගම් පාලන පනත | XXVIII |
| 6. | 1979 අංක 52 දරන බුද්ධිමය දේපළ නීති සංග්‍රහය පනත | XXXIX |
| 7. | 1979 අංක 58 දරන ගොවිජනසේවා පනත | XL |
| 8. | 1979 අංක 71 දරන විසර්ජන පනත | XLII |

# 1979 අංක 2 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව පනත

[සහතිකය සටහන් කළේ 1979 ජනවාරි මස 5 වන දින]

**ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව පිහිටුවීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

**1.** මේ පනත 1979 අංක 2 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මේ පනතෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතුය.

## I වන කොටස

## ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුවේ සහ එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය හා බලතල

**2.** මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන, "ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු වූ බැංකුවක් නියමිත දිනයෙහි දී හෝ ඉන් පසුව හැකි ඉක්මණින් හෝ පිහිටුවනු ලැබිය යුතු අතර, ඒ බැංකුව තත්කාලයේ ඒ බැංකුවේ කොටස් හිමියන් වන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතුය.

**3.** ඒ බැංකුව 2 වන වගන්තියෙන් එයට දෙන ලද නාමයෙන් සංස්ථාගත මණ්ඩලයක් විය යුතු අතර එයට අවිච්ඡින්න පැවැත්මක් ද පොදු මුද්‍රාවක් ද තිබිය යුතුය; තව ද ඒ නාමයෙන් එය විසින් නඩු පැවරීම ද එයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි ය.

**4.** බැංකුවේ ප්‍රධාන කාර්යාලය කොළඹ පිහිටුවිය යුතු ය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවශ්‍ය යයි සලකන පරිදි, කොළඹ හැර ශ්‍රී ලංකාවේ වෙනත් ස්ථානවල බැංකුවේ ශාඛා කාර්යාල පිහිටුවනු ලැබිය හැකි ය.

5. (1) වෙනත් කරුණු වලට අමතරව, විශේෂයෙන්ම ග්‍රාමීය අංශය සංවර්ධනය කිරීම ද සැලකිල්ලට ගනිමින්, පහත සඳහන් ක්‍රියා මාර්ග මගින් මේ පනතේ විධිවිධානවලට අනුකූලව, කාර්මික, කෘෂිකාර්මික සහ වාණිජ සංවර්ධනය සහ වෙනත් සංවර්ධනයන් සලස්වා, එමගින් ශ්‍රී ලංකා ආර්ථිකය දියුණු කිරීම බැංකුවේ අරමුණ විය යුතු ය:—

(අ) කාර්මික, කෘෂිකාර්මික සහ වාණිජ සහ වෙනත් ව්‍යවසායයන්ට මධ්‍යම කාල හා දීර්ඝ කාල ණය සහ වෙනත් ආකාර ආධාර සැපයීමෙන්;

(ආ) ශ්‍රී ලංකාවේ ආයෝජන, කොටස් සහ සුරැකුම්පත් වෙළෙඳපොල තවදුරටත් සංවර්ධනය කිරීමට රුකුල් දීමෙන්;

(ඇ) කාර්මික, කෘෂිකාර්මික සහ වාණිජ සහ වෙනත් ව්‍යවසායන්හි ආයෝජනය කිරීම සඳහා දේශීය සහ විදේශීය මූලධනය එක්රැස් කිරීමෙන්; සහ

(ඈ) කාර්මික, කෘෂිකාර්මික සහ වාණිජ සංවර්ධනය සහ වෙනත් සංවර්ධනයන් සලස්වා එමගින් ශ්‍රී ලංකා ආර්ථිකය දියුණු කිරීමේ ලා නියැලීමෙන්.

(2) ස්වකීය අරමුණු ක්‍රියාත්මක කිරීමේ දී, අනුමත ණය දෙන ආයතනවල සහභාගිත්වය හෝ සහයෝගය ඇතිව ක්‍රියා කළහැකි සහ යෝග්‍ය කවර විටක වුව ද, බැංකුව විසින් එසේ ක්‍රියා කළ යුතු ය.

**6.** මේ පනතේ වෙනත් විධිවිධාන වලට යටත්ව, බැංකුවේ අරමුණු ක්‍රියාත්මක කිරීමේ දී පහත දැක්වෙන බලතල සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ බැංකුව විසින් ක්‍රියාත්මක කළ හැකි ය:—

(අ) කර්මාන්තවල, කෘෂිකර්මයේ හෝ වාණිජ කටයුතුවල නියැලී සිටින හෝ නියැලීමට සූදානම්ව සිටින කවර වූ හෝ ව්‍යවසායකට ණය සහ අත්තිකාරම් දීම;

(ආ) අනුමත ණය දෙන ආයතන වලින් කාර්මික, කෘෂිකාර්මික සහ වාණිජ ව්‍යවසායන් විසින් ලබාගන්නා ලද හෝ ලබා ගැනීමට ඇති ණයවලට ඇපවීම;

(ඈ) කාර්මික, කෘෂිකාර්මික සහ වාණිජ ව්‍යවසායන්හි ප්‍රාග්ධන නිකුත් කිරීම ප්‍රාරක්ෂණය කිරීමේ හේතුවෙන් ඇතිවන, මූල්‍ය ආයතනවල බැඳීම් වෙනුවෙන් ඇපවීම;

(ඈ) කාර්මික, කෘෂිකාර්මික සහ වාණිජ ව්‍යවසායන්හි ස්ථාවර පොලියක් රහිත ස්කන්ධවලට සහ කොටස්වලට සහභාගිවීම සහ එවැනි යම් ව්‍යවසායක ස්කන්ධ, කොටස්, බැඳුම්කර හෝ ණයකර නිකුත් කිරීම් වලට දයකවීම, ඒවා මිල දී ගැනීම හෝ ඒවා ප්‍රාරක්ෂණය කිරීම සහ එවැනි සුරැකුම්පත් විකිණීම සහ ගනුදෙනු කිරීම;

(ඉ) කාර්මික, කෘෂිකාර්මික සහ වාණිජ ව්‍යවසායන්ට අනුමත ණය දෙන ආයතන විසින් දෙන ලද සහ බැංකුව විසින් අනුමත කරන ලද වෙනත් ආයතන වලින් දෙන ලද ණය හෝ අත්තිකාරම් නැවත දීමේ මාර්ගයෙන් ණය හෝ අත්තිකාරම් දීම සහ ඒ කාර්යය සඳහා, ඒ බැංකු සහ ආයතන විසින් දෙන ලද ණය මුදල් පිළිබඳව කල්පිරීමේ උපරිම සහ අවම කාලසීමා නියම කිරීම;

(ඊ) බැංකුවේ අරමුණු සපුරාලන සහ බැංකුවේ කර්තව්‍යවලට අයත්වන ශිල්පීය සහ පරිපාලනමය උපදෙස් සහ සහාය වැනි සේවා කාර්මික, කෘෂිකාර්මික සහ වාණිජ ව්‍යවසායවලට සැලසීම;

(උ) බැංකුවේ ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමෙන් පසු ප්‍රථම අවුරුදු පහ ඇතුළත, මේ වගන්තියේ (ඊ) ඡේදයේ සඳහන් සේවාවන් සැපයීම සඳහා, ගෙවා නිමි ප්‍රාග්ධන යෙන් සියයට දෙකක් නොඉක්මවන වියදමක්, ආපසු නොගෙවීමේ පදනමක් මත, දැරීම සහ ඉන් පසුව, අවශ්‍ය අවස්ථාවල දී, ආපසු නොගෙවීමේ පදනම මත, එකී සේවාවන් නොකඩවා සැලසීම සඳහා දරන ලද වියදම බැංකුවේ අරමුදලට වැය බර කිරීම;

(ඌ) බැංකුවේ අරමුණු ක්‍රියාත්මක කිරීමේ දී ද, බලතල ක්‍රියාත්මක කිරීමේ දී ද, කාර්යයන් කිරීමේදී ද බැංකුවට සහායවීම සඳහා උපකාරක සමාගම් පිහිටුවීම;

(එ) කාර්මික, කෘෂිකාර්මික, වාණිජ සහ වෙනත් ව්‍යවසායන් පිහිටුවීමට අනුබල දීම;

(ඒ) යම් නිශ්චල හෝ චංචල දේපලක් හෝ යම් කාර්මික, කෘෂිකාර්මික, වාණිජ හෝ වෙනත් ව්‍යවසායන් අත්කර ගැනීම හෝ මිල දී ගැනීම සහ එකී දේපළ හෝ ව්‍යවසාය කළමනාකරණය කිරීම හෝ කළමනාකරණය කිරීම සඳහා කටයුතු සැලැස්වීම සහ එකී දේපළ හෝ ව්‍යවසායන් විකිණීම හෝ අන් අයුරකින් බැහැර කිරීම;

(ඔ) බැංකුවේ අරමුදල් තාවකාලිකව විදේශීය සුරැකුම්පත්වල ආයෝජනය කිරීම;

(ඕ) අනුමත ණය දෙන ආයතන සමග ණයවලට, ස්ථාවර පොලියක් රහිත ස්කන්ධ-වලට සහ කොටස්වලට ප්‍රාරක්ෂණ වැඩ පිළිවෙලවල් වලට සහ ඇපවලට සහභාගිවීම;

(ක) කාර්මික, කෘෂිකාර්මික සහ වාණිජ ව්‍යවසායවල පැවරිය හැකි හෝ නොහැකි නැතහොත් ගනුදෙනු කළහැකි හෝ නොහැකි, විනිමය පත්‍ර, පොරොන්දු නෝට්ටු, කූපන්, අණකර, ණයකර, සහතික, කොටස් සහතික පත්‍ර සහ වෙනත් සාධන පත්‍ර හා සුරැකුම්පත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන කොන්දේසිවලට යටත්ව, භාරගැනීම, වට්ටම් කිරීම, නැවත වට්ටම් කිරීම, මිල දී ගැනීම, විකිණීම සහ ගනුදෙනු කිරීම;

(ග) බැංකුවේ අරමුණු සාක්ෂාත් කරගැනීම පිණිස අත්හද බැලීමේ ව්‍යාපෘති ඇතුළුව සංවර්ධන යෝජනාක්‍රම ආරම්භ කිරීම;

(ච) කාර්මික, කෘෂිකාර්මික සහ වාණිජ කටයුතු සඳහා අවශ්‍ය ගුදම්, ගබඩා හා ගොඩනැගිලි තැනීමෙහිලා නිරතවීම;

(ජ) ගුදම්, ගබඩා හා ගොඩනැගිලි, යන්ත්‍රෝපකරණ, උපකරණ සහ වෙනත් බඩු බද්දට දීම, කුලියට දීම, විකිණීම හෝ කුලියට සින්නවීමේ පදනම මත විකිණීම;

(ට) යම් කාර්මික, කෘෂිකාර්මික හෝ වාණිජ ව්‍යවසායක් විසින් විවෘත වෙළෙඳ පොළෙන් ලබාගන්නා ණයවලට ඇපවීම;

(ඩ) යම් කාර්මික කෘෂිකාර්මික සහ වාණිජ ව්‍යවසායනින් අය විය යුතු කල් නැබූ ගෙවීම් වලට ඇපවීම;

(ණ) කාර්මික, කෘෂිකාර්මික සහ වාණිජ ව්‍යවසායන්ට බැංකුව විසින් දෙන ලද ණය සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් සහ එවැනි ව්‍යවසායක් විසින් නිකුත් කරන ලද බැඳුම්කර හෝ ණයකර වෙනුවෙන් බැංකුව විසින් දෙන ලද දායක මුදල් සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් කොටස් ප්‍රාග්ධනය බවට පරිවර්තනය කිරීම;

(ත) අනුමත ණය දෙන ආයතනයන්හි ස්කන්ධ, කොටස්, බැඳුම්කර, හෝ ණයකර නිකුත් කිරීම් වලට දායකවීම හෝ ඒවා මිල දී ගැනීම හෝ ඒවා ප්‍රාරක්ෂණය කිරීම;

(ද) බැංකුව විසින් ඉටු කරනු ලැබිය හැක් කටයුතු සඳහා ප්‍රතිශ්‍රවයක් වශයෙන්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි, කොමිස් මුදල්, නැරැවි ගාස්තු, පොලී, පාරිශ්‍රමික හෝ ගාස්තු ලබා ගැනීම;

(න) ශ්‍රී ලංකා මහ බැංකුවේ හෝ යම් වාණිජ බැංකුවක හෝ ශ්‍රී ලංකාවෙන් පිටත යම් බැංකුවක නැතහොත් මූල්‍ය ආයතනයක තැන්පත් ගිණුම් විවෘත කිරීම;

(ප) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන්නා වූ යම් කාලසීමා සඳහා සහ එසේ නිශ්චය කරනු ලබන මුදල් ප්‍රමාණ සඳහා කාල නියමයක් ඇති තැන්පතු කවර වූ හෝ තැනැත්තකුගෙන් භාර ගැනීම;

(බ) ණයවර ලිපි සහ චක්‍රලේඛ සටහන් ප්‍රදානය කිරීම සහ නිකුත් කිරීම;

(ම) රන් රිදී ගුළි සහ රන් රිදී කාසි මිලට ගැනීම, විකිණීම සහ ගනුදෙනු කිරීම සහ විනිමය පිළිබඳ කටයුතුවල නිරත වීම; සහ

(ය) සාමාන්‍යයෙන්, මේ පනත යටතේ හෝ වෙනත් යම් නීතියක් යටතේ හෝ බැංකුව විසින් ක්‍රියාත්මක කළ යුතු බලතලවලට, කළ යුතු කාර්යවලට හෝ ඉටු කළ යුතු කර්තව්‍යවලට සම්බන්ධ වන්නා වූ හෝ ඒවා කර ගැනීමට ආධාර වන්නා වූ සියලු ක්‍රියා හෝ දේ කෙලින්ම හෝ අන් අයුරකින් කිරීම.

**7.** මෙහි පහත දක්වෙන බලතල සියල්ලම හෝ ඉන් යමක් හෝ බැංකුව විසින් ක්‍රියාත්මක කළහැකිය:—

(අ) බැංකුවේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු, සාමාන්‍යාධිකාරි වරයකු පත් කිරීම;

(ආ) බැංකුවේ වැඩ කරගෙන යාම සඳහා අවශ්‍ය වියහැකි නිලධරයන් සහ සේවකයන් පත් කිරීම;

(ඇ) බැංකුවේ සේවයෙහි යොදවා ගෙන සිටින තැනැත්තන් සඳහා අර්ථසාධක අරමුදලක් පිහිටුවීම සහ සුභසාධක හා විනෝද ක්‍රීඩා පහසුකම්, නිවාස, නේවාසිකාගාර හා ඒ සමාන වෙනත් ඉඩකඩ සැපයීම;

(ඈ) බැංකුවේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා හා කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය සියලු ගිවිසුම්වලට ශ්‍රී ලංකාවේ දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත දී හෝ ඇතුල්වීම සහ ඒවා ඉටු කිරීම;

(ඉ) බැංකුවේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, උසස් කිරීම, ඔවුන්ගේ පාරිශ්‍රමික, ඔවුන්ගේ විනය පාලනය, පැවැත්ම සහ ඔවුන්ට නිවාඩු දීම ඇතුළුව, නිලධරයන්ට සහ සේවකයන්ට අදාළ රීති සෑදීම;

(ඊ) බැංකුවේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් රීති සෑදීම; සහ

(උ) බැංකුවේ කටයුතු නිසි ලෙස කරගෙන යාම පහසු කිරීම සඳහා අවශ්‍ය යයි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අදහස් කරනු ලබන වෙනත් සියලු දේ කිරීම.

8. (1) බැංකුවට පහත සඳහන් අයගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් සිටිය යුතුය:—

(අ) මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ තත් කාලයෙහි ලේකම් ධුරය දරන ("නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ" යනුවෙන් මේ පනතෙහි සඳහන් කරනු ලබන) තැනැත්තා;

(ආ) අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, මුදල් මණ්ඩලය විසින් පත්කරනු ලබන ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරයෙක්;

(ඇ) අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරනු ලබන ඒ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක්;

(ඈ) අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරනු ලබන ඒ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක්;

(ඉ) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන තැනැත්තන් දෙදෙනෙක්;

(ඊ) ආණ්ඩුව, ශ්‍රී ලංකා මහ බැංකුව, ලංකා බැංකුව, මහජන බැංකුව සහ සහභාගී වන්නන් වෙතොත් ඔවුන් ද හැර, කොටස් හිමියන් විසින්, බැංකුවේ කොටස් ප්‍රාග්ධනයට ඔවුන්ගේ දායක මුදල බැංකුවේ ගෙවා නිමි මුළු ප්‍රාග්ධනයෙන් සියයට දහයට අඩු නොවේ නම්, තෝරා පත්කරනු ලබන (මේ පනතෙහි "තෝරා පත්කළ අධ්‍යක්ෂ" යනුවෙන් සඳහන් කරනු ලබන) තවත් එක් සාමාජිකයෙක්

එසේ වුව ද, කොටස් ප්‍රාග්ධනයට ඔවුන්ගේ දායක මුදල බැංකුවේ මුළු ගෙවා නිමි ප්‍රාග්ධනයෙන් සියයට දහයට අඩු නම්, කොටස් හිමියන්ගේ සම්බන්ධතා නියෝජනය කිරීමට හෝ අවශ්‍ය යයි අමාත්‍යවරයා සලකන වෙනත් සම්බන්ධතා නියෝජනය කිරීමට අධ්‍යක්ෂ-වරයෙකු අමාත්‍යවරයා විසින් නම් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ආ) සිට (ඈ) දක්වා ඇති (ඒ ඡේද දෙකම ඇතුළුව) ඡේද යටතේ අධ්‍යක්ෂවරයන් ලෙස පත්කරනු ලබන තැනැත්තන් "පත්කළ අධ්‍යක්ෂවරු" යනුවෙන් ද, (1) වන උපවගන්තියේ (ඉ) ඡේදය යටතේ සහ (ඊ) ඡේදයේ අතුරු ඡේදය යටතේ අධ්‍යක්ෂවරු ලෙස නම් කරනු ලබන තැනැත්තන් "නම්කළ අධ්‍යක්ෂවරු" යනුවෙන් ද මේ පනතෙහි හඳුන්වනු ලැබේ.

(3) නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂවරයා පැමිණ නොමැති නම්, භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ධුරය තත් කාලයෙහි දරන තැනැත්තා ඒ සාමාජිකයාගේ විකල්ප සාමාජිකයා වශයෙන්, අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම්වල දී ක්‍රියා කළයුතු අතර එහි දී ඡන්දය පාවිච්චි කිරීමේ අයිතිවාසිකම ද ඔහුට තිබිය යුතු ය.

(4) රෝගාතුරවීමේ හෝ වෙනත් අබලතාවයක හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීමේ හේතුවෙන්, පත්කළ අධ්‍යක්ෂවරයෙකුට හෝ නම් කළ අධ්‍යක්ෂවරයෙකුට තම ධුරයේ කාර්යයන් තාවකාලිකව ඉටුකළ නොහැකි වන අවස්ථාවක, ඔහුගේ විකල්ප අධ්‍යක්ෂවරයා වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් වල දී ක්‍රියා කිරීමට සුදුසු තැනැත්තකු පත්කිරීම හෝ නම් කිරීම, පත්කළ අධ්‍යක්ෂවරයන් සම්බන්ධයෙන් වන විට, පත්කිරීමේ බලධරයා විසින් ද, නම්කළ අධ්‍යක්ෂවරයන් සම්බන්ධයෙන් වන විට, අමාත්‍යවරයා විසින් ද කළහැකි අතර ඒ තැනැත්තාට එකී රැස්වීම් වල දී ඡන්දය පාවිච්චි කිරීමේ අයිතිවාසිකම ද හිමි විය යුතු ය.

(5) නම්කළ අධ්‍යක්‍ෂවරයකු, අමාත්‍යවරයා විසින් කිසිම හේතුවක් නොදක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය. එවැනි ඉවත් කිරීමක් ගැන කිසිම අධිකරණයක දී ප්‍රශ්න නොකළ යුතු ය.

(6) නම්කළ අධ්‍යක්‍ෂවරයකුට අමාත්‍යවරයා අමතා යවන ලිපියක් මගින් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(7) නම්කළ අධ්‍යක්‍ෂවරයකුගේ ධුර කාලය (6) වන සහ (7) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, අවුරුදු හතරක් විය යුතු ය.

**9.** (1) බැංකුවේ කටයුතු සහ ව්‍යාපාර පිළිබඳ සාමාන්‍ය අධීක්ෂණය, මෙහෙයවීම සහ පාලනය අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙත පැවරී තිබිය යුතු ය.

(2) මේ පනත යටතේ හෝ වෙනත් යම් නීතියක් යටතේ බැංකුවේ බලතල, කර්තව්‍ය සහ කාර්ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හා කිරීම ද මේ පනත යටතේ හෝ වෙනත් යම් නීතියක් යටතේ බැංකුව විසින් කළ හැකි සියලු ක්‍රියා සහ දේ කිරීම ද අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් කළ හැකි ය.

(3) අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී ද, කර්තව්‍ය ඉටු කිරීමේ දී ද, කාර්ය කිරීමේ දී ද, මේ පනතේ විධිවිධානවලට යටත්ව, මනා ව්‍යාපාරික ප්‍රතිපත්ති වලට අනුකූලව ක්‍රියා කළ යුතු ය; තව ද කර්මාන්තයේ, කෘෂිකර්මාන්තයේ සහ වාණිජයේ යහපත කෙරෙහි ද පොදුවේ මහජන යහපත කෙරෙහි ද නිසි සැලකිල්ල දැක්විය යුතු ය.

**10.** අධ්‍යක්‍ෂවරුන් සියලු දෙනාටම හෝ ඉන් යම් අධ්‍යක්‍ෂවරයකුට අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමිකයක් බැංකුවේ අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

**11.** බැංකුව ඇතුළත් වීමට අදහස් කරන ගිවිසුමකට හෝ දීමට අදහස් කරන ණයකට කෙළින්ම හෝ අන් අයුරකින් යම් සම්බන්ධතාවක් ඇති අධ්‍යක්‍ෂවරයකු වේ නම්, ඒ අධ්‍යක්ෂ - වරයා විසින් තමාගේ එකී සම්බන්ධතාවේ ස්වභාවය අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමක දී හෙළිදරව් කළ යුතු ය. එසේ හෙළිදරව් කරන කරුණු ඒ රැස්වීමේ වාර්තාවට ඇතුළත් කළ යුතු අතර එකී ගිවිසුම හෝ ණය පිළිබඳව අධ්‍යක්‍ෂ මණ්ඩලයේ සාකච්ඡාවක් හෝ තීරණයක් වේ නම්, ඒ සාකච්ඡාවට හෝ තීරණයට එකී අධ්‍යක්‍ෂවරයා සහභාගි නොවිය යුතු ය.

**12.** (1) සෑම මාසයකටම යටත් පිරිසෙයින් එක් වරක්වත් අධ්‍යක්‍ෂ මණ්ඩලයේ රැස්වීම පැවැත්විය යුතු ය. තව ද ඊට අතිරේකව, මේ පනත යටතේ ස්වකීය වගකීම් ඉටු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වන පරිදි රැස්වීම් පැවැත්විය යුතු ය.

(2) අධ්‍යක්‍ෂ මණ්ඩලයේ යම් රැස්වීමක ගණපූරණය අධ්‍යක්‍ෂ වරුන් හතර දෙනෙකුගෙන් සමන්විත විය යුතු ය.

(3) මේ පනතේ වෙනත් විධිවිධාන වලට යටත්ව, අධ්‍යක්‍ෂ මණ්ඩලයේ රැස්වීම්වල කටයුතු කිරීමේ දී පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සාදනු ලබන රීති මගින් තීරණය කෙරෙන කාර්ය පටිපාටියක් විය යුතු ය.

**13.** (1) අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් ස්වකීය බලතල සහ කාර්ය අතුරින් යමක් බැංකුවේ සාමාන්‍යාධිකාරිවරයාට හෝ වෙනත් යම් සේවා නියුක්තයකුට හෝ පවරා දිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත්කරන ලද සෑම නියෝජිතයකු විසින්ම තමන් වෙත පැවරුණු බලය ක්‍රියාත්මක කිරීම හෝ කාර්ය කිරීම අධ්‍යක්‍ෂ මණ්ඩලයේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව කළ යුතු ය.

**14.** අධ්‍යක්‍ෂවරයෙකුගේ ධුරයක පුරප්පාඩුවක් හෝ අධ්‍යක්‍ෂවරයකු නම් කිරීමේ දී වූ යම දෝෂයක් හේතුකොටගෙන පමණක්, අධ්‍යක්‍ෂ මණ්ඩලයේ කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු වෙතැයි සලකනු නොලැබිය යුතු ය.

**15**. (1) අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් අතුරින් සභාපතිවරයකු පත්කළ යුතු ය.

(2) (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, සභාපති වරයාගේ ධුර කාලය, පත් කිරීමේ දිනයෙන් ආරම්භ වන වර්ෂ හතරක කාලසීමාවක් විය යුතු ය.

(3) සභාපතිවරයාගේ ධුර කාලය ඉකුත්වීමට පෙර ඔහුගේ ධුරය හිස් වුවහොත්, එසේ ධුරය හිස් කරන සභාපතිවරයාගේ ධුර කාලසීමාවේ ඉකුත් නොවූ කාලය තුළ ඔහු වෙනුවෙන් ධුරය දැරීමට වෙනත් තැනැත්තකු පත් කළ යුතු ය.

(4) කාලය ඉකුත්වීම නිසා සභාපති ධුරය හිස් කරන යම් තැනැත්තකු නැවත පත්කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් කිසිම හේතුවක් නොදක්වා සභාපතිවරයා ධුරයෙන් ඉවත් කළ හැකි ය. ඒ ඉවත් කිරීම ගැන කිසිම අධිකරණයකදී ප්‍රශ්න නොකළ යුතු ය.

(6) අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති විටක, පැමිණ ඇති සාමාජිකයන් අතුරින් බහුතර සංඛ්‍යාවක් විසින් තෝරා ගනු ලබන සාමාජිකයකු ඒ රැස්වීමේ මුලසුන දැරිය යුතු ය.

(7) මණ්ඩලයේ යම් රැස්වීමක මුලසුන දරන සභාපතිවරයාට හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකුට තමාගේ ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

**16**. (1) බැංකුවේ මුද්‍රාව සාමාන්‍යාධිකාරිවරයාගේ භාරයේ තිබිය යුතු ය.

(2) බැංකුවේ මුද්‍රාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ආකාරයට වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) බැංකුවේ මුද්‍රාව සාමාන්‍යාධිකාරිවරයා හෝ වැඩ බලන සාමාන්‍යාධිකාරිවරයා සහ අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් සිටි බවට ලකුණක් වශයෙන් ඒ සියලු දෙනාම ඒ සාධන පත්‍රයට අත්සන් තැබිය යුතු ය.

**17**. (1) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ශ්‍රී ලංකාව ඇතුළත සහ ඉන් පිටත බැංකුවේ නියෝජිතයන් පත්කළ හැකි ය.

(2) බැංකුව විසින් වෙනත් ආයතන වෙනුවෙන් ශ්‍රී ලංකාව ඇතුළත සහ ඉන් පිටත නියෝජිතයන් වශයෙන් කටයුතු කළ හැකි ය.

**18**. (1) අධ්‍යක්ෂ මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී හා කාර්ය කිරීමේ දී සහාය දීමේ සහ උපදෙස් දීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි මණ්ඩලය විසින් සලකනු ලබන යම් තැනැත්තන් සංඛ්‍යාවකින් සමන්විත විශේෂ කමිටු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරනු ලැබිය හැකි ය.

(2) යම් විශේෂ කමිටුවක සාමාජිකයන් වශයෙන් පත්වීම් ලැබීමට සුදුසු තැනැත්තන් වන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්, බැංකුවේ සේවකයන් හා එකී පත්වීම් ලැබීමට සුදුසුකම් ඇතැයි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සලකනු ලබන වෙනත් තැනැත්තන් ය. එවැනි යම් සාමාජිකයකුගේ ධුර කාලය මණ්ඩලය විසින් තීරණය කරනු ලබන කාලයක් විය යුතු ය.

**19**. යම් විශේෂ කමිටුවක සාමාජිකයකු වන බැංකුවේ සේවා නියුක්තයකු හැර, එවැනි විශේෂ කමිටුවක සාමාජිකයන්ට, ඒ කමිටුවේ රැස්වීම් වලට සහභාගිවීම වෙනුවෙන් හා ඔවුන්ගේ කර්තව්‍යයන් ඉටු කිරීම වෙනුවෙන්, තත් කාර්යය සඳහා සෑදීමට මේ පනතින් බලය දෙනු ලැබූ රීති මගින් තීරණය කරනු ලබන පාරිශ්‍රමික බැංකුවේ අරමුදල් වලින් ගෙවිය හැකිය.

**20**. 22 (1) වන වගන්තියේ සඳහන් මූලික දයක මුදල ගෙවනු ලබන තුරු බැංකුව විසින් ව්‍යාපාර කටයුතු ආරම්භ නොකළ යුතු ය:

එසේ වුව ද, ඊට කලින් දිනයක සිට බැංකුවේ ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීම සඳහා ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් බලය දීම වළක්වන්නක් සේ මේ වගන්තියේ කිසිවක් සලකනු ලැබීම හෝ තේරුම් ගැනීම හෝ නොකළ යුතු ය.

## II වන කොටස

### මුදල්

**21.** බැංකුවේ බලය ලත් ප්‍රාග්ධනය, රුපියල් සියයේ කොටස් දෙකෝටියකට බෙදුණු රුපියල් දෙසිය කෝටියක් විය යුතු ය.

**22.** (1) මෙහි මින් මතු විධිවිධාන සලස්වනු ලබන පරිදි වූ ප්‍රමාණවලින් සහ එසේ විධිවිධාන සලස්වනු ලබන ආකාරයෙන්, පහත සඳහන් ආයතන විසින් බැංකුවේ ප්‍රාග්ධනය සඳහා රුපියල් හැට කෝටියක මූලික දයක මුදලක් නියමිත දිනයෙන් පසු අවුරුද්දක් ඇතුළත ගෙවිය යුතු අතර එසේ දයක මුදල් ගෙවීමේ හේතුවෙන් ඒ ආයතන බැංකුවේ කොටස් හිමියන් ලෙස සලකනු ලැබිය යුතු ය:—

(අ) ශ්‍රී ලංකාවේ ආණ්ඩුව—මුදලින් රුපියල් හතලිස් කෝටියක්;

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුව—මුදලින් රුපියල් දෙකෝටි පනස් ලක්ෂයක් සහ ඉල්ලූවිට ගෙවිය යුතු පොරොන්දු නෝට්ටුවකින් රුපියල් හත්කෝටි පනස් ලක්ෂයක්;

(ඇ) ලංකා බැංකුව—මුදලින් රුපියල් එක්කෝටි විසිපන්ලක්ෂයක් සහ ඉල්ලූවිට ගෙවිය යුතු පොරොන්දු නෝට්ටුවකින් රුපියල් තුන්කෝටි හැත්තෑපන්ලක්ෂයක්;

(ඈ) මහජන බැංකුව—මුදලින් රුපියල් එක්කෝටි විසිපන්ලක්ෂයක් සහ ඉල්ලූවිට ගෙවිය යුතු පොරොන්දු නෝට්ටුවකින් රුපියල් තුන්කෝටි හැත්තෑපන්ලක්ෂයක්.

(2) බැංකුවේ ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමෙන් පසුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන කාලයක දී හෝ කාලවල දී ද එසේ තීරණය කරනු ලබන ප්‍රමාණයකින් හෝ ප්‍රමාණ වලින් ද එසේ තීරණය කරනු ලබන ආකාරයෙන් ද, බැංකුව විසින් 21 වන වගන්තියේ සඳහන් කොටස් මහජනයා විසින් මිල දී ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු අතර ඒ කොටස් වෙන්කර දීම ද කළ යුතු ය.

(3) යම් කොටස් හිමියකුගෙන් හෝ සියලු කොටස් හිමියන්ගෙන් තවදුරටත් දයක මුදල් කලින් කල ඉල්ලා සිටීම ද, භාර ගැනීම ද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කළ හැකි ය.

(4) මේ වගන්තියේ හෝ 57 වන වගන්තියේ හෝ විධිවිධාන අනුව හැර, බැංකුවේ ප්‍රාග්ධනය සඳහා යම් දයක මුදලක් ගෙවීම හෝ පිළිගැනීම හෝ නොකළ යුතු ය.

**23.** යම් කොටස් හිමියකුගේ වගකීම, ඔහුගේ කොටස් වෙනුවෙන් නොගෙවන ලද යම් මුදල් ප්‍රමාණයක් වේනොත්, ඒ මුදල් ප්‍රමාණයට සීමා විය යුතු ය.

**24.** බැංකුවේ අරමුණු ක්‍රියාත්මක කරගැනීම සඳහා ද එහි බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය කිරීම සඳහා ද අවශ්‍ය වන මුදල්, මේ පනතේ මේ කොටසේ, මින් පසු ඇති විධිවිධාන යටතේ සහ ඒ විධිවිධානවලට අනුකූලව, බැංකුව විසින් ශ්‍රී ලංකාව තුළින් හෝ ඉන් පිටතින්, ණය වශයෙන් හෝ වෙනත් ආකාරයකින් ලබාගත හැකි ය.

**25.** ආණ්ඩුව විසින් නිශ්චය කරනු ලබන නියමයන්ට සහ කොන්දේසිවලට යටත්ව, බැංකුව විසින් කලින් කල ආණ්ඩුවෙන් ණය ලබාගතහැකි අතර ආණ්ඩුව විසින් ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලෙන් යම් මුදල් ප්‍රමාණයක්, ඒ නියමයන්ට සහ කොන්දේසිවලට යටත්ව, කලින්කල බැංකුවට ණයට දිය හැකි ය.

**26.** (1) මුදල් මණ්ඩලය විසින් ණය පිළිබඳ පොලිය සහ ණය ආපසු ගෙවීම සම්බන්ධ-යෙන් නිශ්චය කරනු ලබන නියමයන්ට සහ කොන්දේසිවලට යටත්ව, බැංකුව විසින් කලින් කල ශ්‍රී ලංකා මහ බැංකුවෙන් යම් මුදල් ප්‍රමාණ මාස හයක් නොඉක්මවන කාලසීමා සඳහා, තාවකාලික ලෙස ණයට ලබාගත හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ බැංකුව විසින් ණයට ලබා ගන්නා මුදල් ප්‍රමාණය බැංකුවේ ගෙවා නිමි ප්‍රාග්ධනයෙන් සහ නිදහස් සංචිතයෙන් සියයට දහයකට සමාන මුදලක් කිසිම අවස්ථාවක නොඉක්මවිය යුතු ය.

**27.** බැංකුව විසින්, මුදල් මණ්ඩලයේ අනුමතය ඇතිව, කලින්කල යම් විදේශීය ආණ්ඩුවකින් හෝ ශ්‍රී ලංකාවෙන් පිටත කවර වූ හෝ වෙනත් යම් ප්‍රභවයකින් යම් මුදල් ප්‍රමාණයක්, එම මුදල පිළිබඳ පොලිය සහ එය ආපසු ගෙවීම සම්බන්ධයෙන් බැංකුව සහ අවස්ථාවෝචිත පරිදි එකී ආණ්ඩුව හෝ එකී වෙනත් ප්‍රභවය අතර වූ එකඟත්වයෙන් නිශ්චය කරනු ලබන නියමයන් සහ කොන්දේසි මත, ණයට ගත හැකි ය.

**28.** (1) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ණයකර සහ ස්කන්ධ ඇති කොට, නිකුත් කළ හැකි අතර එසේ ඇතිකොට නිකුත් කරනු ලබන ණයකර සහ ස්කන්ධ පිළිවෙලින් "ජාතික සංවර්ධන බැංකු ණය කර" සහ "ජාතික සංවර්ධන බැංකු ස්කන්ධ" යනුවෙන් මේ පනතෙහි හඳුන්වනු ලැබිය යුතු ය.

(2) ජාතික සංවර්ධන බැංකු ණයකර සහ ජාතික සංවර්ධන බැංකු ස්කන්ධ නිකුත් කිරීම, පැවරීම, ඒ පිළිබඳව කටයුතු කිරීම, ඒවා නිදහස් කිරීම, සහ අවලංගු කිරීම, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් නියමයන්ට හා කොන්දේසිවලට අනුකූලව කළ යුතු ය.

**29.** (1) (අ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඇති කොට, නිකුත් කරන ලද ජාතික සංවර්ධන බැංකු ණයකරවල සහ ජාතික සංවර්ධන බැංකු ස්කන්ධවල; සහ

(ආ) යම් විදේශීය ආණ්ඩුවකින් හෝ වෙනත් යම් ප්‍රභවයකින් මේ පනතේ මේ කොටස යටතේ බැංකුව විසින් ලබාගන්නා යම් ණයක

මුල් මුදල ආපසු ගෙවීම සහ ඒ මුල් මුදල වෙනුවෙන් පොලිය ගෙවීම ගැන ආණ්ඩුව විසින් ඇප විය හැකි ය.

(2) (1) වන උප වගන්තිය යටතේ වූ යම් ඇපවීමකින් නිදහස්වීම සඳහා අවශ්‍ය වූ යම් මුදලක් ඒකාබද්ධ අරමුදලට වැය බර කළ යුතු ය.

**30.** (1) ආණ්ඩුව විසින් අනුමත කරන ලද යම් අන්තර්-ජාතික හෝ කලාපීය ණය ආයතනයකින් හෝ වෙනත් යම් අන්තර්-ජාතික හෝ විදේශීය සංවිධානයකින් බැංකුව විසින් ලබාගන්නා ලද යම් ණයක් වෙනුවෙන්, ආණ්ඩුව විසින් නිශ්චය කරනු ලබන නියමයන් හ කොන්දේසි මත ඇපවීමට ආණ්ඩුවට මෙයින් බලය පවරනු ලැබේ. මේ උපවගන්තිය යටතේ බලය ලැබී ඇත්තේ යම් ණයක් වෙනුවෙන් ඇපවීමට ද ඒ ණය පිළිබඳ වටිනාකම විදේශීය ව්‍යවහාර මුදලින් සඳහන් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ යම් ඇපවීමක් යටතේ ආණ්ඩුව විසින් ගෙවිය යුතු සියලු මුදල් ඒකාබද්ධ අරමුදලට මෙයින් වැයබර කරනු ලැබේ.

(3) ආණ්ඩුව විසින් අනුමත කරන ලද යම් අන්තර්-ජාතික හෝ කලාපීය ණය ආයතනයකින් හෝ වෙනත් යම් අන්තර්-ජාතික හෝ විදේශීය සංවිධානයකින් බැංකුවට දෙන ලද යම් ණයක මුල් මුදල සහ ඒ ණය වෙනුවෙන් වූ පොලිය සහ වෙනත් ගාස්තු සම්බන්ධ-යෙන්, (1) වන උපවගන්තිය යටතේ වූ යම් ඇපවීමක් යටතේ බැංකුව විසින් ගෙවිය යුතු සියලු මුදල්, යම් ලිඛිත හෝ වෙනත් නීතියක පටහැනිව කුමක් සඳහන් ව ඇත ද,—

(අ) යම් ලිඛිත හෝ වෙනත් නීතියක් මගින් හෝ නීතියක් යටතේ දැනට නියම කර ඇති හෝ මතුවට නියම කරනු ලබන හෝ යම් බද්දක්, තීරු ගාස්තුවක් හෝ ගාස්තුවක් වෙනුවෙන් කිසිම අඩුකිරීමක් නොකර සහ එවැනි යම් බද්දකින්, තීරු ගාස්තුවකින් හෝ ගාස්තුවකින් තොරව; සහ

(ආ) යම් ලිඛිත හෝ වෙනත් නීතියක් මගින් හෝ නීතියක් යටතේ දැනට පනවා ඇති හෝ මතුවට පනවනු ලබන සියලු සීමාකිරීම් වලින් තොරව

ගෙවනු ලැබිය යුතු ය.

එසේ වුව ද, ශ්‍රී ලංකාවේ නේවාසික යම් පුද්ගලයකුට හෝ සංස්ථාවකට යම් බැඳුම්කරයක් හෝ පොරොන්දු නෝට්ටුවක් අර්ථදායී ලෙස අයිති වී ඇති අවස්ථාවක, ආණ්ඩුව විසින් අනුමත කරන ලද යම් අන්තර්-ජාතික හෝ කලාපීය ණය ආයතනයක් හෝ වෙනත් යම් අන්තර්-ජාතික හෝ විදේශීය සංවිධානයක් හැර, ඒ බැඳුම්කරය හෝ පොරොන්දු නෝට්ටුව දරන තැනැත්තකුට, ඒ බැඳුම්කරය හෝ පොරොන්දු නෝට්ටුව යටතේ කරනු ලබන ගෙවීමක් සම්බන්ධයෙන් යම් බදුවලට, තීරුගාස්තු වලට, ගාස්තුවලට හෝ පිළිබඳ මේ උපවගන්තියේ මීට ඉහතින් වූ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ කාර්ය සඳහා, යම් පුද්ගලයකු හෝ සංස්ථාවක් ශ්‍රී ලංකාවේ නේවාසික ද නැතහොත් නිර්වාසික ද යන ප්‍රශ්නය 1963 අංක 4 දරන දේශීය ආදායම් පනතේ 54 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව නිශ්චය කරනු ලැබිය යුතු ය.

(5) ආණ්ඩුව සහ මේ පනත අනුව ආණ්ඩුව විසින් අනුමත කරන ලද යම් අන්තර්-ජාතික හෝ කලාපීය ණය ආයතනයක් හෝ වෙනත් යම් අන්තර්-ජාතික හෝ විදේශීය සංවිධානයක් අතර ඇති කරගත් සෑම ඇපවීමේ ගිවිසුමක්ම සහ එවැනි යම් ඇපවීමේ ගිවිසුමක් අනුව ආණ්ඩුව බැඳුණු සෑම ඇපවීමක්ම, යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, වලංගුවන අතර ඒවා පිළිබඳ ඒ ඒ නියමයන්ට අනුකූලව බලාත්මක කළ හැකි විය යුතු ය.

(6) ආණ්ඩුව විසින් අනුමත කරන ලද යම් අන්තර්-ජාතික හෝ කලාපීය ණය ආයතනයක් හෝ වෙනත් යම් අන්තර්-ජාතික හෝ විදේශීය සංවිධානයක් විසින් බැංකුවට දෙනු ලැබූ සහ ආණ්ඩුව විසින් ඇප වූ යම් ණයක් සම්බන්ධයෙන් වූ විට, ඒ ණය ප්‍රකාශ කර ඇත්තේ හෝ සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් ගෙවිය යුතු වන්නේ යම් ව්‍යවහාර මුදලකින් නැතහොත් ව්‍යවහාර මුදල්වලින් ද, ඒ ව්‍යවහාර මුදලට හෝ මුදල්වලට අදාළ වන සේ ශ්‍රී ලංකා රුපියල නැවත අගය කිරීමකින් සිදුවන යම් පාඩුවක් ආණ්ඩුව විසින් දැරිය යුතු අතර ඉන් ඇතිවන යම් ලාභයක් ආණ්ඩුවට හිමිවිය යුතු ය.

එකී සෑම පාඩුවකම මුදල ඒකාබද්ධ අරමුදලට මෙයින් වැයබර කරනු ලැබේ.

(7) වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇත ද, ආණ්ඩුව විසින් අනුමත කරන ලද යම් අන්තර්-ජාතික හෝ කලාපීය ණය ආයතනයකින් හෝ වෙනත් යම් අන්තර්-ජාතික හෝ විදේශීය සංවිධානයකින් බැංකුව විසින් ලබාගන්නා යම් ණයක් සම්බන්ධයෙන් බැංකුව විසින් ලියා අත්සන් කරන ලද කිසිම ගිවිසුමක්, බැඳුම්කරයක් හෝ වෙනත් ලේඛනයක් කවර හෝ ආකාරයක මුද්දර ගාස්තුවකට හෝ ගාස්තුවලට යටත් නොවිය යුතු අතර ඒ වෙනුවෙන් කවර හෝ ආකාරයක මුද්දර ගාස්තුවක් හෝ ගාස්තු අය නොකළ යුතු ය.

**31.** (1) මේ පනතෙහි "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන, "පාලිත ප්‍රභව අරමුදල" යනුවෙන් හැඳින්වෙන අරමුදලක් බැංකුව විසින් පිහිටුවිය යුතු ය. ඒ අරමුදල බැංකුවේ පොදු අරමුදල්වල කොටසක් නොවිය යුතු අතර එය ආණ්ඩුව සඳහා සහ ආණ්ඩුව වෙනුවෙන් හෝ ආණ්ඩුව විසින් අනුමත කරන ලද යම් විදේශීය ආණ්ඩුවක්, විදේශීය හෝ අන්තර්-ජාතික සංවිධානයක් හෝ තැනැත්තකු හෝ තැනැත්තන් සඳහා හෝ වෙනුවෙන් බැංකුවේ පොදු අරමුදලින් බාහිරව, බැංකුව විසින් පාලනය කළ යුතු විශේෂ අරමුදලක් විය යුතු ය.

(2) කාර්මික, කෘෂිකාර්මික, වාණිජ හෝ වෙනත් ව්‍යවසායන්ට මේ පනතේ විධිවිධාන යටතේ සහ ඒ විධිවිධානවලට අනුකූලව මේ අරමුදලින් ණය, අත්තිකාරම් හෝ වෙනත් ණය පහසුකම් හෝ ආධාර දීම හෝ සැලසීම මේ අරමුදලේ අරමුණු විය යුතු ය.

(3) දයකයා සහ බැංකුව අතර එළඹුණු යම් ගිවිසුමක් අනුව යම් කාර්මික, කෘෂිකාර්මික, වාණිජ හෝ වෙනත් ව්‍යවසායකට අරමුදලින් යම් ණයක්, අත්තිකාරමක්, ආධාරයක් හෝ වෙනත් ණය පහසුකමක් දීමට හෝ සැලසීමට බැංකුවට මෙයින් බලය දෙනු ලැබේ.

(4) අරමුදලේ කාර්ය සඳහා ආණ්ඩුව විසින් යම් විදේශීය ආණ්ඩුවක් විසින් සහ ශ්‍රී ලංකාව ඇතුළත හෝ ශ්‍රී ලංකාවෙන් පිටත වෙනත් යම් ප්‍රභවයක් විසින් ප්‍රදාන වශයෙන් සහ ආධාර වශයෙන් දෙනු ලබන සියලු මුදල් බැංකුව විසින් අරමුදලට බැර කළ යුතු ය. ඊට අතිරේකව, අරමුදල ක්‍රියාත්මක කිරීමෙන් ලැබෙන ශුද්ධ ආදයම හෝ පොලිය ද අරමුදලට බැර කළ යුතු ය.

(5) අරමුදලේ අරමුණු ක්‍රියාත්මක කිරීමේ අදහසින් බැංකුව විසින් කරන ලද යම් ක්‍රියාවකින් හෝ දෙයකින් ඇතිවන හෝ එවැනි යම් ක්‍රියාවක් හෝ දෙයක් සම්බන්ධයෙන් දරන ලද සියලු මූල්‍ය වගකීම් හෝ බැඳීම් අරමුදලට වැය බර කළ යුතු ය.

(6) අරමුදලේ අතිරික්තව ඇත්තාවූ ද අරමුදලේ අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා වහාම ප්‍රයෝජනයට යෙදවිය නොහැක්කාවූ ද මුදල්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අරමුදලෙහි දීර්ඝකාලීන අභිවෘද්ධියට හානියක් නොමැතිව, යෝග්‍ය යයි අධ්‍යක්ෂ මණ්ඩලය සලකන සුරැකුම්පත්වල තාවකාලිකව ආයෝජනය කළ හැකි ය.

(7) මෙහි පහත දක්වෙන කරුණු සියල්ලම හෝ ඉන් යමක් සඳහා හෝ මේ පනත යටතේ රීති සෑදිය හැකි ය:—

(අ) අරමුදලේ ගිණුම් තබා ගත යුතු ආකාරය;

(ආ) බොල් ණය සහ සැකසහිත ණය සඳහා සහ වත්කම්වල අගය ක්ෂය වීම සඳහා සහසාමාන්‍ය බැංකු ව්‍යවහාරවලට අනුකූල වෙනත් අවිනිශ්චිත අවස්ථා සඳහා අරමුදලෙහි සංචිත පිහිටුවීම;

(ඇ) අරමුදල අවසාන කිරීම හෝ වසා දැමීම; සහ

(ඈ) ඉහත කී යම් කරුණකට සම්බන්ධ හෝ ආනුෂංගික වෙනත් යම් කරුණු.

(8) වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව තිබුණ ද, අරමුදලේ ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් ආදායම් බදු ගෙවීමෙන් බැංකුව නිදහස් විය යුතු ය.

**32.** (1) බැංකුව වෙත හෝ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත—

(අ) බැංකුවේ ප්‍රාග්ධනය සඳහා දයක මුදල් වශයෙන්;

(ආ) බැංකුවේ අරමුණු ක්‍රියාත්මක කිරීමේදී;

(ඇ) බැංකුවේ හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ බලතල ක්‍රියාත්මක කිරීමේ දී හෝ කාර්ය කිරීමේ දී; සහ

(ඈ) බැංකුවේ ව්‍යාපාර කටයුතු කරගෙන යාමේ දී සහ පාලනය පවත්වාගෙන යාමේ දී ලැබෙන සියලු මුදල් බැංකුවේ අරමුදල්වලට බැර කළ යුතු ය.

(2) (අ) බැංකුවේ පරමාර්ථ හා අරමුණු ක්‍රියාත්මක කිරීම;

(ආ) බැංකුවේ හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය කිරීම; සහ

(ඇ) බැංකුවේ ව්‍යාපාර කටයුතු කරගෙන යාම සහ පාලනය පවත්වාගෙන යාම

හේතුකොට ගෙන ඇති වන හෝ ඒ සම්බන්ධයෙන් දරන ලද බැංකුවේ හෝ අධ්‍යක්‍ෂ මණ්ඩලයේ සියලු මූල්‍ය වගකීම් සහ බැඳීම් බැංකුවේ අරමුදල්වලට වැයබර කළ යුතු ය.

**33.** බැංකුවේ ලාභ—

(අ) පොදු සංචිතයක් පිහිටුවීමේ සහ පවත්වාගෙන යාමේ;

(ආ) බොල් හෝ සැක සහිත ණය සඳහා විශේෂ සංචිතයක් පිහිටුවීමේ සහ පවත්වාගෙන යාමේ;

(ඇ) නිශ්චිත කාර්ය සඳහා අවශ්‍ය වන වෙනත් යම් සංචිත අරමුදල් පිහිටුවීමේ සහ පවත්වාගෙන යාමේ; සහ

(ඈ) ලාභාංශ ගෙවීමේ

කාර්ය සඳහා යෙදවිය යුතු ය.

**34.** බැංකුවේ ව්‍යාපාර කටයුතු ආරම්භ කරනු ලබන දිනයෙන් පසුව අවුරුදු දහයක කාලයක් ගතවනතුරු එහි ලාභ සහ ආදායම වෙනුවෙන් ආදායම් බදු ගෙවීමෙන් බැංකුව නිදහස් විය යුතු ය.

**35.** (1) (අ) බැංකුව විසින් යම් ණයක්, අත්තිකාරමක් හෝ වෙනත් ණය පහසුකමක් දෙනු ලැබූ, හෝ

(ආ) බැංකුව විසින් යම් ණයක්, අත්තිකාරමක් හෝ වෙනත් ණය පහසුකමක් දෙනු ලැබූ තැනැත්තකුගේ බූදලය සම්බන්ධයෙන් වූ අන්තිම කැමති පත්‍රය පිළිබඳ ප්‍රොබෙට් බලපත්‍රයක් හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රයක් ලැබූ හෝ ඒ බූදලය නියෝජනය කිරීම පිණිස පත්කරන ලෙස අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් ඉල්ලුම් කරනු ලැබූ විට අධිකරණය විසින් ඒ සඳහා පත්කරනු ලැබූ, හෝ

(ඇ) යම් ණයක්, අත්තිකාරමක් හෝ වෙනත් ණය පහසුකමක් සඳහා ඇපයක් වශයෙන් බැංකුවට උකස් කරනු ලැබූ යම් නිශ්චල දේපලක යම් අයිතිවාසිකමක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් ස්වේච්ඡාවෙන් හිමිකර දීමෙන් හෝ නීතිය ක්‍රියාත්මක වීමෙන් හෝ පැවරී ඇති,

සෑම තැනැත්තකුම වෙත එවනු ලබන සියලුම දැන්වීම් යොමු කරනු ලැබිය හැකි ලිපිනයක් ඔහු විසින් බැංකුවේ ලියාපදිංචි කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය අදාළ වන යම් තැනැත්තකු වෙත භාරදීමට නියමිත යම් දැන්වීමක්, ඒ උපවගන්තිය යටතේ ඒ තැනැත්තා විසින් ලියාපදිංචි කරනු ලැබූ ලිපිනයට ලියාපදිංචි කළ ලිපියකින් තැපෑලෙන් ඔහු වෙත යවනු ලැබුවහොත් එය ඒ තැනැත්තා වෙත විධිමත් ලෙස භාර දෙනු ලැබූ ලෙස සැලකිය යුතු අතර සාමාන්‍ය තැපෑලෙන් ලියුම භාරදෙනු ලැබිය හැකි වේලාවේ දී භාරදීම කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය:

එසේ වුව ද, එවැනි යම් තැනැත්තකු (1) වන උපවගන්තිය යටතේ තම ලිපිනය ලියාපදිංචි කිරීම පැහැර හරින අවස්ථාවක, බැංකුව විසින් ඔහු වෙත අමතා දැන්වීමක් ගැසට් පත්‍රයේ හා යටත්පිරිසෙයින් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් දිනපතා පළ කෙරෙන පුවත්පත් තුනක පළ කළ යුතු අතර, ඒ දැන්වීම අන්තිමට පළකරනු ලැබූ දවසේ ඔහු වෙත ඒ දැන්වීම විධිමත් ලෙස කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

**36.** බැංකුව විසින් —

(අ) යම් චංචල හෝ නිශ්චල දේපළක උකසක්;

(ආ) ජාතික සංවර්ධන බැංකු ණයකර සහ ජාතික සංවර්ධන බැංකු ස්කන්ධ හැර යම් ස්කන්ධ, ඇපකර, ණයකර, කොටස්, උකස් පැවරුම් හෝ වෙනත් සුරැකුම්පත්;

(ඇ) යම් ගුදම් ලදුපත්, නෞභාර පත්, හෝ ඇප පිළිබඳ කාර්යය සඳහා අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් කලින්කල අනුමත කරනු ලබන වෙනත් සාධන පත්‍ර;

(ඈ) යම් බඩු, ගුදම් බඩු හෝ වෙළෙඳ බඩු; හෝ

(ඉ) යම් ව්‍යවසායක් හෝ පුද්ගලයකු විසින් දෙනු ලැබ, අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් පිළිගනු ලැබූ යම් ඇපවීමක්

ඇපය වශයෙන් තබාගෙන, යම් ණයක්, අත්තිකාරමක් හෝ වෙනත් ණය පහසුකමක් දෙනු ලැබිය හැකි ය.

**37.** යම් නිශ්චල දේපළක උකසක් පිට බැංකුව විසින් දෙනු ලැබූ යම් ණයක්, අත්තිකාරමක් හෝ වෙනත් ණය පහසුකමක් ආපසු ගෙවීමේ දී වාරිකයක් වශයෙන් ගෙවිය යුතු හෝ ඒ ණය, අත්තිකාරම හෝ ණය පහසුකම වෙනුවෙන් වූ පොලිය වශයෙන් ගෙවිය යුතු යම් මුදලක් ගෙවීමෙහිලා පැහැර හැරීමක් කරනු ලැබූ අවස්ථාවක, බැංකුවට ආපසු ගෙවනු නොලැබූ ඒ ණයේ, අත්තිකාරමේ හෝ ණය පහසුකමේ කොටස හා ඒ වෙනුවෙන් ගෙවිය යුතු පොලිය සම්බන්ධයෙන් පැහැර හැරීමක් කරන ලද සේ සැලකිය යුතු ය.

**38.** **(1)** යම් ණයක ආපසු ගෙවනු නොලැබූ කොටස හා ඒ වෙනුවෙන් ගෙවිය යුතු පොලිය ගෙවීම මේ පනතේ විධිවිධාන යටතේ පැහැර හරිනු ලැබූ හෝ පැහැර හරිනු ලැබූ ලෙස සැලකෙන අවස්ථාවල අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් තම අභිමතය පරිදි 39 වන වගන්තියේ හෝ 41 වන වගන්තියේ හෝ දක්වා ඇති පරිදි ක්‍රියා කළ හැකි ය:

එසේ වුව ද, අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 39 වන වගන්තිය අනුව ක්‍රියා කර ඇති හෝ ක්‍රියා කිරීමට ආරම්භ කිරීමෙන් පසුව, 41 වන වගන්තිය යටතේ යෝජනාවක් සම්මත කර ගැනීමෙන් ඒ අවස්ථාව සම්බන්ධයෙන් ක්‍රියා කිරීම අවශ්‍ය යයි හෝ නුවණට හුරු යයි අධ්‍යක්‍ෂ මණ්ඩලය සලකන්නේ නම්, මණ්ඩලය විසින් එසේ කිරීම කිසිම විටක කිසිවකින් නොවැළැක්වෙන බව සැලකිය යුතු ය.

(2) මේ වගන්තියේ සහ 39 වන වගන්තියේ සිට 53 වන වගන්තිය තෙක් වූ වගන්තිවල කාර්ය සඳහා "ණය" යන පදයෙන් බැංකුව විසින් දෙන ලද ණයක්, අත්තිකාරමක් හෝ වෙනත් ණය පහසුකමක් අදහස් වේ.

**39.** පැහැර හැරීම කරනු ලැබුවේ යම් ණයක් සම්බන්ධයෙන් ද ඒ ණය සඳහා ඇපය වශයෙන් බැංකුවට උකස් කරනු ලැබූ යම් නිශ්චල දේපළකට ඇතුළු වී, ඒ දේපළෙහි සන්තකය භාර ගැනීමට ද එය කළමනාකරණය කිරීමට හා නඩත්තු කිරීමට ද උකස්කරු විසින් පැහැර හැරීම කරනු නොලැබුවේ නම් ඔහු විසින් ඒ දේපළ පාලනය කිරීමේ ලා හා කළමනාකරණය කිරීමේ ලා ක්‍රියාත්මක කළ හැකිව තිබූ බලතල, ඒ දේපළ පාලනය කිරීමේ ලා හා කළමනාකරණය කිරීමේ ලා ක්‍රියාත්මක කිරීමට ද 42 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව, ලියවිල්ලකින් වාර්තාගත කරනු ලැබිය යුතු යෝජනා සම්මතයක සඳහන් කරනු ලබන යම් තැනැත්තකුට අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් ඒ යෝජනා සම්මතය මඟින් බලය පැවරිය හැකි ය.

**40.** (1) අධ්‍යක්‍ෂ මණ්ඩලයේ යෝජනා සම්මතයක් මගින් යම් දේපළක් සම්බන්ධයෙන් 39 වන වගන්තිය යටතේ බලය පවරනු ලබන යම් තැනැත්තකුට ඒ යෝජනා සම්මතය අනුව සාමාන්‍යයෙන් ක්‍රියා කිරීමට සහ විශේෂයෙන්ම—

(අ) ඒ දේපළෙහි පලදාව විකිණීමට;

(ආ) ඒ දේපළෙන් කුලී, ලාභ හෝ වෙනත් ආදායම් ලැබීමට;

(ඇ) ඒ දේපළ පාලනය කිරීමේ ලා හා කළමනාකරණය කිරීමේ ලා දැරීමට සිදුවන වියදම් ඒ දේපළින් ලැබෙන ආදායමින් ගෙවීමට;

(ඈ) ඔහුගේ සේවාවන් සඳහා පාරිශ්‍රමික වශයෙන් සුදුසු යයි මණ්ඩලය විසින් නියම කරනු ලබන යම් මුදලක් වේතොත්, ඒ මුදල ආදායමෙන් තමා වෙත නතු කර ගැනීමට; සහ

(ඉ) ඒ දේපළ පිළිබඳ උකස යටතේ බැංකුවට අය විය යුතු සියලුම මුදල් සම්පූර්ණයෙන්ම ගෙවා නිමවන තුරු හෝ (2) වන උපවගන්තිය යටතේ ඒ දේපළෙහි සන්තකය භාර දෙන ලෙස අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් ඔහුට විධාන කරනතුරු හෝ ඒ දේපළෙහි සන්තකය දැරීමට ද

හිමිකම් තිබිය යුතු ය.

(2) අධ්‍යක්‍ෂ මණ්ඩලයේ යෝජනා සම්මතයක් මගින් යම් දේපළක් සම්බන්ධයෙන් 39 වන වගන්තිය යටතේ බලය පවරනු ලැබූ සෑම තැනැත්තකුම විසින්—

(අ) උකස්කරුගේ නඩත්තුව සඳහා මණ්ඩලය විසින් ස්වකීය අභිමතය පරිදි යම් මුදලක් නියම කරනු ලැබුවහොත්, ඒ මුදල ඒ දේපළෙහි ආදායමෙන් උකස්කරුට මාස්පතා ගෙවිය යුතු ය;

(ආ) මෙහි මින් පෙර බලය පවරනු ලැබූ ගෙවීම් කිරීමෙන් පසු ඒ දේපළේ ආදායමෙන් ඉතිරිවන මුදල යම් තැනැත්තකුට හෝ තැනැත්තන්ට ගෙවිය යුතු ලෙස මණ්ඩලය විසින් විධාන කරනු ලබන්නේ ද, ඒ තැනැත්තාට හෝ තැනැත්තන්ට මණ්ඩලය විසින් විධාන කරනු ලබන ආකාරයකින් තෙමසකට වරක් හෝ මණ්ඩලය විසින් විධාන කරනු ලබන වෙන යම් ක්‍රමයකට හෝ ඒ මුදල ගෙවිය යුතු ය;

(ඇ) ඒ දේපළ සම්බන්ධයෙන් තමාට ලැබුණු හා තමා විසින් ගෙවන ලද සියලුම මුදල් පිළිබඳව පැහැදිලිවූත් නිවැරදිවූත් වාර්තා තබා ගත යුතු අතර මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් අන්තර් කාලවල දී මණ්ඩලය වෙත ඒ වාර්තා ඉදිරිපත් කළ යුතු ය;

(ඈ) ඒ දේපළෙහි සන්තකය උකස්කරුට හෝ වෙන යම් තැනැත්තකුට ඒ සන්තකය භාර දෙන ලෙස මණ්ඩලය විසින් විධාන කරනු ලබන්නේ ද, ඒ තැනැත්තාට හෝ භාර දිය යුතු අතර මෙහි මින් පෙර බලය පවරනු ලැබූ ගෙවීම් කිරීමෙන් පසු ඒ දේපළෙහි ආදායමෙන් යම් මුදලක් තමා වෙත ඉතිරිව ඇත්නම් ඒ මුදල මණ්ඩලයට ගෙවිය යුතු ය.

(3) උකස යටතේ බැංකුවට අයවිය යුතු සියලුම මුදල් සම්පූර්ණයෙන්ම ගෙවා නිම වූ විට, මණ්ඩලය විසින් උකස් දේපළෙහි සන්තකය උකස්කරුට ආපසු දිය යුතු අතර ඒ දේපළේ ආදායමෙන් යම් මුදලක් ඉතිරිව ඇත්නම් ඒ මුදල ද ඔහුට දිය යුතු ය.

**41.** පැහැර හැරීම කරනු ලැබුවේ යම් ණයක් සම්බන්ධයෙන් ද ඒ ණය සඳහා ඇපය වශයෙන් බැංකුවට උකස් කරනු ලැබූ යම් නිශ්චල දේපලක්, ඒ ණයෙන් නොගෙවා ඇති කොටස හා විකිණීමේ දිනය දක්වා ඒ වෙනුවෙන් අය විය යුතු පොලිය, 48 වන වගන්තිය යටතේ අයකර ගතහැකි මුදල් හා වියදම් ද සමග, අය කර ගැනීම සඳහා ප්‍රසිද්ධ වෙන්දේසියේ

විකිණීමට, ලියවිල්ලකින් වාර්තාගත කළ යුතු යෝජනා සම්මතයක සඳහන් යම් තැනැත්තකුට අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින්, 42 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව, ඒ යෝජනා සම්මතය මගින් බලය පැවරිය හැකි ය.

**42.** (1) ණය ගැණුම්කරු මිය ගොස් ඇති විටක වුව ද නැතහොත් ණය සඳහා ඇපය වශයෙන් උකස් කරන ලද දේපළ පිළිබඳ කවර ආකාරයේ වූ හෝ යම් අයිතිවාසිකමක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් ස්වේච්ඡාවෙන් හිමිකර දීමෙන් හෝ නීතිය ක්‍රියාත්මක වීමෙන් වෙනත් යම් තැනැත්තකු වෙත පැවරී ඇති විටක වුව ද, (2) වන උපවගන්තියෙහි අන්‍යාකාර විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, 39 වන සහ 41 වන වගන්තිවල විධිවිධාන යම් පැහැර හැරීමක් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(2) ණය ගැනුම්කරු මිය ගොස් ඇත්තාවූ ද ඔහුගේ අන්තිම කැමති පත්‍රය පිළිබඳ ප්‍රොබේට් බලපත්‍රය හෝ ඔහුගේ බූදලය පිළිබඳ අද්මිනිස්ත්‍රාසි බලපත්‍ර නිකුත් කර නොමැති වූද අවස්ථාවක, කොළඹ දිසා අධිකරණය විසින් හෝ ඒ දේපළ පිහිටි ස්ථානය පිළිබඳ අධිකරණ බලය ඇති දිසා අධිකරණය විසින් හෝ මේ වගන්තියේ කාර්ය සඳහා, ණය ගැණුම්කරුගේ බූදලය නියෝජනය කිරීමට තැනැත්තකු පත්කරන ලෙස අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් ඉල්ලීමක් කළවිට හා ඒ ඉල්ලීම පිළිබඳ දැන්වීමක් භාරදෙනු ලැබිය යුතු බවට අධිකරණය විසින් නියම කරනු ලබන තැනැත්තන් ඇතොත් ඔවුන්ට ඒ දැන්වීම භාරදීමෙන් පසු හා ප්‍රොබේට් බලපත්‍රය ප්‍රදානය කිරීම හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍ර නිකුත් කිරීම නොනිසි ලෙස ප්‍රමාද වීමට ඉඩ තිබෙන බවට අධිකරණය සෑහීමට පත් වුවහොත් එසේ මේ වගන්තියේ කාර්ය සඳහා, ණය ගැණුම් කරුගේ බූදලය නියෝජනය කිරීමට තැනැත්තකු පත්කළ හැකි ය; තව ද, ඒ ණය ගැනුම් කරුගේ බූදලය නියෝජනය කිරීම සඳහා මේ වගන්තිය යටතේ තැනැත්තකු පත්කළ හොත් මිස හා පත්කරනු ලබනතුරු 39 වන සහ 41 වන වගන්තිවල විධිවිධාන ඒ ණය ගැනුම්කරු විසින් කරන ලද යම් පැහැර හැරීමක් සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

**43.** යම් දේපළක් විකිණීමට බලය පවරන්නා වූ 41 වන වගන්තිය යටතේ වූ සෑම යෝජනා සම්මතයක්ම පිළිබඳ දැන්වීමක් ගැසට් පත්‍රයෙහි ද, යටත්පිරිසෙයින් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් දිනපතා පළකෙරෙන පුවත් පත් තුනක ද පළකළ යුතු අතර ඒ දැන්වීමෙහි පිටපත් ණය ගැණුම්කරු ජීවත්ව සිටින්නේ නම්, ඔහු වෙත ද, 35 වන වගන්තිය යටතේ ඒ දේපළ සම්බන්ධයෙන් තම ලිපිනය ලියාපදිංචි කර සිටින සෑම තැනැත්තකු වෙත ද යැවිය යුතු ය.

**44.** සෑම විකිණීමක්ම පිළිබඳ දිනය ද, වේලාව සහ ස්ථානය ද ඒ විකිණීම සඳහා නියම කරනු ලැබූ දින සිට දින දහහතරකට නොඅඩු කාලයකට පෙර ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු ය. තව ද, ඒ දැන්වීමෙහි පිටපත්—

(අ) ණය ගැනුම්කරු ජීවත්ව සිටින්නේ නම්, ඔහු වෙත ද, යම් යෝජනා සම්මතයක් පිළිබඳව දැන්වීමක් 43 වන වගන්තිය යටතේ දිය යුතු ලෙස නියමිත සෑම තැනැත්තකුම වෙත ද භාර දිය යුතු ය;

(ආ) විකිණීමට ඇති දේපළ මත හෝ ඒ අසල ඇලවිය යුතු ය; තවද

(ඇ) දේපළ පිහිටා ඇත්තේ යම් කච්චේරියක සහ යම් දිසා අධිකරණවල සහ මහෙස්ත්‍රාත් අධිකරණවල බලසීමාව තුළ ද ඒ කච්චේරියේ, දිසා අධිකරණවල හා මහෙස්ත්‍රාත් අධිකරණවල බිත්ති මත ඇලවිය යුතු ය.

**45.** (1) ණයේ ආපසු ගෙවනු නොලැබූ කොටස සහ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 48 වන වගන්තිය යටතේ අය කර ගත හැකි යම් මුදල් සහ ගාස්තු කිසිවක් වේනොත්, ඒ මුදල්වල සහ ගාස්තුවල ප්‍රමාණය ද (උකස පිළිබඳ නියම අනුව ඒ කොටස වෙනුවෙන් අය විය යුතු සියලු පොලී ද සමග) එකී දේපළ විකිණීමට නියමිත දිනට පෙර යම් වේලාවක අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබුව හොත්, දේපළ නොවිකිණිය යුතු අතර 41 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මතය අනුව ඒ දේපළ විකිණීම සඳහා කිසිම වැඩිදුර පියවරක් ද නොගත යුතුය.

(2) ගෙවීම පැහැර හරිනු ලැබූ වාරිකයෙහි හෝ වෙනත් ගෙවීමෙහි ප්‍රමාණය සහ උකස පිළිබඳ නියම අනුව ඒ වෙනුවෙන් අය විය යුතු පොලියක් වේනොත් එය ද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 48 වන වගන්තිය යටතේ අය කර ගත හැකි මුදල් සහ ගාස්තු කිසිවක් වේනොත් ඒ මුදල් වල සහ ගාස්තුවල ප්‍රමාණය ද දේපළ විකිණීමට නියමිත දිනට පෙර යම් වේලාවක අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබුවහොත්, ඒ දේපළ නොවිකිණිය යුතු බවට සහ 41 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මතය අනුව ඒ දේපළ විකිණීම සඳහා කිසිම වැඩිදුර පියවරක් නොගත යුතු බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තම අභිමතය අනුව විධාන කළ හැකි ය.

46. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ආරම්භක ලංසුවක් නියම කළ හැකි අතර බැංකුවට හැර, වෙනත් යම් තැනැත්තකුට ඒ දේපළ ඒ ආරම්භක ලංසුවට අඩු ලංසුවකට නොවිකිණිය යුතු ය.

47. එකම දේපළක් ඇපය වශයෙන් තබාගෙන බැංකුව විසින් ණය දෙකක් හෝ ඊට වැඩි ගණනක් දෙනු ලැබ ඇත්තා වූ හා ඒ ණයවලින් එකක් හෝ ඊට වැඩි ගණනක් වෙනුවෙන් අයවිය යුතු යම් මුදලක් ගෙවීම පැහැර හැර ඇත්තා වූ යම් අවස්ථාවක, අනික් ණය සම්බන්ධ යෙන් හෝ අනික් ණයවලින් කිසිවක් සම්බන්ධයෙන් පැහැර හැරීමක් කර නොතිබුණ ද, මේ පනතෙහි පෙරාතුව වූ විධිවිධාන අදාළ විය යුතු ය. තව ද එවැනි යම් අවස්ථාවක දී, අවස්ථා-වෝචිත පරිදි, ණය දෙක ම හෝ ණය සියල්ල ම සම්බන්ධයෙන් බැංකුවට අය විය යුතු සම්පූර්ණ මුදල අය කර ගැනීම පිණිස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 41 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මතයක් මගින් ඒ දේපළ විකිණීමට බලය පැවරිය හැකි අතර මේ පනතේ විධිවිධාන ඒ අනුව අදළ විය යුතු ය.

48. යම් ණයක් වෙනුවෙන් අයවිය යුතු මුදල් ප්‍රමාණයට අතිරේකව පහත දැක්වෙන මුදල් ද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ණය ගැනුම්කරුගෙන් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන යම් තැනැත්තකු ගෙන් අය කර ගත හැකි ය—

(අ) බැංකුවට උකස් කරන ලද දේපළ විෂයයෙහි ලබා ගත් යම් රක්ෂණ ඔප්පුවක් සම්බන්ධයෙන් වූ වාරික හා වෙනත් අයකිරීම් ද ණය ලබාගත් තැනැත්තා විසින් ලියා අත්සන් කරන ලද උකස්කරයෙහි ඇතුළත් ප්‍රතිඥප්ති යටතේ, බැංකුව විසින් දරනු ලැබීමට බලය පැවරී ඇති වෙනත් සියලු ගාස්තු හා අය කිරීම ද ගෙවීමෙහි ලා ඒ උකස් කරයෙහි ඇතුළත් ප්‍රතිඥප්තිවලට අනුකූලව බැංකු විසින් වියදම් කරන ලද සියලු මුදල්; සහ

(ආ) විකිණීම ප්‍රචාරය කිරීමේ සහ උකස් දේපළ විකිණීමේ ගාස්තු:

එසේ වුව ද මේ ඡේදය යටතේ දරනු ලබන ගාස්තු මණ්ඩලය විසින් කලින් කල යෝජනා සම්මතයකින් නියම කරනු ලබන ණයෙහි ප්‍රතිශතයක් නොඉක්මවිය යුතු ය.

49. උකස් දේපළ විකුණනු ලැබුවහොත්, උකස වෙනුවෙන් අය විය යුතු මුදල සහ 48 වන වගන්තිය යටතේ අය කර ගත හැකි මුදල් හා ගාස්තු විකිණීමෙන් ලැබුණු මුදලෙන් අඩු කර ගැනීමෙන් පසු, යම් මුදලක් ඉතිරි වුවහොත් ඒ ඉතිරි මුදල, ණය ගැණුම්කරුට ලැබිය යුතු ගෙවීම් භාර ගැනීමට නීත්‍යානුකූලව හිමිකම් ඇති යම් තැනැත්තකුට හෝ කවරකුට ඒ මුදල ගෙවිය යුතු දැයි යන්න ගැන අධ්‍යක්ෂ මණ්ඩලයට සැකයක් ඇති විට, උකස් දේපළ පිහිටි ස්ථානය විෂයයෙහි අධිකරණ බලය ඇති දිසා අධිකරණයට හෝ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගෙවිය යුතු ය.

50. (1) උකස් දේපළ විකුණනු ලැබුවහොත්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චිත වශයෙන් දෙනු ලැබූ බලයක් පිට සාමාන්‍යාධිකාරීවරයා විසින් විකුණුම් සහතිකයක් නිකුත් කළ යුතු ය; එවිට ණය ගැනුම්කරුට ඒ දේපළට හෝ ඒ දේපළ පිළිබඳව ඇති සියලු අයිතිවාසිකම්, හිමිකම් හා සම්බන්ධතාවන් ගැනුම්කරුට අත්විය යුතු ය; ඉන් පසු ඒ දේපළ බැංකුවට උකස් කළ දිනයෙන් පසුව, ණය ගැනුම්කරුට ඒ දේපළට හා ඒ දේපළ පිළිබඳව ඇති අයිතිවාසිකම්, හිමිකම් හෝ සම්බන්ධතාවන් පිළිබඳව කරන ලද හෝ ලියාපදිංචි කරන ලද කවර ආකාරයේ වූ හෝ යම් බැහැර කිරීමක් මගින් හෝ ඒ යටතේ හෝ හිමිකම් පාන යම් තැනැත්තකු විසින්

කවර හෝ හේතුවක් නිසා, ඒ විකිණීම අවලංගු කරන ලෙස යම් අධිකරණයකදී ඉල්ලා සිටීමට හෝ ගැනුම්කරුට ප්‍රතිපක්ෂව ඒ දේපළට හෝ ඒ දේපළ පිළිබඳව ඇති යම් අයිතිවාසිකමක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් තමාට ඇති බව තහවුරු කිරීමට හෝ නොහැකි විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාමාන්‍යාධිකාරිවරයා විසින් අත්සන් කරන ලද සහතිකයක්, යම් දේපළක් විකිණීම සම්බන්ධයෙන් මේ පනතේ සියලු විධිවිධාන අනුව ක්‍රියා කර ඇති බවට ඒ දේපළ විකිණීම සම්බන්ධයෙන් තීරණාත්මක සාක්ෂියක් විය යුතු ය.

(3) ගැනුම්කරු බැංකුව නොවන වෙනත් තැනැත්තකු නම්, විකුණුම් සහතිකය මේ පනතේ උපලේඛනයෙහි ඇති 'අ' ආකෘතියට සාරානුකූල විය යුතු ය; ගැනුම්කරු බැංකුව නම්, ඒ සහතිකය මේ පනතේ උපලේඛනයෙහි ඇති 'ආ' ආකෘතියට සාරානුකූල විය යුතු ය.

(4) සෑම විකුණුම් සහතිකයක් ම, එය නිශ්චල දේපළ පිළිබඳ හිමිකරයක් වූවාක් මෙන්, නියමිත මුද්දර ගාස්තුවට හා අයකිරීම්වලට සහ අයකිරීමට නීතියෙන් බලය පැවරී ඇති ලියාපදිංචි කිරීමේ ගාස්තුවලට සහ වෙනත් අයකිරීම්වලට යටත් විය යුතු ය; ඒ සියලුම ගාස්තු හා අයකිරීම් ගැනුම්කරු විසින් ගෙවිය යුතු ය.

**51.** (1) මේ පනතේ මීට පෙරාතුව වූ විධිවිධානවලට අනුකූලව විකුණන ලද යම් නිශ්චල දේපලක ගැනුම්කරු විසින් කොළඹ දිසා අධිකරණය වෙත හෝ ඒ දේපළ පිහිටි ස්ථානය විෂයයෙහි අධිකරණ බලය දරන දිසා අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට හා ඒ දේපළ සම්බන්ධයෙන් 50 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද විකුණුම් සහතිකය ඉදිරිපත් කරනු ලැබූ විට, ඒ දේපළේ සන්තකය භාර දීම සඳහා වූ ආඥාවකට ඔහු හිමිකම් ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ සෑම ඉල්ලීමක් ම, ඉදිරිපත් කිරීම ද ඒ පිළිබඳ සුදුසු කටයුතු කිරීම ද සිවිල් නඩු විධාන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූලව ලඝු කාර්ය පටිපාටිය අනුව කළ යුතු ය; තවද ඒ එක් එක් ඉල්ලීමේ කාර්ය සඳහා ඉදිරිපත් කරනු ලබන සියලු ලේඛන වෙනුවෙන් ද ඒ සම්බන්ධයෙන් පවත්වනු ලබන සියලු න ඩු කටයුතු වෙනුවෙන් ද, ඒ ඉල්ලීම අදාළ වන දේපළෙහි වටිනාකම ම ඇති නිශ්චල දේපලක සන්තකය භාර දීම සඳහා දිසා අධිකරණයක තීන්දු ප්‍රකාශයක් ක්‍රියාවෙහි යොදවන ලෙස කරනු ලබන ඉල්ලීම් වෙනුවෙන් හා ඒවා ක්‍රියාවෙහි යෙදවීම හා සම්බන්ධ හෝ එයට ආනුෂංගික නඩු කටයුතු වෙනුවෙන් තත්කාලයෙහි වලංගුව පවතින යම් ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු ඒ ඒ ගාස්තු ප්‍රමාණයන් අනුව මුද්දර ගාස්තුද වෙනත් අයකිරීම් ද ගෙවිය යුතු ය.

(3) ණයකරු හෝ ඔහු වෙනුවෙන් යම් තැනැත්තකු හෝ බැංකුවට දේපළ උකස් කරනු ලැබීමෙන් පසුව ණයකරු විසින් ඇති කරන ලද හිමිකමක් යටතේ හිමිකම් පාන යම් තැනැත්තකු හෝ මේ පනතේ මීට පෙරාතුව වූ විධිවිධානවලට අනුකූලව විකුණන ලද යම් නිශ්චල දේපළක පදිංචිව සිටින අවස්ථාවක ගැනුම්කරුට හෝ ඔහු වෙනුවෙන් සන්තකය භාර ගැනීමට ඔහු විසින් පත් කරනු ලබන යම් තැනැත්තකුට හෝ දේපළෙහි සන්තකය දීමෙන් භාර දීම කරන ලෙස දිසා අධිකරණය විසින් ආඥාවක් කළ යුතු ය.

(4) කුලී නිවැසියෙකු හෝ එහි පදිංචි වීමට හිමිකම් ඇති වෙනත් තැනැත්තකු හෝ මේ පනතේ මීට පෙරාතුව වූ විධිවිධානවලට අනුකූලව විකුණන ලද යම් නිශ්චල දේපලක පදිංචිව සිටින අවස්ථාවක, විකිණීම කර ඇති බවට සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් වූ දන්වීමක් දේපළෙහි ප්‍රකටව පෙනෙන ස්ථානයක ඇලවීමෙන්ද ණයකරුගේ සම්බන්ධතාව ගැනුම්කරුට පවරා තිබෙන බව යම් පහසු ස්ථානයක අණබෙර ගැස්වීමෙන් හෝ ව්‍යවහාරයෙහි පවතින වෙනත් යම් ක්‍රමයකින් හෝ පදිංචිකරුට ප්‍රකාශ කිරීමෙන් ද භාරදීම කරන ලෙස දිසා අධිකරණය විසින් ආඥා කළ යුතු ය. එසේ ප්‍රකාශ කිරීමේ ගාස්තු අධිකරණය විසින් නියම කළ යුතු අතර සෑම අවස්ථාවක දී ම ගැනුම්කරු විසින් ඒ ගාස්තු කලින් ගෙවිය යුතු ය.

(5) (3) වන උපවගන්තිය හෝ (4) වන උපවගන්තිය හෝ යටතේ වූ සෑම ආඥාවක් ම, අවස්ථාවෝචිත පරිදි, සිවිල් නඩු විධාන සංග්‍රහයේ 287 වන වගන්තිය යටතේ හෝ 288 වන වගන්තිය යටතේ හෝ කරන ලද සන්තකය භාරදීම සඳහා වූ ආඥාවක් ලෙස සැලකිය යුතු

අතර, ඒ නඩු විධාන සංග්‍රහයෙහි යම් විධිවිධානයක් අදාළ කිරීමේ කාර්යය සඳහා, ණයකරු සහ ගැනුම්කරු පිළිවෙළින් විනිශ්චිත ණයකරු සහ විනිශ්චිත ගැනුම්කරු වශයෙන් සලකමින්, ඒ ආඥාව එසේ 287 වන හෝ 288 වන වගන්තිය යටතේ කරන ලද ආඥාවක් ක්‍රියාත්මක කරන ආකාරයෙන් ම බලාත්මක කළ හැකි ය.

**52.** විකුණන ලද දේපළ බැංකුව වෙනුවෙන් මිලයට ගෙන ඇති අවස්ථාවක, ඒ දේපළ විකුණන ලද්දේ යම් ණයක් වෙනුවෙන් ද ඒ ණය සම්බන්ධයෙන් (තහනමට ගැනීමේ හා විකිණීමේ වියදම් ද ඇතුළුව) ගෙවිය යුතු මුදල් සහ නියමිත ප්‍රමාණය නොඉක්මවිය යුතු ප්‍රමාණයන් අනුව මුළු මුදල වෙනුවෙන් වූ පොලිය ණයකරු විසින් හෝ ඔහු වෙනුවෙන් වෙනත් යම් තැනැත්තකු විසින් ගෙවනු ලැබූ කල්හි, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒ දේපළ නැවත විකුණනු ලැබීමට පෙර යම් වේලාවක දී විකුණුම් සහතිකයෙහි සහතික පිටපතක විකිණීම අවලංගු කරන බවට පිටසනක් සාමාන්‍යාධිකාරී වරයා විසින් කරන ලද විට, විකිණීම අවලංගු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සැලැස්විය හැකි ය. ඒ පිටසන ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කරනු ලැබූ විට මේ පනත යටතේ වූ විකිණීම සිදු නොවූවාක් සේ ඉන් එකී දේපළ ණයකරු වෙත නැවත සතු විය යුතු ය.

**53.** එසේ විකුණන ලද දේපල බැංකුව වෙනුවෙන් මිලට ගෙන තිබේ නම් හා ඒ විකිණීම 52 වන වගන්තිය යටතේ අවලංගු කරනු නොලැබුවහොත්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කවර හෝ වේලාවක දී, ඒ දේපළ නැවත විකුණා, මුල් විකිණීමේ දී ගැනුම්කරුට අත් විය හැකිව තිබූ සියලු අයිතිවාසිකම්, හිමිකම් හා සම්බන්ධතාවන්, 50 වන වගන්තියේ (3) වන උපවගන්තියේ සඳහන් සහතිකයේ සහතික පිටපතක සාමාන්‍යාධිකාරිවරයා විසින් පිටසනක් කිරීමෙන් ඒ ගැනුම්කරුට පවරා දිය හැකිය. එකී පිටසන මුල් විකිණීමේ දී ගැනුම්කරුට නිකුත් කරනු ලබන සහතිකයක් වෙනුවෙන් ගෙවිය යුතු මුද්දර ගාස්තුවට ම සහ අය කිරීම් වලට ම යටත් විය යුතු අතර ඒ පිටසන ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කරනු ලැබූ විට ඉහත කී අයිතිවාසිකම්, හිමිකම් හා සම්බන්ධතාවන් ඉන් ගැනුම් කරුට අත්විය යුතු ය.

## III වන කොටස

### විගණනය හා ගිණුම්

**54.** බැංකුවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

**55.** (1) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන දෙළොස් මාසයක් වූ කාලයක් නොඉක්මවන කාලාන්තරවල දී විගණකාධිපතිවරයා විසින් බැංකුවේ ගිණුම් විගණනය කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කවර විධිවිධානයක් තිබුණ ද, බැංකුවේ ගිණුම් විගණනය කිරීම සඳහා අමාත්‍යවරයා විසින්, විගණකාධිපතිවරයා විමසා, සුදුසුකම් ලත් විගණකවරයකු හෝ විගණකවරයන් පත් කළ හැක්කේ ය. එවැනි පත් කිරීමක් අමාත්‍යවරයා විසින් කරනු ලැබූ විට, ඒ බැංකුව සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ කාර්ය හා කර්තව්‍ය කිරීම හා ඉටු කිරීම සඳහා විගණකවරයාගේ හෝ විගණකවරයන්ගේ සේවය ප්‍රයෝජනයට ගැනීමට තමා අදහස් කරන බව විගණකාධිපතිවරයා විසින් ඒ විගණකවරයාට හෝ විගණකවරයන්ට ලියවිල්ලකින් දන්විය හැකි අතර එසේ දන්වනු ලැබූ විට ඒ විගණකවරයා හෝ විගණක වරයන් විගණකාධිපතිවරයාගේ මෙහෙයවීම හා පාලනය යටතේ ක්‍රියා කළ යුතු ය.

(3) (2) වන උපවගන්තියේ විධිවිධාන යටතේ පත් කරන ලද සෑම සුදුසුකම් ලත් විගණකවරයකු ම විසින් තම වාර්තාව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර එහි පිටපතක් විගණකාධිපතිවරයා වෙත ද ඉදිරිපත් කළ යුතු ය.

(4) විගණකාධිපතිවරයා විසින් බැංකුවේ ගිණුම් පරීක්‍ෂා කොට, ශේෂ පත්‍රයේ නිරවද්‍යතාව නිසැකව දැන ගෙන—

(අ) තමාට අවශ්‍ය වූ සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම තමා ලබාගත්තේ ද, නොගත්තේද යන වග ද;

(ආ) වාර්තාවේ සඳහන් ශේෂ පත්‍රය, තමාට ලැබී ඇති තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ බැංකුවේ පොත්පත්වල දක්වා ඇති පරිදි බැංකුවේ කටයුතු, තමාගේ මතය අනුව, සත්‍ය හා නිවැරදි ආකාරයෙන් පෙන්නුම් කෙරෙන ලෙස නිසි පරිදි පිළියෙල කර තිබේ ද යන වග ද

අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙත වාර්තා කළ යුතු ය.

(5) ශේෂ පත්‍රයේ නිරවද්‍යතාව නිසැකව දැන ගැනීම පිණිස විගණකාධිපතිවරයා විසින්, අධ්‍යක්‍ෂ මණ්ඩලයේ සහ අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, බැංකුවේ යම් ශාඛාවක් සම්බන්ධයෙන්, බැංකුවේ ප්‍රධාන කාර්යාලය වෙත එවා ඇති සහ සහතික කිරීම සඳහා අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් බලය දෙනු ලැබූ බැංකුවේ නිලධරයකු විසින් නිරවද්‍ය බවට සහතික කොට ඇති ඒ ශාඛාවේ පොත්පත්වල සහ ගිණුම්වල පිටපත් හෝ උද්ධෘත පිළිගත හැකි ය.

(6) මේ වගන්තියේ ''සුදුසුකම් ලත් විගණකවරයා'' යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්

අදහස් වේ.

**56.** (1) යම් වර්ෂයක් සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ වාර්තාව ලැබුණු විට අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් ඒ වර්ෂය සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් එක් එක් ලේඛනයේ පිටපතක් අමාත්‍යවරයා වෙත සහ සියලුම කොටස් හිමියන් වෙත යැවීමට සැලැස්විය යුතු ය:—

(අ) විගණකාධිපතිවරයාගේ වාර්තාව;

(ආ) ශේෂ පත්‍රය;

(ඇ) ලාභ සහ අලාභ ගිණුම; සහ

(ඈ) බැංකුවේ වැඩකටයුතු පිළිබඳව විස්තර කෙරෙන අධ්‍යක්‍ෂ මණ්ඩලයේ සභාපතිවරයාගේ වාර්තාව.

(2) (1) වන උපවගන්තිය යටතේ තමා වෙත ලැබුණු ලේඛනවල පිටපත් අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

## IV වන කොටස

### බැංකුවේ ව්‍යාපාරවලට සහභාගිවීමේ ගිවිසුම

**57.** (1) බැංකුවේ ව්‍යාපාරවලට යම් ජාත්‍යන්තර හෝ කලාපීය මූල්‍ය ආයතනයක සහභාගිත්වය සඳහා ඒ ආයතනය සමඟ ගිවිසුමකට ඇතුළත් වීමට අධ්‍යක්ෂ මණ්ඩලයට මෙයින් බලය දෙනු ලැබේ; තව ද එවැනි ගිවිසුමකට ඇතුළත් වූ විට ගිවිසුමෙහි තත් කාර්ය සඳහා සඳහන් කර තිබෙන දිනයක සිට ඒ ආයතනය මේ පනතේ කාර්ය සඳහා සහභාගීවන්නකු විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් යම් ගිවිසුමක ඇතුළත් කළ යුතු ලෙස මේ පනතින් නියමිත හෝ ඇතුළත් කිරීමට මේ පනතින් බලය ලැබෙන විධිවිධානවලට අතිරේකව අවශ්‍ය යයි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සලකනු ලබන ප්‍රතිඥප්ති සහ කොන්දේසි ද ඒ ගිවිසුමේ ඇතුළත් කළ හැකි ය.

(3) සහභාගිවන්නකු විසින් මේ පනත යටතේ හෝ මේ පනතේ කාර්ය සඳහා හෝ ක්‍රියාත්මක කළ හැකි සියලු අයිතිවාසිකම් හෝ බලතල තත් කාර්යය සඳහා ගිවිසුමෙහි සඳහන් වන යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් සහභාගිවන්නා වෙනුවෙන් එහි සඳහන් වන ආකාරයට ක්‍රියාත්මක කළ හැකි අතර එසේ ක්‍රියාත්මක කරනු ලැබුවහොත්, සහභාගිවන්නා විසින් ඒ අයිතිවාසිකම් හෝ බලතල යථා පරිදි ක්‍රියාත්මක කරනු ලැබූ ලෙස මේ පනතේ කාර්ය සඳහා සැලකිය යුතු ය.

**58.** යටත් පිරිසෙයින් එක සහභාගිවන්නකුවත් සිටින තාක් කල් පමණක් 59 වන වගන්තියේ සිට 63 වන වගන්තිය තෙක් වූ වගන්තිවල (ඒ වගන්ති දෙකම ඇතුළුව) විධිවිධාන අදාළ විය යුතු ය.

**59.** (1) (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, සහභාගිවන්නකු විසින් ඔහු පාර්ශ්වකරුවකු වූ ද, 57 (1) වන වගන්තියේ සඳහන් වන්නා වූ ද ගිවිසුමෙහි සඳහන් වන යම් මුදල් ප්‍රමාණයක් හෝ එවැනි මුදල් ප්‍රමාණයක් සඳහන් කර නොමැති නම්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන මුදල් ප්‍රමාණයක් බැංකුවේ ප්‍රාග්ධනය සඳහා ආරම්භක දායක මුදලක් වශයෙන් ගෙවිය යුතු ය.

(2) (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, කොටස් හිමියන් විසින් බැංකුවේ ප්‍රාග්ධනය සඳහා යම් වැඩිදුර දායක මුදලක් ගෙවා ඇති අවස්ථාවක බැංකුවෙහි ප්‍රාග්ධනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් මුදල් ප්‍රමාණයක්, සහභාගිවන්නකු විසින් වැඩිදුර දායක මුදලක් වශයෙන් ගෙවනු ලැබිය හැකි ය.

(3) (1) වන සහ (2) වන උපවගන්තිවල විධිවිධාන මෙහි පහත දක්වෙන සීමාකිරීම් වලට සහ කොන්දේසිවලට යටත් විය යුතු ය. එනම්:—

(අ) එක් සහභාගිවන්නකු පමණක් සිටින අවස්ථාවක, බැංකුවේ ප්‍රාග්ධනය සඳහා (1) වන උපවගන්තිය යටතේ ඔහුගේ ආරම්භක දායක මුදල හෝ (1) වන හා (2) වන උප වගන්ති යටතේ ඔහුගේ දායක මුදල්වල මුළු එකතුව බැංකුවේ තත් කාලයේ ප්‍රාග්ධනයෙන් සියයට හතලිස් නවයක් නොඉක්මවිය යුතු ය; නැතහොත්

(ආ) සහභාගිවන්නන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් සිටින අවස්ථාවක, බැංකුවේ ප්‍රාග්ධනය සඳහා (1) වන උප වගන්තිය යටතේ ඔවුන්ගේ ආරම්භක දායක මුදල්වල මුළු එකතුව හෝ (1) වන හා (2) වන උපවගන්ති යටතේ ඔවුන්ගේ දායක මුදල්වල මුළු එකතුව බැංකුවේ තත් කාලයේ ප්‍රාග්ධනයෙන් සියයට හතළිස් නවයක් නොඉක්මවිය යුතු ය.

**60.** (1) සහභාගිවන්නකු බැංකුවේ ප්‍රාග්ධනය සඳහා දායක වී තිබීමේ හේතුවෙන් බැංකුවේ කොටස් හිමියකු විය යුතු ය. ඒ අනුව, ඒ සහභාගිවන්නා දායක වූ මුදල් ප්‍රමාණයට සමාන මුදලක් දක්වා එකක් රුපියල් එක් සියයක නාම මාත්‍ර අගයකින් යුත් කොටස් සඳහා සහතික බැංකුව විසින් සහභාගිවන්නාට නිකුත් කළ යුතු ය.

(2) යම් සහභාගිවන්නකු දරන යම් කොටස් වෙනත් කෙනෙකුට පැවරීමට හෝ බැහැර කිරීමට ඔහුට ඇති අයිතිය, ඒ සම්බන්ධයෙන් මේ පනතේ සඳහන් විධිවිධානවලට සහ ඒ සහභාගිවන්නා පාර්ශ්වකරුවකු වූ ද 57 (1) වන වගන්තිය යටතේ ඇතුල්වූ ද ගිවිසුමේ සඳහන් විධිවිධානවලට යටත් විය යුතු ය; තවද, එවැනි යම් කොටස් වෙනත් යම් තැනැත්තකුට යථා පරිදි පවරනු ලැබුවහොත්, එකී වෙනත් තැනැත්තා සහභාගිවන්නා විණි නම් සාකල්‍යයෙන්ම ඒ කොටස් දරන ආකාරයෙන් ම සහ එසේ විණි නම් ඒ කොටස් දැරීම යටත් වන්නේ (මේ පනතේ හෝ ඒ ගිවිසුමේ සඳහන්) යම් කොන්දේසිවලට ද, ඒ කොන්දේසිවලට ම යටත්ව ඒ කොටස් එකී වෙනත් තැනැත්තා විසින් දැරිය යුතු ය.

**61.** බැංකුව විසුරුවා හරිනු ලැබූ විටක, බැංකුවේ වත්කම් විකිණීමෙන් ලැබෙන ආදායම අතුරින් වෙනත් තැනැත්තන්ට බැරකම් ගෙවීමෙන් පසුව ඉතිරිවන මුදල් ප්‍රමාණයට, තමන් දරන කොටස්වල නාමමාත්‍ර අගය අනුව, ප්‍රමාණානුකූලව සහභාගිවීමට බැංකුවේ කොටස් හිමියන්ට තමන් දරණ කොටස් හේතු කොටගෙන හිමිකම ලැබිය යුතු ය.

**62.** (1) අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව කැමැත්ත ලියවිල්ලකින් ලබාගෙන මිස සහ ඒ මණ්ඩලය විසින් තත් කාර්යය සඳහා අනුමත කරනු ලබන තැනැත්තකුට හෝ තැනැත්තකුගේ වාසියට හැර, බැංකුවේ යම් කොටසක් විකිණීමට, පවරා දීමට, වැයබරකට යටත් කිරීමට හෝ වෙනත් කවර වූ හෝ ආකාරයකින් අන්සතු කිරීමට නැතහොත් බැඳීමකට යටත් කිරීමට සහභාගිවන්නකුට හිමිකම් නොතිබිය යුතු ය.

(2) 57 වන වගන්තිය යටතේ ඇතුල් වූ යම් ගිවිසුමක පාර්ශ්වකරුවකු වූ යම් සහභාගිවන්නකුගේ කොටස් විකිණීම හෝ අන්සතු කිරීම සඳහා වූ අදහසකට අධ්‍යක්ෂ මණ්ඩලයේ කැමැත්ත දීම නොකළ යුත්තේ කවර හේතු නිසා ද යන වග සඳහන් කෙරෙන විධිවිධාන එකී ගිවිසුමෙහි ඇතුළත්ව ඇත්නම්, ඒ විධිවිධාන මෙහි ලා පනවනු ලැබුවාක් මෙන් බලපැවැත්විය යුතු ය.

(3) සහභාගිවන්නකුගේ බැංකුවේ කොටස් කිසිවක්, සාමාන්‍යාධිකාරිවරයා විසින් ඒ සහභාගිවන්නාට ලියවිල්ලකින් දැනුම් දිය යුතු, අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව කැමැත්ත ඇතිව හැර, යම් අධිකරණයක ආඥාවක් හෝ තීන්දු ප්‍රකාශයක් ක්‍රියාත්මක කිරීමේ ලා හෝ සහභාගිවන්නා බුන්වත්වීමකදී පැවරුම්ලාභියකු විසින් හෝ සහභාගිවන්නා සමාගමක් නම්, යම් ඈවරකරුවකු විසින් හෝ ඒ සමාගම වසා දැමීම සඳහා වූ යම් ක්‍රියා මාර්ගයක දී හෝ විකිණීම හෝ විකිණීමට යටත් කිරීම හෝ නොකළ යුතු ය.

(4) (1) වන උපවගන්තිය හෝ (3) වන උපවගන්තිය මගින් නියමිත පරිදි පූර්ව කැමැත්ත ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට ඉල්ලීමක් කරනු ලැබූ අවස්ථාවක එසේ කැමැත්ත දෙනු වෙනුවට ඒ ඉල්ලීමට විෂය වූ කොටස් වෙනත් කොටස් හිමියකු විසින් අත්කර ගත යුතු යයි ඒ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි ය.

(5) යම් ලිඛිත නීතියක හෝ වෙනත් නීතියක කුමක් සඳහන්ව ඇත ද, මේ වගන්තියේ මීට ඉහතින් ඇති විධිවිධාන බලපැවැත්විය යුතු අතර එකී ඉහතින් ඇති විධිවිධාන සහ එකී යම් ලිඛිත නීතියක හෝ වෙනත් නීතියක ඇතුළත් කිසිවක් අතර යම් ගැටුමක් හෝ අනනුකූලතාවක් ඇති වූ විටක එකී විධිවිධාන එකී ලිඛිත නීතිය හෝ එකී වෙනත් නීතිය අභිබවා බල පැවැත්විය යුතු ය.

**63.** 62 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ කරන ලද නිශ්චය කිරීමක් අනුව සහභාගිවන්නකුගේ කොටස් සියල්ලම හෝ ඉන් යම් කොටසක් හෝ කොටස් හිමියකු විසින් අත් කර ගනු ලබන අවස්ථාවක, එසේ අත් කර ගනු ලබන කොටස්වල වටිනාකම, ඒ සහභාගි

වන්නා පාර්ශ්වකරුවකු වූ සහ 57 වන වගන්තිය යටතේ ඇතුළත් වූ ගිවිසුමෙහි දක්වා ඇති ආකාරයට සහ ඒ ගිවිසුමෙහි තත් කාර්යය සඳහා ඇතුළත් නියම හා කොන්දේසි අනුව නිශ්චය කළ යුතු ය.

**64.** මේ පනතේ මීට ඉහතින් ඇති විධිවිධාන යටතේ කොටස් හිමියකු විසින් අත් කර ගන්නා ලද හෝ මිල දී ගන්නා ලද සහභාගිවන්නකුගේ බැංකුවේ කොටස් සියල්ලම හෝ ඉන් යම් කොටසක් හෝ සඳහා ඒ කොටස් හිමියා විසින් මුදල් ගෙවිය යුතු ය.

## V වන කොටස

### සාමාන්‍ය කරුණු

**65.** මෙහි පහත දක්වෙන ලිඛිත නීතිවල විධිවිධාන බැංකුව සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය:—

(අ) මුදල් ණයට දීම පිළිබඳ ආඥාපනත;

(ආ) ණය සහන ආඥාපනත; සහ

(ඇ) 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනත.

**66.** මුදල් නීති පනතේ කාර්ය සඳහා බැංකුව ණය දෙන ආයතනයක් ලෙස සැලකිය යුතු අතර ඒ අනුව බැංකුව විසින් කලින් කල අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරන මුදල් ප්‍රමාණ ශ්‍රී ලංකා මහ බැංකුවේ මධ්‍ය කාල සහ දීර්ඝ කාල ණය අරමුදලෙන් ණයට ගනු ලැබිය හැකි ය

**67.** තම කාර්ය නිසි පරිදි හා අවංක ලෙස ඉටු කරන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමට පත්වන පරිදි ඇප තැබිය යුත්තේ බැංකුවේ කවර පංතිවල නිලධරයන් ද යන වග අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි ය. එසේ නිශ්චය කරනු ලැබූ යම් පංතියකට අයත් බැංකුවේ සෑම නිලධරයකු ම එසේ ඇප තැබිය යුතු ය.

**68.** බැංකුවට දරන්නට සිදු වූ යම් අලාභයක් හෝ පාඩුවක් බැංකුවේ යම් අධ්‍යක්ෂවරයකුගේ හෝ නිලධරයකුගේ විෂමාචාරය හෝ ඕනෑකමින් පැහැර හැරීම හෝ නිසා සිදුවූවක් නම් මිස, ඒ අධ්‍යක්ෂවරයා හෝ නිලධරයා ඒ අලාභය හෝ පාඩුව වෙනුවෙන් වගකීමට යටත් නොවිය යුතු ය.

**69.** බැංකුවේ සෑම අධ්‍යක්ෂවරයකු ම, කළමනාකාරවරයකු ම, විගණකවරයකු ම, නිලධරයකු ම, සේවකයකු ම, අනුයෝජිතයකුම, ගණකාධිකාරිවරයකුම හෝ බැංකුවේ ව්‍යාපාර කටයුතු සඳහා සේවයෙහි යොදවනු ලබන වෙනත් සෑම තැනැත්තකු ම විසින් ස්වකීය කාර්ය. ආරම්භ කිරීමට පෙර, බැංකුවේ සියලු ගනුදෙනු, එහි ගනුදෙනුකරුවන් සහ ගිණුම් පිළිබඳ තත්ත්වය සහ ඒවාට අදාළ සියලු කරුණු සම්බන්ධයෙන් දැඩි රහස්‍යතාව රකින බවට ප්‍රතිඥා දෙන ප්‍රකාශයක් අත්සන් කළ යුතු අතර ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී තමාට දැනගන්නට ලැබෙන වෙනත් යම් කරුණක්—

(අ) එය හෙළිදරව් කරන ලෙස—

(i) අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, හෝ

(ii) අධිකරණයක් විසින්, හෝ

(iii) එය අදාළ වන තැනැත්තා විසින්, හෝ ඉල්ලා සිටි විටක;

(ආ) ස්වකීය කාර්ය කිරීමේ ලා; සහ

(ඇ) මේ පනතේ යම් විධිවිධානයක් අනුව ක්‍රියා කිරීම පිණිස හැර, හෙළිදරව් නොකිරීමටද ඒ ප්‍රකාශයෙන් ඔහු විසින් ප්‍රතිඥා දිය යුතු ය.

**70.** කවර වූ හෝ අවස්ථාවක, බැංකුවේ ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් තමාගෙන් අසනු ලැබූ යම් ප්‍රශ්නයකට දෙන පිළිතුරෙන් බැංකුවේ රහස් හෝ බැංකුවේ යම් ගනුදෙනුකරුවකුගේ ව්‍යාපාර හෝ කටයුතු පිළිබඳ රහස් හෝ අනාවරණය වේ යයි හෝ අනාවරණය වීමට තුඩු දේ යයි බැංකුවේ යම් අධ්‍යක්ෂවරයකු, විගණකවරයකු, කළමනාකාරවරයකු, ලේකම්වරයකු හෝ වෙනත් නිලධරයකු සලකන්නේ නම්, එසේ පිළිතුරු දෙන ලෙස අධිකරණයක් විසින් හෝ වෙනත් නීතියකින් හෝ නියම කරනු ලැබූ විටක හැර, ඒ ප්‍රශ්නයට පිළිතුරු දීම ඔහු විසින් ප්‍රතික්ෂේප කළ යුතු ය.

**71.** බැංකුවේ සාමාන්‍යාධිකාරිවරයා විසින් අත්සන් කරන ලද ලදුපතක් හෝ ලදුපත්දීම සඳහා සාමාන්‍යාධිකාරිවරයා විසින් ප්‍රකාශිතව ම බලය දෙනු ලැබූ යම් තැනැත්තකු විසින් අත්සන් කරන ලද ලදුපතක්, බැංකුවට ගෙවිය යුතු මුදල් ගෙවා සාර්ථක ලෙස නිදහස් වූ බවට සාක්ෂියක් විය යුතු ය.

**72.** (1) බැංකුව වෙනුවෙන් මෙහි පහත දැක්වෙන පරිදි ගිවිසුම් ඇති කර ගත හැකිය:—

(අ) පෞද්ගලික තැනැත්තන් අතර ඇති කර ගන්නා ලද නම්, නීතිය අනුව ලියවිල්ලකින් විය යුතුවූ ගිවිසුමක් බැංකුව වෙනුවෙන්, බැංකුවේ පොදු මුද්‍රාව යටතේ ලියවිල්ලකින් ඇති කර ගත හැකි ය;

(ආ) පෞද්ගලික තැනැත්තන් අතර ඇති කර ගන්නා ලද නම්, නීතිය අනුව ලියවිල්ලකින් විය යුතු වූ සහ එහි පාර්ශ්වකරුවන් විසින් අත්සන් කරනු ලැබිය යුතු වූ ගිවිසුමක්, බැංකුව වෙනුවෙන්, මෙහි මින් මතු විධිවිධාන සලසා ඇති පරිදි තත් කාර්යය සඳහා විධිමත්ව බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින් හෝ යම් තැනැත්තන් විසින් අත්සන් කොට ලියවිල්ලකින් ඇතිකර ගත හැකි ය; තව ද

(ඇ) පෞද්ගලික තැනැත්තන් අතර ඇති කර ගන්නා ලද නම්, ලියවිල්ලකින් නොමැතිව වාචිකව පමණක් ඇති කර ගන්නා ලද නමුදු නීතියෙන් වලංගු වන ගිවිසුමක්, බැංකුව වෙනුවෙන්, මෙහි මින් මතු විධිවිධාන සලසා ඇති පරිදි තත් කාර්යය සඳහා විධිමත්ව බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින් හෝ තැනැත්තන් විසින් වාචිකව ඇති කර ගත හැකි ය.

(2) මේ වගන්තිය අනුව ඇති කර ගන්නා ලද ගිවිසුමක් නීතියෙහිලා බලාන්විත විය යුතු අතර බැංකුවද ඒ ගිවිසුමේ වෙනත් සියලු පාර්ශ්වකරුවන් ද ඔවුන්ගේ නීත්‍යානුකූල නියෝජිතයන් ද ඉන් බැඳීමකට යටත් විය යුතු ය.

(3) මේ වගන්තිය අනුව ඇති කර ගන්නා ලද ගිවිසුමක් එය ඇති කර ගැනීමට මේ වගන්තියෙන් බලය පැවරී ඇති ආකාරයෙන්ම වෙනස් කිරීමට හෝ අවසාන කිරීමට හෝ හැකි ය.

**73.** විනිමය පත්‍රයක් හෝ පොරොන්දු නෝට්ටුවක් බැංකුව වෙනුවෙන් සෑදීමට, ලියා අත්සන් කිරීමට හෝ පිටසන් කිරීමට මෙහි මින් මතු විධිවිධාන සලසා ඇති පරිදි විධිමත්ව බලය පවරනු ලැබූ යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් බැංකුවේ නමින් හෝ බැංකුව වෙනුවෙන් හෝ බැංකුව සඳහා සාදන ලද ලියා අත්සන් කරන ලද, හෝ පිටසන් කරන ලද, විනිමය පත්‍රයක් හෝ පොරොන්දු නෝට්ටුවක් බැංකුව වෙනුවෙන් සාදන ලද, ලියා අත්සන් කරන ලද හෝ පිටසන් කරන ලද විනිමය පත්‍රයක් හෝ පොරොන්දු නෝට්ටුවක් සේ සැලකිය යුතු ය.

**74.** සාමාන්‍යාධිකාරිවරයාට සහ යම් පොරොන්දු නෝට්ටුවක්, විනිමය පත්‍රයක්, චෙක් පතක් හෝ මුදල් ගෙවීම සඳහා ඇණවුමක් බැංකුවේ නමින් හෝ බැංකුව වෙනුවෙන් සෑදීමට, අණ කිරීමට පිළිගැනීමට හෝ පිටසන් කිරීමට හෝ බැංකුව කෙරෙහි වගකීමක් පැවරෙන පරිදි යම් ගිවිසුමකට ඇතුළත් වීමට නැතහොත් බැංකුවේ කීර්තිය ඔඩපනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රකාශිතව ම බලය පවරනු ලැබුවා වූද තමන් වෙත එසේ පවරන ලද බලයේ සීමා ඇතුළත ක්‍රියා කරන්නා වූ ද තැනැත්තන්ට හැර, වෙනත් කිසිම තැනැත්තකුට ඒ කිසිම ක්‍රියාවක් කිරීමට බලය නොතිබිය යුතු ය.

**75.** (1) ශ්‍රී ලංකාවෙන් පිටත කවර වූ හෝ ස්ථානයක දී බැංකුව වෙනුවෙන් බැංකුවේ ඇටෝර්නි බලකරු ලෙස ඔප්පු ලියා අත්සන් කිරීමට, පොදුවේ හෝ යම් නිශ්චිත කරුණක් සම්බන්ධයෙන් හෝ බැංකුව විසින් බැංකුවේ පොදු මුද්‍රාව යටතේ යම් තැනැත්තකුට ලියවිල්ල කින් බලය දිය හැකි ය.

(2) එවැනි ඇටෝර්නි බලකරුවකු විසින් බැංකුව වෙනුවෙන් ස්වකීය අත්සන හෝ මුද්‍රාව යටතේ අත්සන් කරන ලද ඔප්පුවකින් බැංකුව බැඳීමකට යටත් විය යුතු අතර එය බැංකුවේ පොදු මුද්‍රාව යටතේ අත්සන් කරන ලද ඔප්පුවක් වූවාක් මෙන් බල සහිත විය යුතුය.

**76.** මේ පනතේ විධිවිධානවලට හෝ මහා බැංකු ප්‍රතිපත්තිවලට අනනුකූල නොවන පරිදි පහත දක්වෙන කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රීති සෑදිය හැකි ය:—

(අ) නියම කරනු ලැබීමට මේ පනතින් නියමිත කරුණු;

(ආ) රීති සෑදීමට මේ පනත යටතේ නියම කරනු ලැබ තිබෙන්නේ හෝ බලය පවරනු ලැබ තිබෙන්නේ යම් කරුණු සම්බන්ධයෙන් ද ඒ කරුණු; සහ

(ඇ) ස්වකීය අරමුණු සාර්ථකව ඉටු කර ගැනීමට ද, බලතල ක්‍රියාත්මක කිරීමට සහ කාර්ය කිරීමට හා ව්‍යාපාර කටයුතු කරගෙන යාමට බැංකුවට හැකිවනු පිණිස අවශ්‍ය කරුණු.

**77.** (1) මේ පනතේ යම් විධිවිධානයක් උල්ලංඝනය කරන හෝ මේ පනතේ යම් විධි විධානයකට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන කාල යක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ ඔහු යටත් වියයුතු ය.

(2) පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනත යටතේ යම් වරදක් කරනු ලැබූ අවස්ථාවක—

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාගත මණ්ඩලයක් වේ නම්, ඒ සංස්ථාගත මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂවරයකු ම සහ නිලධරයකු ම ද;

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාරික ආයතනයක් වේ නම්, ඒ ව්‍යාපාරික ආයතනයේ සෑම හවුල්කරුවකු ම ද

ඒ වරදට වරදකරු ලෙස සැලකිය යුතු ය:

එසේ වුව ද, ඒ වරද කරන ලද්දේ තමා නොදැනුවත්ව බව හෝ ඒ වරද කිරීම වැළැක්වීම පිණිස තමා නිසි සියලු අනලස්භාවයෙන් යුතුව ක්‍රියා කළ බව ඒ සංස්ථාගත මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු විසින් හෝ නිලධරයකු විසින් හෝ ඒ ව්‍යාපාරික ආයතනයේ හවුල්කරුවකු විසින් ඔප්පු කරනු ලැබුවහොත් ඔහු ඒ වරදට වරදකරු ලෙස නො සැලකිය යුතු ය.

**78.** (1) බැංකුවේ ප්‍රාග්ධනයට දායක වීමට ද බැංකුව විසින් නිකුත් කරනු ලබන කොටස්, ස්කන්ධ, ණයකර, පොරොන්දු නෝට්ටු හෝ වෙනත් සුරැකුම්පත් මිළ දී ගැනීමට ඒවාට ඇපවීමට, හෝ ඇප වශයෙන් ඒවා පිළිගැනීමට ද, මුදල් නීති පනතේ 117 වන සහ 125 වන වගන්තිවල විධිවිධාන නොසලකා, ශ්‍රී ලංකා මහ බැංකුවට මෙයින් බලය දෙනු ලැබේ.

(2) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, බැංකුවේ ප්‍රාග්ධන යට දායක වීමට ලංකා බැංකුවට සහ මහජන බැංකුවට මෙයින් බලය දෙනු ලැබේ.

**79.** බැංකුවේ කාර්ය කිරීම සහ බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පොදු හෝ විශේෂ විධාන අමාත්‍යවරයා විසින් කලින් කල ලියවිල්ලකින් දිය හැකි අතර ඒ විධාන අනුව ක්‍රියා කිරීම බැංකුවේ යුතුකම විය යුතු ය.

80. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"අධ්‍යක්ෂවරයා" යන්නෙන්, අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු අදහස් වේ;

"අධ්‍යක්ෂ මණ්ඩලය" යන්නෙන්, බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය අදහස් වේ;

"අනුමත ණය දෙන ආයතනය" යන්නෙහි, මුදල් නීති පනතේ 88 ඊ වන වගන්තියේ "ණය දෙන ආයතනය" යන්නට දී ඇති අර්ථය ම ඇති අතර, මේ පනතේ කාර්ය සඳහා අනුමත ණය දෙන ආයතන වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කලින් කල නිශ්චය කරනු ලබන වෙනත් ආයතන ද ඊට ඇතුළත් වේ;

"කර්මාන්තය" යන්නට 1966 අංක 10 දරන ලංකා සංචාරක මණ්ඩල පනතේ අර්ථානුකූල වූ සංචාරක ව්‍යාපාරය සහ සංචාරක සේවා ද, ආකර කර්මාන්තය සහ ධීවර කර්මාන්තය ද ඇතුළත් වන අතර "කාර්මික" යන පදයෙහි අර්ථය ඒ අනුව තේරුම් ගත යුතු ය;

"කොටස් හිමියා" යන්නෙන්, බැංකුවේ කොටස් හිමියකු අදහස් වේ;

"මහජන බැංකුව" යන්නෙන්, 1961 අංක 29 දරන පනත යටතේ පිහිටුවන ලද මහජන බැංකුව අදහස් වේ;

"මුදල් මණ්ඩලය" යන්නෙන්, මුදල් නීති පනතේ 8 වන වගන්තිය යටතේ සංස්ථාපිත ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය අදහස් වේ;

"ලංකා බැංකුව" යන්නෙන්, ලංකා බැංකුව ආඥාපනත යටතේ පිහිටුවන ලද ලංකා බැංකුව අදහස් වේ;

"ව්‍යවසාය" යන්නෙන්, කවර හෝ නමකින් හෝ පදවි නමකින් හැඳින්වෙන, සංස්ථාගත හෝ සංස්ථාගත නොකළ යම් පුද්ගල මණ්ඩලයක් අදහස් වන අතර ඊට ඒක පුද්ගල සංස්ථාවක් හෝ තනි හිමිකාරකමක් ඇතුළත් වේ;

"ශ්‍රී ලංකා මහ බැංකුව" යන්නෙන්, මුදල් නීති පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ.

---

## 1979 අංක 14 දරන මුදල් නීති (සංශෝධන) පනත

**[සහතිකය සටහන් කළේ 1979 මාර්තු මස 7 වන දින]**

**මුදල් නීති පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

1. මේ පනත 1979 අංක 14 දරන මුදල් නීති (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන මුදල් නීති පනතේ 58 වන වගන්තියට ඉක්බිතිව ම පහත දක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ පනතේ 58අ වන වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය:—

**"නීතියෙන් වලංගු ලෙස හැර අන්‍යාකාරයට මුදල් කාසි පාවිච්චි කිරීම.**

58අ. (1) ශ්‍රී ලංකාවෙහි වලංගුව පවතින යම් කාසියක්, මුදල් මණ්ඩලයේ අනුමතය නොමැතිව උණු කරන, කඩා වෙන් කරන, සිදුරු කරන, විරූප කරන නැතහොත් නීතියෙන් වලංගු ලෙස හැර අන්‍යාකාරයට පාවිච්චි කරන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය කඩ කරමින් කටයුතු කරනු ලැබ ඇත්තේ යම් කාසියක් සම්බන්ධයෙන් ද එම කාසියෙන් ලබාගත් බවට තමන් දන්නා වූ නැතහොත් එසේ ලබාගත් බවට විශ්වාස කිරීමට තමන්ට සාධාරණ හේතු තිබෙන්නා වූ යම් ලෝහයක් හෝ භාණ්ඩයක් දැනුවත්ව පාවිච්චි කරන, සන්තකයෙහි තබාගෙන සිටින නැතහොත් ඒ සම්බන්ධයෙන් කටයුතු කරන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු ය. "

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 122 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(2අ) 58අ වගන්තියේ (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය කඩ කිරීමේ හේතුවෙන් වරදකට වරදකරු වන සෑම තැනැත්තකු ම, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් තුන් දහසක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාර යෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය. 58අ වගන්තියේ (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය හෝ යටතේ වූ වරදක් සඳහා යම් තැනැත්-තකු මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට, වරද කරනු ලැබුවේ යම් කාසියක් සම්බන්ධයෙන් ද ඒ කාසිය හෝ ඒ කාසියෙන් ලබාගත් යම් ලෝහයක් නැතහොත් වෙනත් භාණ්ඩය හෝ රාජ්‍ය සන්තක විය යුතු බවට මහෙස්ත්‍රාත්වරයා විසින් ආඥාවක් කරනු ලැබිය හැකි ය." ; තවද

(ආ) ඒ වගන්තියේ (3) වන උප වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(3) (2) වන උපවගන්තිය හෝ (2අ) උපවගන්තිය මගින් කිසිම දඬුවමක් නියම නොකරන ලද වරදකට වරදකරු වන සෑම තැනැත්තකු ම මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයක් නොඉක්-මවන දඩයකට හෝ එක් මාසයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.".

---

## 1979 අංක 19 දරන බැංකු හර බදු (ඉවත් කිරීමේ) පනත

**[සහතිකය සටහන් කළේ 1979 මාර්තු මස 20 වන දින]**

**1970 අංක 27 දරන බැංකු හර බදු පනත ඉවත් කිරීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසද වූ පනතකි.**

1. මේ පනත 1979 අංක 19 දරන බැංකු හර බදු (ඉවත් කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, සියලු කාර්ය සඳහා එය 1979 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සැලකිය යුතු ය.

2. ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 32 දරන පනතින් සංශෝධිත 1970 අංක 27 දරන බැංකු හර බදු පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

3. 1970 අංක 27 දරන බැංකු හර බදු පනත ඉවත් කිරීම නොතකා, 1979 ජනවාරි මස 1 වන දිනට පෙර යම් කාලසීමාවක් සම්බන්ධයෙන්, එකී පනත යටතේ ගෙවිය යුතු යම් බද්දක්, එවැනි ඉවත් කිරීමක් නොතිබුණ ලෙස සලකා එකතු කර ගැනීම සහ අය කර ගැනීම කළ හැකි ය.

# 1979 අංක 26 දරන ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1979 අප්‍රේල් මස 25 වන දින]

**ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

බැංකු සේවකයන්ට උචිත පුහුණුව සැපයීමේ කාර්ය සහ ආයතනයේ පාලක මණ්ඩලයේ සාමාජිකයන් විසින් අනුමත කරනු ලැබූ ප්‍රතිපත්තිවලට අනුකූලව ඒ ආයතනයේ වෙනත් අරමුණු ඉටු කර ගැනීමේ කාර්ය සඳහාත්, ලංකා බැංකුවේ, මහජන බැංකුවේ හා වාණිජ බැංකු සංගමයේ ආධාරයත් සහයෝගයත් ඇතිව, ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුග්‍රහය යටතේ (ලංකා) බැංකුකරුවන් පුහුණු කිරීමේ ආයතනය යන නමින් වූ ආයතනයක් එක් දහස් නවසිය හැට හතරේ වර්ෂයේදී ශ්‍රී ලංකාවේ පිහිටුවනු ලැබ ඇති හෙයින් ද:

එකී ආයතනය එතැන් සිට එහි අරමුණු සාර්ථක ලෙස ඉටු කර ගෙන යනු ලබන බැවින්, එකී ආයතනය සංස්ථාගත කිරීම දැනට යෝග්‍ය වන හෙයින් ද:

1. මේ පනත 1979 අංක 26 දරන ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) මේ පනත ආරම්භවීමේ දිනයේ දී (ලංකා) බැංකුකරුවන් පුහුණු කිරීමේ ආයතනයේ පාලක මණ්ඩලයේ සාමාජිකයන්ව සිටි තැනැත්තෝ ද මින් මතු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ පාලක මණ්ඩලය සමන්විත වන වෙනත් යම් තැනැත්තෝද ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කර ගනු ලබන වෙනත් යම් තැනැත්තෝ ද (මින් මතු මේ පනතේ "ආයතනය" යනුවෙන් හඳුන්වනු ලබන) ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය යන නමින් සංස්ථාපිත මණ්ඩලයක් වන්නාහ.

(2) ආයතනයට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු අතර, එහි සංස්ථා නාමයෙන් ආයතනයට විරුද්ධව නඩු පවරනු ලැබීම සහ ආයතනය විසින් ඒ නාමයෙන් නඩු පැවරීම ද කරනු ලැබිය හැකි ය.

3. (අ) බැංකු ආයතනවල සේවා නියුක්තයන්ට සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවා නියුක්තයන්ට බැංකු විද්‍යානයාය, පරිචය සහ ඊට සම්බන්ධිත විෂයයන් අධ්‍යයනය පිළිබඳව උපදෙස් සහ පුහුණුවක් සැපයීමේ සහ ඉහත සඳහන් කාර්යය සඳහා දේශන, සාකච්ඡා සහ පුස්තකාලයීය පහසුකම් ඇතුළු සියලු පහසුකම් සැපයීම;

(ආ) විභාග පැවැත්වීම සහ ඒ විභාගවලින් සාමාර්ථය ලත් තැනැත්තන් හට සහතික පත්‍ර ප්‍රදානය කිරීම ;

(ඇ) බැංකුකරුවන්ට වැදගත් කමක් ඇති කරුණු සම්බන්ධව සාකච්ඡා පැවැත්වීමට පහසුකම් සැලැස්වීම සහ උනන්දු කිරීම ; සහ

(ඈ) බැංකු විද්‍යාවේ අභිවෘද්ධිය ඇති කිරීම පිණිස යෝග්‍ය විය හැකි අන්දමේ පියවරවල් ගැනීම

ආයතනයේ අරමුණු වන්නේ ය.

4. (1) ආයතනයේ කටයුතු, තත්කාලයේ ආයතනයේ රීති වලට යටත්ව (මේ පනතේ මින් මතු "මණ්ඩලය" යනුවෙන් හඳුන්වනු ලබන)—

(අ) ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා විසින් නම් කරනු ලැබූ ඒ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරයකු විය යුතු සභාපති වරයකු;

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා විසින් නම් කරනු ලැබූ ඒ බැංකුවේ අධිපතිවරයාගේ සහකාරයකු විය යුතු උප සභාපතිවරයකු ;

(ඇ) (i) ලංකා බැංකුව විසින් නම් කළ යුතු ඒ බැංකුවේ සේවා නියුක්තයන් විය යුතු දෙදෙනකුගෙන් ;

(ii) මහජන බැංකුව විසින් නම් කළ යුතු ඒ බැංකුවේ සේවා නියුක්තයන් විය යුතු දෙදෙනකුගෙන් ;

(iii) ලංකා බැංකුව සහ මහජන බැංකුව නොවන වෙනත් වාණිජ බැංකු ආයතන විසින් නම් කළ යුතු සහ ඒ බැංකු ආයතනවල සේවා නියුක්තයන් වන සාමාජිකයන් දෙදෙනකු ;

(iv) වාණිජ බැංකු නොවන බැංකු ආයතන විසින් එම බැංකු ආයතන අතර එකඟත්වයෙන් නම් කළ යුතු ඒ බැංකු ආයතනවල සේවා නියුක්තයකු වන එක් සාමාජිකයකු; සහ

(v) ආයතනයේ අධි සාමාජිකයන් සහ අනුග්‍රාහක සාමාජිකයන් විසින් එහි අධි සාමාජිකයන් සහ අනුග්‍රාහක සාමාජිකයන් අතරින් තෝරා ගනු ලැබිය යුතු තුන් දෙනකු

වශයෙන් වූ මණ්ඩලයේ වෙනත් සාමාජිකයන් දහ දෙනකුගෙන් සමන්විත වූ පාලක මණ්ඩලයක් මගින් පාලනය කළ යුතුය.

(2) (1) වන උපවගන්තියේ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද මේ පනත ආරම්භවන දිනයේ දී, (ලංකා) බැංකුකරුවන් පුහුණු කිරීමේ ආයතනයේ පාලක මණ්ඩලය, මේ පනත ආරම්භ වන දින සිට වර්ෂ දෙකක කාලයකට, ආයතනයේ මණ්ඩලය විය යුතු ය.

**5.** ආයතනයේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව–

(අ) ආයතනයේ අරමුණු මුදුන්පත් කර ගැනීම හෝ ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ හෝ යෝග්‍ය වන්නා වූ සියලු ක්‍රියා කිරීම, කාරණා ඉටු කිරීම සහ දේවල් ක්‍රියාත්මක කිරීම ;

(ආ) ආයතනයේ අරමුණු ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා, අරමුදලක් පිහිටුවීම සහ පවත්වාගෙන යාම, යම් බැංකු ගිණුමක් ආරම්භ කර පවත්වාගෙන යාම, ඇප ඇතිව හෝ ඇප නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම සහ ආයතනයේ කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය විය හැකි යම් තැනැත්තන් සේවයේ යොදවා ගැනීම ; සහ

(ඇ) යම් චංචල හෝ නිශ්චල දේපල අත්කර ගැනීම, දැරීම, බද්දට ගැනීම හෝ දීම හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම සහ විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම;

ආයතනයට කළ හැකි ය.

**6.** මේ පනත ආරම්භ වූ දින පැවැති (ලංකා) බැංකුකරුවන් පුහුණු කිරීමේ ආයතනයේ සියලු ණය සහ බැරකම් ආයතනයේ ණය සහ බැරකම් විය යුතු අතර, (ලංකා) බැංකුකරුවන් පුහුණු කිරීමේ ආයතනයට අයවිය යුතු සියලු ණය සහ ඊට ගෙවිය යුතු දයක මුදල් සහ ආධාර මුදල්, මේ පනත ආරම්භ වූ දින සිට ආයතනයට ගෙවිය යුතු ය.

**7.** (1) මණ්ඩලය විසින්, රීති සෑදීමේ කාර්යය සඳහා කැඳවනු ලබන මණ්ඩලයේ රැස්වීමක දී (පැමිණ නොසිටි සාමාජිකයන් ද ඇතුළුව) එහි සාමාජිකයන්ගේ සම්පූර්ණ සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් පහත සඳහන් යම් කාරණයක් පිළිබඳව හෝ සියලු කාරණා සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි ය:—

(අ) ආයතනයේ සාමාජිකයන් වශයෙන් නාමලේඛනගත කරනු ලබන තැනැත්තන්ගේ සුදුසුකම් ; සාමාජිකයන් නාමලේඛනගත කරනු ලබන සහ සාමාජිකයන්ගේ ලේඛනයක් පවත්වාගෙන යනු ලබන ආකාරය ; සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු ; සාමාජිකත්වය පවත්නා කාලය, එය අළුත් කිරීම සහ අවසන් කිරීම ; සාමාජිකයන් වර්ගීකරණය කිරීම සහ තෝරා පත් කර ගැනීම සහ ඔවුන් විසින් අභිධාන භාවිතා කිරීම ; සාමාජිකයන් සම්බන්ධයෙන් විනය පාලනය ක්‍රියාවේ යෙදවීම ;

(ආ) මණ්ඩලයේ සාමාජිකයන් නාම යෝජනා කිරීම සහ තෝරා පත් කර ගැනීම; මණ්ඩලයේ සාමාජිකයන්ගේ ධුර කාලය, බලතල, කර්තව්‍ය සහ කාර්ය ; මණ්ඩලයේ රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම; ඒ රැස්වීම්වල ගණපූරණය; ඒ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සහ ඒ රැස්වීම් පවත්වාගෙන යා යුතු ආකාරය;

(ඇ) ආයතනයේ රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම; ඒ රැස්වීම්වල ගණපූරණය, ඒ රැස්වීම් වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සහ ඒ රැස්වීම් පවත්වාගෙන යා යුතු ආකාරය ;

(ඈ) සුදුසුකම් ලැබීමේ විභාග සහ ආයතනය මගින් සංවිධානය කරනු ලබන උපදේශක පාඨමාලාව සඳහා ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීම සහ ඔවුන් සම්බන්ධයෙන් විනය පාලනය ක්‍රියාවේ යෙදවීම ; ඒ විභාග සහ පාඨමාලා සඳහා ගෙවිය යුතු ගාස්තු; විභාග පැවැත්වීම සහ ඒවායේ නිර්දේශ පත්‍රිකා ; ආයතනයේ විභාගවලින් සාමාර්ථය ලබන ශිෂ්‍යයන්ට සහතික පත්‍ර නිකුත් කිරීම ; ආයතනයේ ශිෂ්‍යයන්ට මුදල් හෝ අන්‍යාකාරයකින් වූ ආධාර ප්‍රදානය කිරීම ;

(ඉ) ආයතනයේ දේපළ කළමණාකරණය කිරීම ; ආයතනයේ අරමුදල් වල භාරකාරත්වය, අරමුදල් පවත්වාගෙන යාම සහ විගණනය කිරීම ;

(ඊ) ආයතනයේ සේවා නියුක්තයන්ගේ පාරිශ්‍රමික සහ ඔවුන් සම්බන්ධයෙන් විනය පාලනය ක්‍රියාවේ යෙදවීම ;

(උ) ආයතනයේ මුද්‍රාවේ භාරකාරත්වය, මුද්‍රාව තැබීම සහ සහතික කිරීම ; සහ

(ඌ) ඉහත කී කරුණු හා සම්බන්ධ වූ හෝ ඊට ආනුෂංගික වූ සියලු කරුණු.

(2) මේ පනත ආරම්භ වූ දිනයේ දී බලපැවැත් වූ (ලංකා) බැංකුකරුවන් පුහුණු කිරීමේ ආයතනයේ රීති, (1) වන උපවගන්තිය යටතේ සාදනු ලැබූ ආයතනයේ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

8. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ —

"බැංකු ආයතනය" සහ "වාණිජ බැංකුව" යන්නට මුදල් නීති පනතෙහි දී ඇති අර්ථය ම ඇත්තේ ය; තවද

"ශ්‍රී ලංකා මහ බැංකුව" යන්නෙන් මුදල් නීති පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ.

---

## 1979 අංක 27 දරන මුදල් සමාගම් පාලන පනත

[සහතිකය සටහන් කළේ 1979 මැයි මස 7 වන දින]

**බැංකු නොවන මුදල් ආයතන පාලනය කිරීම සහ විධිමත් කිරීම පිණිස ද, තැන්පත්කරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරනු වස් ඒ ආයතනවල ද්‍රවශීලතාව සහ ණය ගෙවිය හැකි බව සහතික කිරීම පිණිස ද, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 1979 අංක 27 දරන මුදල් සමාගම් පාලන පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මේ පනතෙහි "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක ක්‍රියාත්මක වන්නේ ය.

## I වන කොටස

### ආයතන ලියාපදිංචි කිරීම සහ ඒවාට බලපත්‍ර දීම

**2.** (1) මේ පනතේ මේ කොටස —

(අ) රුපියල් ලක්ෂයකට නො අඩු ප්‍රාග් ධනයක් ඇති වගකීම සීමාසහිත සමාගමක් වන සෑම ආයතනයක් කෙරෙහි ද;

(ආ) රුපියල් පන් ලක්ෂයකට වැඩි තැන්පතු ඇති සෑම ආයතනයක් කෙරෙහි ද;

(ඇ) සමූහනය කළ කල්හි, රුපියල් ලක්ෂයකට නො අඩු ප්‍රාග්ධනයක් ඇති වගකීම සීමාසහිත සමාගම් වන යම් අනුබද්ධ හෝ සම්බද්ධ ආයතන දෙකක් හෝ ඊට වැඩි ගණනක් කෙරෙහි ද;

(ඈ) සමූහනය කළ කල්හි, රුපියල් පන් ලක්ෂයකට වැඩි මුළු තැන්පතු ඇති යම් අනුබද්ධ හෝ සම්බද්ධ ආයතන දෙකක් හෝ ඊට වැඩි ගණනක් කෙරෙහිද;

(ඉ) (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ නිර්දේශය පිට, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් මේ පනතේ මේ කොටස අදළ විය යුතු ආයතනයන් යයි ප්‍රකාශ කරනු ලබන යම් ආයතන කාණ්ඩයක් හෝ වර්ගයක් කෙරෙහි ද

අදළ වන්නේ ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන කෙසේ වුවද මුදල් නීති පනතේ 127 වන වගන්තියේ අර්ථානුකූල යම් බැංකු ආයතනයක් කෙරෙහි හෝ ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කරන ලද යම් සමුපකාර සමිතියක් කෙරෙහි මේ පනත අදළ නොවන්නේ ය.

**3.** මේ පනතේ මේ කොටස අදළ වන කිසි ම ආයතනයක්, ඒ ආයතනය මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති පරිදි මණ්ඩලයෙහි ලියාපදිංචි කර ඇත්නම් මිස, නියමිත දිනයෙහි හෝ ඉන් පසුව ව්‍යාපාර කටයුතු කර ගෙන නොයා යුතු ය:

එසේ වුව ද, නියමිත දිනයට පෙර ව්‍යාපාර කටයුතු කර ගෙන ගිය එවැනි යම් ආයතනයක් විසින්, නියමිත දිනයේ සිට මාස හයකට නොවැඩි කාලයක්, එසේ ලියාපදිංචි කරනු නොලැබ ව්‍යාපාර කටයුතු කරගෙන ගිය හැකි ය:

එසේ ම තවදුරටත්, ඉහත සඳහන් අතුරු විධානයෙහි සඳහන් යම් ආයතනයක් එසේ ලියාපදිංචි නොකොට ඒ ආයතනය විසින් ව්‍යාපාර කටයුතු කරගෙන යෑම සඳහා ඒ අතුරු විධානයෙහි දක්වෙන කාලය හුදෙක් එක් වරක් පමණක් දීර්ඝ කිරීමට මණ්ඩලය විසින් එහි සම්පූර්ණ අභිමතය පරිදි අවසර දිය හැකි ය.

**4.** (1) මේ පනතේ මේ කොටස අදළ වන ආයතනයක් ලියා පදිංචි කිරීම සඳහා වූ සෑම ඉල්ලීමක් ම නියමිත ආකෘතියෙහි පිළියෙළ කොට මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු අතර ඒ ඉල්ලීමෙහි ප්‍රකාශිත විස්තර තමාගේ උපරිම දැනුම හා විශ්වාසය අනුව සත්‍ය බවට හා නිවැරදි බවට ඉල්ලුම්කරු විසින් කරනු ලබන ප්‍රකාශයක් එහි ඇතුළත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ යම් ප්‍රකාශයක් හෝ තොරතුරක් එහි වැදගත් විස්තරයක දී අසත්‍ය බව දැන දැන ම ඒ ප්‍රකාශය කරන හෝ ඒ තොරතුරු සපයන හෝ සෑම තැනැත්තෙක් ම මේ පනත යටතේ වරදක් කරන්නේ ය.

**5.** (1) මේ පනතේ මේ කොටස අදාළ වන යම් ආයතනයක් ලියාපදිංචි කිරීම සඳහා මණ්ඩලය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර තිබෙන අවස්ථාවක, මණ්ඩලය විසින් —

(අ) ඒ ආයතනයේ ගණන් පොත් සහ වෙනත් ලේඛන පරීක්ෂා කළ හැකිය, නැතහොත් ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා ලවා හෝ ඒ අධ්‍යක්ෂවරයා විසින් ඒ සඳහා ලියවිල්ලකින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු ලවා හෝ ඒවා පරීක්ෂා කරවිය හැකි ය;

(ආ) ඒ ආයතනය විසින් භාර ගනු ලැබූ, ණයට ගනු ලැබූ හෝ අයදිනු ලැබූ යම් මුදල් ප්‍රමාණයක් තැන්පතුවක් ද යන බව සහ ඒ ආයතනයේ කටයුතු එහි වර්තමාන හෝ අනාගත තැන්පත්කරුවන්ට අනර්ථදායී ලෙස කර ගෙන යනු ලැබේ ද යන බව තීරණය කළ හැකි ය.

(2) ඒ ආයතනය 3 වන වගන්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබීමට යටත් නොවන බව හෝ ඒ ආයතනයේ කටයුතු එහි වර්තමාන හෝ අනාගත තැන්පත්කරුවන්ට අනර්ථදායී ලෙස කර ගෙන යන බව මණ්ඩලයේ මතය වන අවස්ථාවක, ඒ ආයතනය ලියාපදිංචි කිරීම මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කළ යුතු ය.

(3) ඒ ආයතනය 3 වන වගන්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබීමට යටත් බවත්, ඒ ආයතනයේ කටයුතු එහි වර්තමාන හෝ අනාගත තැන්පත්කරුවන්ට අනර්ථදායී ලෙස කර ගෙන නොයන බවත්, මණ්ඩලයේ මතය වන අවස්ථාවක මණ්ඩලය විසින් එම ආයතනය ලියා පදිංචි කළ යුතු ය.

(4) (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් කරනු ලබන තීරණය අවසානාත්මක හා තීරණාත්මක විය යුතු අතර එය කිසිම අධිකරණයක දී ප්‍රශ්න නොකළ යුතු ය.

**6.** මේ පනතේ මේ කොටස අදාළ වන සෑම ආයතනයක් ම ලියාපදිංචි කිරීම සඳහා, මණ්ඩලය විසින්, නියමිත ආකෘතියෙහි වූ නාම ලේඛනයක් තබා පවත්වා ගෙන යා යුතු ය.

**7.** යම් ආයතනයක් මේ පනත යටතේ ලියාපදිංචි කර ඇති අවස්ථාවක, මේ පනත යටතේ සාදන ලද රීතිවලට අනුකූලව මණ්ඩලය විසින් නියම කළ හැකි කොන්දේසි වලට යටත්ව, මණ්ඩලය විසින්, නියමිත ආකෘතියෙහි වූ බලපත්‍රයක් ඒ ආයතනයට නිකුත් කළ යුතු ය. ඒ බලපත්‍රය සියලු වේලාවන්හිදී ඒ ආයතනයේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ ව්‍යාපාර ස්ථානයෙහි ප්‍රදර්ශනය කළ යුතු ය.

**8.** (1) මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ යම් ආයතනයක් විසින් ව්‍යාපාර කටයුතු කර ගෙන යෑම අවසන් කර තිබෙන අවස්ථාවක, ඒ අවසන් කිරීම පිළිබඳ දැන්වීමක්, ඒ අවසන් කිරීමෙන් පසු මාස තුනක් ඇතුළත —

(අ) ඒ ආයතනය සංස්ථාවක් වන අවස්ථාවක, එහි අධ්‍යක්ෂවරයා, කළමනාකරු හෝ ලේකම්වරයා විසින්;

(ආ) ඒ ආයතනය සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයක් වන අවස්ථාවක, ඒ මණ්ඩලය සංයුක්ත වී ඇත්තේ යම් පුද්ගලයන්ගෙන් ද ඒ සෑම පුද්ගලයකු විසින්; හෝ

(ඇ) ඒ ආයතනය පුද්ගලයකු වන අවස්ථාවක, ඒ පුද්ගලයා විසින් හෝ ඔහු මිය ගොස් නම් ඔහුගේ නීත්‍යානුකූල නියෝජිතයන් විසින්

මණ්ඩලයට දිය යුතු ය.

(2) (1) වන උප වගන්තිය යටතේ දැන්වීමක් ලැබුණු විට මණ්ඩලය විසින් ඒ ආයතනයේ නාම ලේඛනයෙන් ඉවත් කොට ඒ ආයතනයේ බලපත්‍රය අවලංගු කළ යුතු ය.

9. (1) මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ යම් ආයතනයක් ව්‍යාපාර කටයුතු කර ගෙන නොයන බව විශ්වාස කිරීමට මණ්ඩලයට සාධාරණ හේතු ඇති අවස්ථාවක, ඒ ආයතනය ව්‍යාපාර කටයුතු කර ගෙන යාම අවසන් කර නොමැති බව මණ්ඩලයේ දන්වීමේ දිනයේ සිට මාසයක් ඇතුළත ඔප්පු කරන ලෙස එම ආයතනයට නියම කරමින් මණ්ඩලය විසින් ඒ ආයතනයට ලියාපදිංචි තැපැලෙන් දන්වීමක් යැවිය හැකි ය. ඒ කාලය තුළ එය ඔප්පු කිරීම ඒ ආයතනය විසින් පැහැර හරින අවස්ථාවක, මණ්ඩලය විසින් ඒ ආයතනයේ නම නාම ලේඛනයෙන් ඉවත් කොට ඒ ආයතනයේ බලපත්‍රය අවලංගු කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය අනුව නාම ලේඛනයෙන් නම ඉවත් කරනු ලැබූ යම් ආයතනයක් විසින් ඉන් පසු මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබීම සඳහා මණ්ඩලයෙන් ඉල්ලා සිටින අවස්ථාවක, 5 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කොට තිබෙන බවට සහ මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් රීතියක හෝ විධානයක විධිවිධාන අතුරින් කිසියම් විධිවිධානයක් කඩ කිරීම පිළිබඳව ඒ ආයතනය වරදකරු වී නොමැති බවට මණ්ඩලය සෑහීමට පත්වීමෙන් පසු, මණ්ඩලය විසින් ඒ ඉල්ලීම ලියාපදිංචි කිරීම සඳහා වූ අලුත් ඉල්ලීමක් ලෙස සලකා ඒ ආයතනය ලියාපදිංචි කළ හැකි ය. එවැනි යම් ආයතනයක් ලියාපදිංචි කිරීම මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කිරීම අවසානාත්මක විය යුතු අතර එය කිසිම අධිකරණයක දී ප්‍රශ්න නොකළ යුතු ය.

(3) නිසි බලය ඇති අධිකරණයක් විසින්, මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ ආයතනයක් ගණන් බේරා වසා දැමීම සඳහා ආඥාවක් කර තිබෙන අවස්ථාවක මණ්ඩලය විසින් ඒ ආයතනයේ නම නාම ලේඛනයෙන් ඉවත් කොට ඒ ආයතනයේ බලපත්‍රය අවලංගු කළ යුතු ය.

10. (1) මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ යම් ආයතනයක ඇති තැන්පතු ගිණුමක් අක්‍රියව තුබූ අවස්ථාවක, එනම්, අවුරුදු දහයකට අධික කාලයක් තුළ, ඒ තැන්පතුවෙන් මුදල් ආපසු නොගෙන හෝ ඊට මුදල් එකතු නොකර හෝ තිබූ අවස්ථාවක (නැතහොත් තැන්පතුකරුගෙන් හෝ ඔහුගේ නීත්‍යානුකූල නියෝජිතයාගෙන් තැන්පතුව සම්බන්ධයෙන් කිසිම ලියවිල්ලක් ආයතනයට නොලැබ තුබූ අවස්ථාවක) එසේ තැන්පත්ව තිබෙන මුදල්, ඊට උපචිත පොලියක් වෙතොත් එය ද සමග ශ්‍රී ලංකා මහ බැංකුවේ විශේෂ ගිණුමකට මාරු කරන ලෙස මණ්ඩලය විධාන කළහොත්, ඒ ආයතනය විසින්, වෙනත් යම් නීතියක කුමක් සඳහන් වී තිබුණද, එය එසේ මාරු කළ යුතු ය.

(2) මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ යම් ආයතනයක තමාගේ බැරට තමාගේ නමින් හෝ තමාට හිමිකම් ව්‍යුත්පන්න වන්නේ යම් තැනැත්තකුගෙන් ද ඒ තැනැත්තාගේ නමින් හෝ ඇති යම් තැන්පතුවක් (1) වන උපවගන්තිය යටතේ මහ බැංකුවේ විශේෂ ගිණුමකට මාරු කර ඇති බව මණ්ඩලය සෑහීමට පත් වන පරිදි ඔප්පු කරන යම් තැනැත්තකු, යම් ලිඛිත නීතියකින් හෝ නීතියක් යටතේ ඒ මුදල් සම්බන්ධයෙන් පනවා ඇති නියමයන්ට, කොන්දේසිවලට හෝ සීමා කිරීම් වලට යටත්ව, ඒ මුදල්, මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණ අනුව ඒ මුදල ආපසු ගෙවනු ලැබූ දිනය දක්වා වූ පොලියත් සමග හෝ පොලිය නොගෙවන ලෙස මණ්ඩලය තීරණය කළහොත් ඒ පොලිය රහිතව මහ බැංකුව විසින් ආපසු ගෙවනු ලැබීමට හිමිකම් ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ විශේෂ ගිණුමකට මාරු කරනු ලැබූ යම් මුදලක්, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි කාර්යයන් සඳහා ප්‍රයෝජනයට ගත හැකි ය.

## II වන කොටස

### ආයතන සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය සතු බලතල, කටයුතු හා කාර්යයන්

**11.** මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇති හෝ ලියාපදිංචි කරනු ලැබ නොමැති ආයතන කෙරෙහි මේ කොටසෙහි හා III වන කොටසෙහි විධිවිධාන අදාළ වන්නේ ය.

**12.** (1) මණ්ඩලය විසින්, මේ පනතේ කාර්යයන් සඳහා, ආයතනවල හෝ යම් ආයතන කාණ්ඩයක හෝ වර්ගයක ව්‍යාපාර කටයුතුවල කිසියම් අංශයක් පවත්වාගෙන යා යුතු ආකාරය සහ ක්‍රමය පිළිබඳව, ඒ ආයතනවලට විධාන කළ හැකි ය.

(2) (1) වන උපවගන්තියෙන් පැවරුණු බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව මණ්ඩලය විසින් පහත සඳහන් කරුණු පිළිබඳව ආයතනවලට හෝ යම් ආයතන කාණ්ඩයකට හෝ වර්ගයකට හෝ විධාන කළ හැකි ය:—

(අ) ඒ ආයතන විසින් තැන්පතු භාර ගැනීම කළ යුත්තේ යම් නියමවලට හා කොන්දේසි වලට යටත් ව ද ඒ නියම හා කොන්දේසි, ආයතනයක් වෙත එක් තැනැත්තකුගේ නමින් එක් ගිණුමක හෝ එකකට වැඩි ගිණුම් ගණනක තැන්පත් කළ හැකි උපරිම මුදල් ප්‍රමාණය, ඒ තැන්පතු වෙනුවෙන් ගෙවිය යුතු උපරිම පොලී ප්‍රමාණයන් හා තැන්පතු භාර ගත හැක්කේ යම් උපරිම කාල සීමා සඳහා ද ඒ උපරිම කාලසීමා;

(ආ) ඒ ආයතන විසින් ගණන් පොත් හෝ වෙනත් වාර්තා හෝ ලේඛන පවත්වා ගෙන යා යුතු ආකෘතිය සහ ආකාරය;

(ඇ) ඒ ආයතන විසින් යම් ණයක් දිය හැක්කේ යම් නියමවලට හා කොන්දේසි වලට යටත්ව ද ඒ නියම හා කොන්දේසි;

(ඈ) යම් ණයක් වෙනුවෙන් ඒ ආයතන විසින් අය කළ හැකි උපරිම පොලී ප්‍රමාණය;

(ඉ) කොමිස්, වට්ටම්, ගාස්තු හෝ කවර ආකාරයේ වූ හෝ වෙනත් ගෙවීම් වශයෙන් ඒ ඒ ආයතනවලට ගෙවිය හැකි හෝ ඒ ආයතන විසින් අය කළ හැකි මුදල්වල උපරිම ප්‍රමාණයන්;

(ඊ) ඒ ආයතන විසින් මුදල් ආයෝජනය කළ හැක්කේ යම් නියමවලට හා කොන්දේසි වලට යටත්ව ද ඒ නියම හා කොන්දේසි;

(උ) ඒ ආයතනවල ප්‍රාග්ධනය හා ඒ ආයතනවල මුළු තැන්පතු බැරකම් හා අතර විය යුතු අවම අනුපාතය;

(ඌ) ඒ ආයතනවල ද්‍රවශීල වත්කම් හා ඒ ආයතනවල මුළු තැන්පතු බැරකම් හා අතර විය යුතු අවම අනුපාතය සහ ඒ අනුපාතය ගණන් බැලීමේදී ගණන් ගත යුතු ද්‍රවශීල වත්කම් වර්ග;

(එ) ශක්‍ය ගැණුම්කරුවකු විසින් යම් කුලී සින්නක්කර ගිවිසුමක් මත කළ යුතු අවම මූලික ගෙවීම සහ විවිධ පන්තිවල ගනුදෙනු සම්බන්ධයෙන් නියමිත විවිධ මූලික ගෙවීම්; මෙකී අවම මූලික ගෙවීම භාණ්ඩවල වටිනාකමේ ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශ කරනු ලැබිය හැකි ය; සහ

(ඒ) ඒ ආයතන විසින් දෙනු ලබන ණය සහ කරනු ලබන ආයෝජන විෂයෙහි ඉඩ දෙනු ලැබිය හැකි කල් පිරීමේ උපරිම කාලසීමා සහ විවිධාකාර ණය ගනුදෙනු සඳහා නියම කළ හැකි හෝ ඉඩ දිය හැකි ඇපවල ස්වභාවය සහ මුදල.

(3) (2) වන උපවගන්තියේ (අ), (ඇ), හෝ (ඈ) ඡේද යටතේ විධානයකින් නියම කරන ලද උපරිම පොලී ප්‍රමාණය, ඒ විධානයේ දිනයට පෙර භාරගන්නා ලද යම් තැන්පතුවක් සම්බන්ධයෙන් හෝ ලබා ගත් යම් ණයක් සම්බන්ධයෙන් හෝ අදාළ විය යුතු ය:

එසේ වුවද —

(අ) එවැනි යම් තැන්පතුවක් හෝ ණයක් වෙනුවෙන් ඒ විධානයේ දිනයට පෙර උපචිත යම් පොලියකට එවැනි යම් විධානයක වූ කිසිවක් අදාළ නොවිය යුතු ය; නැතහොත්

(ආ) ඒ විධානයේ දිනයට පෙර භාරගන්නා ලද යම් තැන්පතුවක් වෙනුවෙන් ගෙවියයුතු පොලී ප්‍රමාණය අඩු කිරීමෙන් තැන්පතුවට අදාළ ගිවිසුම හෝ සම්මුතිය උල්ලංඝනය වන්නේ නම්, ඒ තැන්පතුව වෙනුවෙන් එසේ ගෙවිය යුතු පොලී ප්‍රමාණය අඩුකරන ලෙස එවැනි යම් විධානයක වූ කිසිවකින් නියම නොකළ යුතු ය.

(4) මණ්ඩලය විසින්, මේ පනතේ කාර්යය සඳහා, අවශ්‍ය අවස්ථාවල දී, (1) වන උප වගන්තියේ සහ (2) වන උපවගන්තියේ දක්වා ඇති ආකාරයෙන්, ඒ උපවගන්තිවල සඳහන් කාරණා පිළිබඳ ව යම් ආයතනයකට විශේෂයෙන් විධාන නිකුත් කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, විශේෂයෙන් විධාන දෙනු ලැබූ ඒ ආයතනය විසින් නිසි බලය ඇති අධිකරණය වෙත තත් කාර්යය සඳහා ඉල්ලීමක් කරනු ලැබූ විට, ඒ අධිකරණය විසින්, එවැනි යම් විධාන යක් බලපවත්නා කාලය අතරතුර ඕනෑම වේලාවක දී, ඒ විධානයට යටත් නොවී ඒ ආයතනයේ කටයුතු කර ගෙන යාමට අවසර දෙන ප්‍රකාශයක් නිකුත් කිරීම හෝ ඒ අධිකරණය තීරණය කරන ආකාරයකින් ඒ විධානය වෙනස් කිරීම හෝ අමුතු කිරීම හෝ කරනු ලැබිය හැකි අතර මණ්ඩලය විසින් කරන ලද විධානයේ පටහැනිව කුමක් සඳහන් වී තිබුණ ද, ඒ අධිකරණය විසින් නිකුත් කරන ලද ඉහත කී ප්‍රකාශය බලපැවැත්විය යුතු ය.

13. ආයතනය විසින් භාර ගන්නා ලද, ණයට ගන්නා ලද හෝ අයදින ලද යම් මුදලක් තැන්පතුවක්දැයි නිශ්චය වශයෙන් දැනගැනීම සඳහා අවශ්‍ය සියලු තොරතුරු සපයන ලෙස මණ්ඩලය විසින් යම් ආයතනයක යම් අයිතිකරුවකුට, හවුල්කරුවකුට, අධ්‍යක්ෂවරයකුට, කළමනාකරුවකුට, ලේකම්වරයකුට හෝ සේවා නියුක්තයකුට නියම කළ හැකි ය.

14. (1) මණ්ඩලය විසින් කලින්කල කරනු ලබන විධාන මගින් —

(අ) පොදුවේ ආයතනවල හෝ යම් ආයතන වර්ගයක හෝ පන්තියක හෝ ණයවල හෝ ආයෝජනවල මුදල එම ආයතන විසින් වැඩි කිරීම තහනම් කළ හැකි ය; නැතහොත්

(ආ) (අ) ඡේදයෙහි දැක්වෙන ආයතන විසින් දී තිබෙන ණයවල හෝ කර තිබෙන ආයෝජනවල මුදල නිශ්චිත කාල සීමා තුළ වැඩි කළ හැකි ප්‍රමාණ නියම කළ හැකි ය:

එසේ වුව ද, ඒ ආයතන විසින් දී තිබෙන ණයවල හෝ කර තිබෙන ආයෝජනවල ප්‍රමාණය විධානයේ දිනයේ දී හිඟ ඇති මුදලට අඩු මුදලකට අඩු කිරීම එකී යම් විධානයක වූ කිසිවකින් ඒ ආයතනවලට නියම වෙතැයි නොසැලකිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ විධානයක් එම උපවගන්තියෙහි සඳහන් යම් ආයතනයක සියලු ණය සහ ආයෝජන කෙරෙහි නැතහොත් ඒ ණය සහ ආයෝජනවල යම් නිශ්චිත පන්තියක් හෝ පන්ති කෙරෙහි අදාළ කළ හැකි ය. එහෙත් පොදුවේ ඒ සියලු ආයතන කෙරෙහි හෝ ඒ ආයතනවල යම් වර්ගයක් හෝ පන්තියක් කෙරෙහි ඒකාකාරව සහ විශේෂතාවෙන් තොරව ඒ විධානය අදාළ කළ යුතු ය.

15. (1) ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් කවර වූ හෝ වේලාවක යම් ආයතනයක ගණන් පොත් පරීක්ෂා කිරීම හෝ පරීක්ෂා කිරීමට ඔහුගේ කාර්යාංශයේ යම් නිලධරයකුට බලය දීම හෝ කළ හැකි ය.

(2) එවැනි යම් පරීක්ෂණයක වාර්තාව ඒ පරීක්ෂණය අවසන් වූ ඉක්මණින් බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය. ඒ පරීක්ෂණයේ පිරිවැය බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් ආයතනයෙන් අයකර ගත හැකි ය.

(3) බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු විසින් —

(අ) යම් ආයතනයක යම් අයිතිකරුවකු, හවුල්කරුවකු, අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු, ලේකම්වරයකු හෝ සේවා නියුක්තයකු දිවුරුම් ආඥාපනතට අනුකූලව දිවුරවීම හෝ ඔහු ලවා සහතික ප්‍රකාශ කරවීම;

(ආ) යම් ආයතනයක කටයුතුවල සැබෑ තත්ත්වය හා වර්තමාන හා අනාගත තැන්පත් කරුවන්ට අනර්ථදායී වන ලෙස ආයතනය පවත්වාගෙන යන්නේ ද යන වග නිශ්චිත වශයෙන් දැනගැනීම සඳහා අවශ්‍ය යයි අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයකු හෝ සලකන සියලු තොරතුරු සපයන ලෙස ඒ ආයතනයේ යම් අයිතිකරුවකුට, හවුල්කරුවකුට අධ්‍යක්ෂවරයකුට, කළමනාකරුවකුට, ලේකම්වරයකුට හෝ සේවා නියුක්තයකුට නියම කිරීම; සහ

(ඇ) යම් අවශ්‍ය තොරතුරක් ඇතුළත් හෝ ඇතුළත් විය හැකි තම සන්තකයෙහි තිබෙන යම් පොත්, වාර්තා හෝ වෙනත් ලේඛන පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරන ලෙස යම් ආයතනයක යම් අයිතිකරුවකුට, හවුල්කරුවකුට, අධ්‍යක්ෂවරයකුට, කළමනාකරුවකුට, ලේකම්වරයකුට හෝ සේවා නියුක්තයකුට නියම කිරීම.

නීත්‍යානුකූල වන්නේ ය.

(4) බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලබන කවර අවස්ථාවක වුව ද යම් ආයතනයක මුදල් ශේෂ, එහි වත්කම් සහ බැරකම් ද ඇතුළුව එහි සියලු පොත් හා වාර්තා බැලීමට ඒ අධ්‍යක්ෂවරයාට හෝ ඒ අධ්‍යක්ෂවරයා විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයකුට ඉඩ දීම ඒ ආයතනයේ සෑම අයිතිකරුවකුගේ, හවුල්කරුවකුගේ, අධ්‍යක්ෂවරයකුගේ, කළමනාකරුවකුගේ, ලේකම්වරයකුගේ හෝ සේවා නියුක්තයකුගේ යුතුකම වන්නේ ය.

**16.** (1) ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින්ම හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු විසින් හෝ යම් ආයතනයක කටයුතු පරීක්ෂා කරනු ලැබීමෙන් පසුව හෝ ආයතනයෙන් ලැබුණු තොරතුරු අනුව හෝ එම ආයතනය බුන්වත් යයි හෝ ආයතනයේ තැන්පත්කරුවන්ගේ ඉල්ලීම් ඉෂ්ට කිරීමට නොහැකි තත්ත්වයකට එය පත්වීමට ඉඩ තිබේ යයි හෝ එම ආයතනය ව්‍යාපාර කටයුතුවල තවදුරටත් යෙදී සිටීම නිසා ඒ ආයතනයේ තැන්පත්කරුවන්ට සහ ණය හිමියන්ට පාඩු සිදුවීමට ඉඩ තිබේ යයි ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා සෑහීමට පත්වන යම් අවස්ථාවක, අධ්‍යක්ෂවරයා විසින්, මණ්ඩලයට ඉදිරිපත් කිරීම පිණිස, මහ බැංකුවේ අධිපතිවරයා වෙත ඒ අනුව වාර්තාවක් යැවිය යුතු ය; තව ද සිද්ධීන් සහ කරුණු සමාලෝචනයට භාජන කිරීමෙන් පසු, මෙහි මින් මතු විධිවිධාන සලස්වනු ලැබ ඇති පරිදි ක්‍රියා කළ යුතු යයි මණ්ඩලය අදහස් කරතහොත් ශ්‍රී ලංකාවේ ව්‍යාපාර කටයුතු වහාම අත්හිටුවන ලෙස ආයතනයට විධාන කරමින් සහ ආයතනයේ සියලුම පොත්, වාර්තා සහ වත්කම් භාරගන්නා ලෙසත්, ආයතනය විසින් ව්‍යාපාර කටයුතු තවදුරටත් පවත්වාගෙන යාම වැළැක්වීම පිණිස අවශ්‍ය පියවර ගන්නා ලෙසත් අධ්‍යක්ෂවරයාට විධාන කරමින් මණ්ඩලය විසින් නියමයක් කරනු ලැබිය හැකි ය.

(2) යම් ලිඛිත නීතියක හෝ වෙනත් නීතියක කුමක් සඳහන්ව ඇත ද (1) වන උපවගන්තිය යටතේ කරන ලද යම් නියමයක් සමාලෝචනය කිරීමට හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීමට සලස්වා ගැනීමේ කාර්යය සඳහා හෝ ඒ නියමය නිසා සිදු වූ හෝ සිදුවීමට ඉඩ තිබෙන හෝ සිදුවීයයි කියනු ලබන යම් පාඩුවක් හෝ අලාභයක් සම්බන්ධයෙන් හෝ කිසිම අධිකරණයක කිසිම නඩුවක් හෝ නඩු කටයුත්තක් පවරනු නොලැබිය හැකි ය.

(3) යම් ආයතනයක් සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් කරන ලද යම් නියමයක බලපෑම එය කරන ලද දින සිට දින තිහක කාලයක් ඉකුත් වූ විට අවසාන විය යුතු ය. එවිට, හැකිතාක් ඉක්මනින්, සහ කෙසේ වුව ද එකී කාලසීමාව ඉකුත් වීමට පෙර,—

(අ) කොන්දේසි රහිතව හෝ පොදු යහපත හෝ ආයතනයේ තැන්පත්කරුවන්ගේ සහ වෙනත් ණය හිමියන්ගේ යහපත සඳහා අවශ්‍ය යයි මණ්ඩලය සලකන කොන්දේසි වලට යටත්ව හෝ ව්‍යාපාර කටයුතු නැවත ආරම්භ කිරීමට ආයතනයට අවසර දෙමින් නියමයක් කිරීම; හෝ

(ආ) ආයතනය ගණන් බේරා වසා දැමීම සඳහා මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති පරිදි, නිසි බලය ඇති අධිකරණය වෙත බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් ඉල්ලීමක් කරනු ලැබීමට සැලැස්වීම; හෝ

මණ්ඩලයේ යුතුකම වන්නේ ය.

(4) බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට, නිසි බලය ඇති අධිකරණය විසින් —

(අ) සමාගමක් වන යම් ආයතනයක් ගණන් බේරා වසා දැමීමට නියම කළ හැකි ය. එවිට ඒ අනුව අධිකරණයේ අධීක්ෂණයට යටත්ව ගණන් බේරා සමාගම් වසා දැමීමට අදාළ සමාගම් ආඥාපනතේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ ආයතනය ගණන් බේරා වසා දැමීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය; නැතහොත්

(ආ) (සමාගමක් නොවන) පුද්ගලයකු වන හෝ සංස්ථාගත නොකරන ලද පුද්ගල මණ්ඩලයක් වන යම් ආයතනයක් ගණන් බේරා වසා දැමීමට නියම කළ හැකි ය. තව ද එවැනි යම් ගණන් බේරා වසා දැමීමක දී ආයතනයේ වත්කම් එහි බැරකම් පියවීම සඳහා ප්‍රමාණවත් නොවන අවස්ථාවක ඒ පුද්ගලයාගේ හෝ ඒ මණ්ඩලය සංයුක්ත කරන සෑම පුද්ගලයකුගේම වත්කම් ඒ ආයතනය ගණන් බේරා වසා දැමීමේ කාර්යය සඳහා ඈවරකරුට ලබා දෙන ලෙස අධිකරණය විසින් ආඥා කළ හැකි ය.

(5) (4) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ආයතනයක් ගණන් බේරා වසා දැමීමේ දී, ඈවරකරු සුදුසු යයි කල්පනා කරන ආකාරයට සහ ඔහු සුදුසු යයි කල්පනා කරන පදනමක් මත ආයතනයේ වත්කම්වල සහ බැරකම්වල අගය නිශ්චය කළ යුතු ය. ගණන් බේරා වසා දැමීමේ ආඥාවක් කිරීමෙන් පසු කවර විටක වුවත්, නිසි බලය ඇති අධිකරණය විසින්. ඈවරකරුට සියලුම වත්කම් මුදල් කර ගැනීමට බලය දියහැකි අතර, ආයතනයට හිමිකම් ඇත්තා වූ ද යම් තැනැත්තකු වෙත තිබෙන්නා වූ ද, යම් මුදලක්, දේපළක් හෝ පොත් හා ලියුම් කියුම් වහාම හෝ නිශ්චිත කාලයක් ඇතුළත හෝ ඈවරකරුට ගෙවන ලෙස, භාර දෙන ලෙස, ගෙන ගොස් දෙන ලෙස, පවරණය කරන ලෙස හෝ පවරන ලෙස ඒ තැනැත්තාට නියම කිරීම ද කළ හැකි ය. ආයතනය ගණන් බේරා වසා දැමීමේ කාර්යය සඳහා වැඩ පිළිවෙලක් ඈවරකරු විසින් සකස් කර එය ස්ථිර කිරීම සඳහා නිසි බලය ඇති අධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු අතර ආයතනය ගණන් බේරා වසා දැමීම ඒ වැඩ පිළිවෙල අනුව ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(6) යම් ආයතනයක් ගණන් බේරා වසා දැමීම සඳහා මේ වගන්තිය යටතේ හෝ අන්‍යාකාරයකින් හෝ කරන ලද ඉල්ලීමක් අනුව ආඥාවක් කරන ලද යම් අවස්ථාවක, වෙන යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇත ද ඒ ගණන් බේරා වසා දැමීමේ කාර්යයන් සඳහා ඈවරකරු ලෙස බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා හෝ තත් කාර්යය සඳහා මණ්ඩලය විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකු හෝ පත්කරනු ලැබිය යුතු ය.

(7) සමාගමක් නොවන යම් ආයතනයක් ගණන් බේරා වසා දැමීම සඳහා ආඥාවක් කරන ලද අවස්ථාවක, (6) වන උපවගන්තිය යටතේ පත්කරන ලද ඈවරකරුගේ පාරිශ්‍රමිකය සහ වසා දැමීමෙහි ලා නිසි ලෙස දරන ලද සියලු පිරිවැය, ගාස්තු සහ වියදම් වෙන යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, ගණන් බේරා වසා දැමීමට ඇත්තා වූ ආයතනයේ වත්කම්වලින්, වෙනත් සියලුම හිමිකම් පෑම්වලට ඉහළින් ප්‍රමුඛත්වය දී ගෙවනු ලැබිය යුතු ය.

(8) නියමයෙහි දැක්වෙන කොන්දේසිවලට යටත්ව යම් ආයතනයකට ව්‍යාපාර කටයුතු නැවත ආරම්භ කිරීමට අවසර දෙමින් (3) වන උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් නියමයක් කරන ලද අවස්ථාවක, එම නියමය බලාත්මිතව පවත්නා කවර විටක වුවත් ආයතනය විසින් නිසි බලය ඇති අධිකරණය වෙත කරන ලද ඉල්ලීමක් පිට, ඒ ව්‍යාපාර කටයුතු නැවත ආරම්භ කිරීමට කොන්දේසි රහිතව එම ආයතනයට අවසර දෙමින් හෝ මණ්ඩලය විසින් දක්වන ලද සියලුම කොන්දේසි හෝ ඉන් කිසිවක් අධිකරණය විසින් නිශ්චය කරනු ලබන අන්දමකට වෙනස් කරමින් හෝ අමුතු කරමින් ඒ අධිකරණය විසින් ප්‍රකාශයක් කරනු ලැබිය හැකි අතර, (3) වන උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් කරන ලද නියමයෙහි කුමක් සඳහන්ව ඇත ද එවැනි යම් ප්‍රකාශයක් බලපැවැත්විය යුතු ය.

බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා වගඋත්තරකරු ලෙස එවැනි ඉල්ලීමක නම් කරනු ලැබිය යුතු අතර එය විභාග කිරීමේ දී මණ්ඩලය වෙනුවෙන් කරුණු කියා සිටීමේත්, සාක්ෂි දීමේත් හිමිකම් ඔහුට ඇත්තේ ය.

(9) යම් ආයතනයක් ගණන් බේරා වසා දැමීම සඳහා, (3) වන උපවගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති පරිදි අධ්‍යක්ෂවරයා විසින් ඉල්ලීමක් කරන ලද යම් අවස්ථාවක—

(අ) ඉල්ලීම නොවිසඳී පවත්නා කාලය තුළ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට අධිකරණය විසින් බලය දෙනු ලැබ ඇත්නම් මිස සහ අධිකරණය නියම කරනු ලබන කොන්දේසි කිසිවක් වේ නම් ඒ කොන්දේසි අනුව හැර, ඉල්ලීම නොවිසඳී පවත්නා කාලය තුළ ආයතනය විසින් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන නොයා යුතු ය; තව ද

(ආ) අධිකරණය අවශ්‍ය යයි සලකන විභාගයකින් පසු, ආයතනය බුන්වත් නොවේ යයි අධිකරණයේ මතය වුවහොත්, කොන්දේසි රහිතව හෝ පොදු යහපත හෝ ආයතනයේ තැන්පත් කරුවන්ගේ සහ වෙනත් ණය හිමියන්ගේ යහපත සඳහා අවශ්‍ය යයි අධිකරණය සලකන කොන්දේසි වලට යටත්ව හෝ ව්‍යාපාර කටයුතු නැවත ආරම්භ කිරීමට ආයතනයට අවසර දෙමින් අධිකරණය විසින් ප්‍රකාශයක් කරනු ලැබිය හැකි ය.

(10) නිසි බලය ඇති අධිකරණයක් විසින් මේ වගන්තිය යටතේ කරන ලද සෑම ආඥාවක් ම ශ්‍රේෂ්ඨාධිකරණය වෙත කළ හැකි අභියාචනයකට යටත් වන අතර සිවිල් නඩු පිළිබඳ අභියාචන සම්බන්ධයෙන් සිවිල් නඩු විධාන සංග්‍රහයේ දැක්වෙන විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව එවැනි යම් අභියාචනයකට අදාළ වන්නේ ය:

එසේ වුවද, (9) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ කරන ලද ආඥාවක් අවසානාත්මක වන අතර එය අභියාචනයට යටත් නොවන්නේ ය.

(11) නිසි බලය ඇති අධිකරණයක් වෙත මේ වගන්තිය යටතේ කරනු ලබන සෑම ඉල්ලීමක් ම රුපියල් පන්දහසක වටිනාකමින් යුත් නඩුවක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(12) මේ වගන්තියේ, යම් ආයතනයක් සම්බන්ධයෙන් වූ විට "නිසි බලය ඇති අධිකරණය" යන්නෙන්, කොළඹ දිසා අධිකරණය හෝ ආයතනයේ ප්‍රධාන කාර්යාලය ශ්‍රී ලංකාවෙහි පවත්වා ගෙන යනු ලබන දිස්ත්‍රික්කයේ දිසා අධිකරණය හෝ අදහස් වේ.

(13) (අ) යම් තොරතුරක් සපයන ලෙස හෝ යම් පොතක්, වාර්තාවක් හෝ වෙනත් ලේඛනයන් ඉදිරිපත් කරන ලෙස බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් හෝ ඒ අධ්‍යක්ෂවරයා විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු විසින් හෝ නියම කරන ලද විටක එසේ කිරීම පැහැර හරින හෝ මේ වගන්තිය යටතේ හෝ 15 වන වගන්තිය යටතේ හෝ යම් පරීක්ෂණයක් කිරීමට බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාට හෝ ඒ අධ්‍යක්ෂවරයා විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයකුට හෝ බාධා කරන හෝ ඉඩ නොදෙන යම් ආයතනයක යම් අයිතිකරුවකු, හවුල් කරුවකු, අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු, ලේකම්වරයකු හෝ සේවා නියුක්තයකු වරදකට වරදකරු විය යුතු ය.

(ආ) මේ වගන්තිය යටතේ හෝ 15 වන වගන්තිය යටතේ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා වෙත හෝ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු වෙත ඉදිරිපත් කරනු ලබන යම් වාර්තාවක හෝ සපයනු ලබන යම් තොරතුරක අසත්‍ය යයි තමා දන්නා ප්‍රකාශයක් කරන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු ය.

17. (1) මේ පනතේ හෝ එය යටතේ සාදන ලද යම් රීතියක හෝ දෙන ලද යම් විධානයක විධිවිධාන කඩ කරන හෝ ඊට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(2) පුද්ගල මණ්ඩලයක් විසින් කරන ලද මේ පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වූ විට—

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් වන අවස්ථාවක, ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු හෝ ලේකම්වරයකු; සහ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නොවන අවස්ථාවක, ඒ පුද්ගල මණ්ඩලයේ සාමාජිකයකු වන සෑම පුද්ගලයකු

වරදකට වරදකරු විය යුතු ය:

එසේ වුව ද, තමාගේ දැනුම නොමැතිව ඒ වරද කර තිබෙන බව ද ඒ වරද කිරීම වැළැක්වීමට තමා නිසි සියලු උද්යෝගයෙන් ක්‍රියා කළ බව ද ඔප්පු කළ හොත් ඒ කිසිම තැනැත්තකු වරදකරු ලෙස නොසැලකිය යුතු ය.

(3) 3 වන වගන්තියේ, 15 වන වගන්තියේ හෝ 16 වන වගන්තියේ විධිවිධාන කඩ කිරීමේ හෝ ඒ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හැරීමේ හේතුවෙන් මේ පනත යටතේ වූ වරදක් කරන සෑම තැනැත්තෙක් ම දිසා අධිකරණයක් ඉදිරිපිට පවත්වනු ලබන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට අවුරුදු තුනකට නොවැඩි කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් දස දහසකට නොවැඩි දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

(4) 3 වන වගන්තිය, 15 වන වගන්තිය හෝ 16 වන වගන්තිය යටතේ වූ වරදක් නොවන වරද කරන සෑම තැනැත්තෙක් ම, මහේස්ත්‍රාත් අධිකරණයක් ඉදිරිපිට පවත්වනු ලබන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට මාස හයකට නොවැඩි කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් දෙදහස් පන් සියයකට නොවැඩි දඩයකට හෝඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

## III වන කොටස

### පොදු විධිවිධාන

18. (1) මේ පනතේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ සහ විධිවිධාන බලාත්මක කිරීමේ කාර්යය සඳහා මණ්ඩලය විසින් රීති සෑදිය හැකි ය.

(2) විශේෂයෙන් ද (1) වන උපවගන්තියෙන් පැවරුණු බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව ද, පහත සඳහන් කරුණු සියල්ල ම හෝ ඉන් යම් කරුණක් හෝ සම්බන්ධයෙන් මණ්ඩලය විසින් රීති සෑදිය හැකි ය:—

(අ) ආයතන ලියාපදිංචි කිරීම සහ ඒ ලියාපදිංචි කිරීම සඳහා මණ්ඩලයට ගෙවිය යුතු ගාස්තු;

(ආ) මේ පනත යටතේ භාවිත කළ යුතු ආකෘති;

(ඇ) යම් ආයතනයක් විසින් හෝ යම් කාණ්ඩයක නැතහොත් වර්ගයක ආයතන විසින් හෝ මහජනයාගෙන් මුදල් තැන්පතු කැඳවමින් යම් විස්තර ප්‍රකාශයක් හෝ දැන්වීමක් නිකුත් කිරීම වියිමත් කිරීම හෝ තහනම් කිරීම සහ එවැනි විස්තර ප්‍රකාශයක් හෝ දැන්වීමක් නිකුත් කළ හැකි වන්නේ යම් කොන්දේසි යටතේ ද ඒ කොන්දේසි.

**19.** බලතල පවරා දීම සඳහා මණ්ඩලය විසින් සාදනු ලැබිය හැකි රීති කිසිවක් වේනොත් ඒ රීතිවලට යටත්ව හා ඒවාට අනුකූලව, මේ පනතේ කාර්යයන් අතුරින් යම් කාර්යයක් සඳහා මණ්ඩලය නියෝජනය කිරීම පිණිස මණ්ඩලය විසින් ස්වකීය බලය ශ්‍රී ලංකා මහ බැංකුවේ යම් නිලධරයකු වෙත ලියවිල්ලකින් පවරා දිය හැකි ය. එහෙත් ඒ නිලධරයා විසින් කරනු ලබන හෝ නොකර හරිනු ලබන යම් ක්‍රියාවක් හෝ දෙයක් සම්බන්ධයෙන් මණ්ඩලය වගකිව යුතු අතර අඛණ්ඩව ම ඒ වගකීම දැරිය යුතු ය.

**20.** මේ පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන බලගැන්වීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් මණ්ඩලය වෙත සාමාන්‍ය හෝ විශේෂ විධාන ලියවිල්ලකින් කළ හැකි අතර මණ්ඩලය විසින් ඒ විධාන ක්‍රියාත්මක කළ යුතු ය.

**21.** වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද මේ පනතෙහි විධිවිධාන බලපවත්වන්නේ ය.

**22.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුව හොත් මිස, මේ පනතෙහි—

"ආයතනය" යන්නෙන් ස්වකීය ව්‍යාපාර කටයුතු හෝ ස්වකීය ව්‍යාපාර කටයුතුවල කොටසක් තැන්පතු වශයෙන් මුදල් භාර ගැනීමෙන්, ඊට පොලී ගෙවීමෙන් සහ—

(අ) පොලියට මුදල් ණයට දීමෙන්, හෝ

(ආ) කවර වූ හෝ ආකාරයකින් මුදල් ආයෝජනය කිරීමෙන්, හෝ

(ඇ) මුදල් පොලියට දීමෙන් හා කවර වූ හෝ ආකාරයකින් මුදල් ආයෝජනය කිරීමෙන් සමන්විත වුවක් වූ සංස්ථාගත වූ හෝ සංස්ථාගත නොවූ යම් තැනැත්තෙක් හෝ පුද්ගල මණ්ඩලයක් අදහස් වේ;

"කුලියට ගන්නා" යන්නෙන් කුලී සින්නක්කර ගිවිසුමක් යටතේ භාණ්ඩ බද්දට හෝ කුලියට දෙනු ලබන්නේ හෝ විකුණනු ලැබීමට එකඟ වන්නේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා අදහස් වන අතර කුලියට ගන්නාගේ ඒ ගිවිසුම යටතේ වූ අයිතිවාසිකම් හෝ බැඳීම් පවරා දීමෙන් හෝ නීතිය ක්‍රියාත්මක වීමෙන් හෝ අයත් වන්නේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා ද ඊට ඇතුළත් වේ;

"කුලී සින්නක්කර ගිවිසුම" යන්නෙන් සතිපතා, අර්ධ මාසික හෝ මාසික වූ ගෙවීම්, බදු මිල, වාරික, කුලිය වශයෙන් හෝ අන් ලෙසකින් ගිවිසුමෙහි සඳහන් කර ඇත ද මිල දී ගැනීමේ විකල්පය සහිතව භාණ්ඩ කුලියට දීමේ ගිවිසුමක් අදහස් වේ. එහෙත්—

(අ) ගිවිසුමෙහි ඇතුළත් භාණ්ඩවල අයිතිය ගිවිසුමට එළඹෙන වේලාවේ දී හෝ භාණ්ඩ භාර දෙන විට හෝ භාණ්ඩ භාර දීමට පෙර යම් වේලාවක හෝ යම් ගිවිසුමක් අනුව අයත් වන්නේ නම් ඒ ගිවිසුම, හෝ

(ආ) භාණ්ඩ කුලියට ගන්නා හෝ මිලදී ගන්නා තැනැත්තෙක්, යම් ගිවිසුමක් අනුව ගිවිසුමෙහි ඇතුළත් භාණ්ඩවලට ම සමාන ස්වභාවයේ හෝ වර්ගයේ භාණ්ඩ විකිණීමෙහි, වෙළෙඳාමෙහි හෝ වෙළෙඳ ව්‍යාපාරයෙහි නියුක්ත තැනැත්තෙක් නම් ඒ ගිවිසුම

ඊට ඇතුළත් නොවේ;

''ප්‍රාග්ධනය'' යන්නෙන්, ගෙවා නිමි ප්‍රාග්ධනය සහ ස්ථාවර නිදහස් සංචිත අදහස් වන අතර, ආයතනය ගණන් බේරා වසා දමනු ලැබූ විටක හෝ ප්‍රාග්ධනය ආපසු දුන් නැතහොත් අඩු කල විටක, ආයතනයේ තැන්පතුවලට සහ ආයතනය ලබා ගත් වෙනත් ණයවලට පසු ස්ථානය ලැබිය යුතු සහ දෙවැනි විය යුතු වූ සහ මණ්ඩලයේ කැමැත්ත ඇතිව හැර, අඩු නොකළ යුතු හෝ ආපසු නොගෙවිය යුතු අනාරක්ෂිත ණයකරවල සහ වෙනත් ණය බැඳුම්කරවල මුඛ්‍ය අගය ඊට ඇතුළත් විය යුතු යයි මණ්ඩලය තීරණය කළහොත් ඒ මුඛ්‍ය අගය ද ඊට ඇතුළත් විය යුතු ය;

''භාණ්ඩ'' යන්නට භාණ්ඩ විකුණුම් ආඥාපනතෙහි දී ඇති අර්ථය ම ඇත්තේ ය;

''ණය'' යන්නට යම් විකිණීමක් සම්බන්ධයෙන් වූ යම් අත්තිකාරමක්, හෝ ගෙවීම කල් තැබීමක් හෝ කුලී සින්නක්කර ගිවිසුමකට අදාළ යම් ගනුදෙනුවක දී ගෙවීම කල්තැබීමක් හෝ ඇතුළත් වේ;

''නියමිත'' යන්නෙන් මේ පනත යටතේ සාදන ලද රීතිවලින් නියමිත බව අදහස් වේ.

---

## 1979 අංක 52 දරන බුද්ධිමය දේපළ නීති සංග්‍රහය පනත

[සහතිකය සටහන් කළේ 1979 අගෝස්තු මස 8 වන දින]

**ප්‍රකාශන අයිතිය, කාර්මික සැලසුම්, පේටන්ට් බලපත්‍ර, වෙළෙඳ ලකුණු, ව්‍යාපාර නාම සහ අසාධාරණ තරඟ පිළිබඳ නීති ප්‍රතිශෝධනය කිරීම, ඒකාබද්ධ කිරීම, සංශෝධනය කිරීම සහ නීති සංග්‍රහයක් ලෙස ඒ නීති අන්තර්ගත කිරීම පිණිසත් ඒවා ලියාපදිංචි කිරීම, පාලනය කිරීම හා පරිපාලනය කිරීම වඩා හොඳින් සිදු කරලීමට විධිවිධාන සැලැස්වීම පිණිසත් ඒවාට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසත් වූ පනතකි.**

**55.** (1) (අ) විදේශයක දී ගෙවීම් කිරීම් අවශ්‍ය කරන යම් අවසර ගිවිසුමක් හෝ එහි යම් සංශෝධනයක් හෝ එය අලුත් කිරීමක් ; හෝ

(ආ) ඒ අවසර ගිවිසුමට අදාළ වෙනත් අවස්ථානුගත කරුණු හේතුකොටගෙන, ඒ අවසර ගිවිසුම, එහි සංශෝධනය හෝ එය අලුත් කිරීම

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට හානිකර වන්නේ යයි විශ්වාස කිරීමට රෙජිස්ට්‍රාර්වරයාට සාධාරණ හේතු ඇති අවස්ථාවක, ඔහු විසින් ඒ කරුණ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතු අතර ඒ කරුණ පිළිබඳ තීරණයකට අදාළ වන්නා වූ, තම භාරයෙහි ඇති සියලු ලියකියවිලි ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා වෙත යැවිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ලැබුණු යම් දැනුම්දීමක් අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා විසින් එකී අවසර ගිවිසුම හෝ එහි සංශෝධනය හෝ අලුත් කිරීම ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට හානිකර යයි ලියවිල්ලකින් රෙජිස්ට්‍රාර්වරයා වෙත දන්වා සිටින ලද අවස්ථාවක, රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ ගිවිසුම පිළිබඳව ලේඛනයෙහි වූ සටහන අවලංගු කිරීම සහ නිර්බල කිරීම කළ යුතු ය.

# 1979 අංක 58 දරන ගොවිජන සේවා පනත

[සහතිකය සටහන් කළේ 1979 සැප්තැම්බර් මස 25 වන දින]

කුඹුරු ගොවිතැන් කරන අඳ ගොවීන්ගේ අඳය සුරක්ෂිත කිරීම පිණිසත්; අඳ ගොවීන් විසින් ඉඩම් හිමියන්ට ගෙවිය යුතු බද්ද නියම කිරීම පිණිසත්; කෘෂිකාර්මික භෝග සහ පශු සම්පත්වලින් නිසි ප්‍රයෝජන ගැනීමෙන් හා ඒවා නිසි පරිදි පාලනය කිරීමෙන් කුඹුරුවලින් සහ වෙනත් කෘෂිකාර්මික ඉඩම්වලින් උපරිම පලදා වර්ධනය ලබා ගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසත්; ගොවිජන සේවා කාරක සභා පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසත්; ගොවිජන සේවා කොමසාරිස්වරයා විසින් කෘෂිකාර්මික ඉඩම්වලට අදාළ අඳ සහ වෙනත් ආරාවුල් විසඳීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසත්; කොමසාරිස්වරයා වෙත ඇතැම් බලතල පැවරීම සහ කාර්ය නියම කිරීම පිණිසත්; වගා නිලධරයන් පත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසත්; ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 2 දරන කෘෂිකාර්මික පලදා වර්ධන පනත සහ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 42 දරන කෘෂිකාර්මික ඉඩම් පනත ඉවත් කිරීමට විධිවිධාන සැලැස්වීම සහ ඊ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

## II වන කොටස

### නියමිත බැංකු විසින් වගාව සඳහා දෙනු ලබන ණය සම්බන්ධයෙන් අදාළ විය යුතු විධිවිධාන

27. (1) යම් කෘෂිකාර්මික ඉඩමක, ඉඩම් හිමි ගොවියා හෝ බුත්තිකරු විසින් නියමිත ආකෘතියක සාරානුකූල වූ සාධන පත්‍රයක් පිටපත් දෙකකින් යුක්තව ලියා අත්සන් කොට එම ඉඩම් හෝ ඔහුට අයිති හෝ ඔහුට සම්බන්ධතාවක් ඇති වෙන යම් නිශ්චල දේපළක් සම්බන්ධයෙන් උකසක් හෝ බැඳීමක් ඇති කිරීමෙන් හෝ එවැනි සාධන පත්‍රයක් ලියා අත්සන් නොකර නියමිත බැංකුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් නියම හා කොන්දේසි මත හෝ ඔහුට ණයක් ලබා ගත හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් යම් සාධන පත්‍රයක් සඳහා අය කළ හැකි මුද්දර ගාස්තුව, ඒ හා සමාන බැඳුම් කරයක් හෝ උකස් කරයක් සඳහා මුද්දර ආඥාපනතේ 'අ' උප–ලේඛනය යටතේ අය කළ හැකි ගාස්තුවෙන් පහෙන් පංගුවකට සමාන ගාස්තුවක් පමණක් වේ. ඒ ගාස්තුව සාධන පත්‍රයේ අනු පිටපත සඳහා ගෙවිය යුතු අතර, ඒ සාධන පත්‍රයේ මුල් පිටපත හෝ ප්‍රතිරූප පිටපත ඒ සඳහා ගෙවිය යුතු කිසියම් ගාස්තුවක් වේ නම්, එයින් නිදහස් විය යුතුය.

(3) සෑම නියමිත බැංකුවක්—

(අ) මේ වගන්තිය යටතේ ඒ බැංකුවේ වාසියට ලියා අත්සන් කරනු ලබන සාධන පත්‍ර, ඒවා ලියා අත්සන් කරනු ලබන අනු පිළිවෙළ අනුව අනුගාමී සම්පූර්ණ සංඛ්‍යාවලින් අංක කරනු ලැබීමට සැලැස්විය යුතු ය;

(ආ) එක් එක් මාසයේ පසළොස් වන දිනට පෙර, ඒ මාසයට කලින් වූ මාසය තුළ ඒ බැංකුවේ වාසියට ලියා අත්සන් කරන ලද එබඳු සියලුම සාධන පත්‍රවල අනු පිටපත් ඒ සාධන පත්‍රවල ලැයිස්තුවක් ද සමග, ඒ නියමිත බැංකුව තම කටයුතු කරන දිස්ත්‍රික්කයේ ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා වෙත භාරදීම හෝ යැවීම කළ යුතු ය;

(ඇ) එක් එක් සතියේ බදාදා හෝ ඊට පෙර ලැබෙන ලෙස, ඒ සතියට කලින් වූ සෙනසුරාදා දිනයෙන් අවසන් වන සතිය තුළ ඒ බැංකුවේ වාසියට ලියා අත්සන් කරන ලද එබඳු සාධන පත්‍රවල ලැයිස්තුවක්, ඒ නියමිත බැංකුව තම කටයුතු කරන දිස්ත්‍රික්කයේ ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා වෙත භාරදීම හෝ යැවීම කළ යුතු ය;

(ඈ) එබඳු යම් සාධන පත්‍රයක් නියමිත බැංකුව තම කටයුතු කරන දිස්ත්‍රික්කය නොවන දිස්ත්‍රික්කයක පිහිටි යම් ඉඩමක් හෝ නිශ්චල දේපළක් කෙරෙහි බලපාන්නේ නම්, ඒ සාධන පත්‍රයේ පිටපතක් එම ඉඩම හෝ නිශ්චල දේපළ පිහිටි දිස්ත්‍රික්කයේ ඉඩම්

රෙජිස්ට්‍රාර්වරයා වෙත එසේ දෙවනු කී දිස්ත්‍රික්කයේ පිහිටි ඉඩම්වලට හෝ නිශ්චල දේපළවලට අදාළ සියලුම සාධන පත්‍රවල ලැයිස්තුවක් ද සමග ඊළඟ මාසයේ පසළොස්වන දින හෝ ඊට ප්‍රථම භාරදීම හෝ කළ යුතු ය; තවද

(ඉ) ඒ සාධන පත්‍රය ඇටෝර්නි බලකරුවකු විසින් ලියා අත්සන් කරනු ලැබුවේ නම්, ඒ ඇටෝර්නි බලපත්‍රයේ පිටපතක්, එම සාධන පත්‍රයේ ද පිටපතක් සමග එම ඉඩම හෝ නිශ්චල දේපල පිහිටි දිස්ත්‍රික්කයේ ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(4) (1) වන උපවගන්තියේ සඳහන් කවර වූ හෝ සාධන පත්‍රයක් අත්සන් කිරීම ණය මුදල දෙන බැංකුවේ හෝ කාර්යාලයේ කළමනාකරු හෝ ඒ බැංකුවේ යම් නියමිත තනතුරක් දරන යම් තැනැත්තකු සහ තවත් සාක්ෂිකරුවකු ද ඉදිරියේ කළ හැකි අතර, එය ලියා අත්සන් කිරීම සහතික කිරීම ඒ කළමනාකරු හෝ ඒ වෙනත් තැනැත්තා සහ එකී සාක්ෂිකරු විසින් ද කළ හැකි ය. තව ද ඒ සාධන පත්‍රය එසේ අත්සන් කරනු ලැබ සහතික කරනු ලැබූ අවස්ථාවක, වංචා වැළැක්වීමේ ආඥාපනතේ 2 වන වගන්තියේ කිසිවක් එයට අදාළ නොවිය යුතු ය.

(5) (1) වන උපවගන්තියේ සඳහන් යම් සාධන පත්‍රයක් ඉඩම් කෙරෙහි බලපෑමක් ඇති සාධන පත්‍රයක් වශයෙන් ලේඛන ලියා පදිංචි කිරීමේ ආඥාපනත යටතේ ලියා පදිංචි කරනු ලැබිය හැකි ය.

**28.** මේ කොටසේ විධිවිධාන යටතේ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 42 දරන කෘෂිකාර්මික ඉඩම් පනතේ අනුරූප විධිවිධාන යටතේ හෝ නියමිත බැංකුවක් විසින් යම් කෘෂිකාර්මික ඉඩමක් අයිති ගොවියකුට හෝ බුක්තිකරුවකුට දෙන ලද ණයක් වෙනුවෙන් අය විය යුතු යම් මුදලක් ගෙවීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක, ඒ මුදල අය විය යුත්තේ මුල් මුදලින් හෝ පොලියෙන් හෝ දෙකින්ම හෝ වුව ද, ඒ ණය මුදල නොගෙවා ඇති සම්පූර්ණ කොටස හා ඊට අදාළ පොළිය ගෙවීම පැහැර හැරීමක් ලෙස එය සැලකිය යුතු ය.

**29.** (1) මේ කොටසේ විධිවිධාන යටතේ, යම් ණයකින් නොබේරූ හෝ නොපියවූ සම්පූර්ණ කොටස් සහ ඊට අයත් පොලිය ගෙවීම පැහැර හරිනු ලැබූ හෝ පැහැර හරිනු ලැබූ ලෙස සැලකෙන අවස්ථාවක, එම ණය දෙනු ලැබුවේ යම් කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණයක් සම්බන්ධයෙන් ද, ඒ කෘෂිකාර්මික ඉඩම අයිති ගොවියා හෝ එහි බුත්තිකරු දැන්වීමේ සඳහන් මුදල ගෙවීම පැහැර හැර ඇති බව කොමසාරිස්වරයා වෙත නියමිත බැංකුව විසින් නිවේදනය කළ හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් දැන්වීමක් ලැබුණු පසු ඒ කෘෂිකාර්මික ඉඩමේ අයිතිකරු හෝ බුත්තිකරු ඒ මුදල ගෙවීම පැහැර හැර තිබේ ද යන්න තීරණය කිරීමේ කාර්යය සඳහා කොමසාරිස්වරයා විසින් විභාගයක් පැවැත්විය හැකි ය.

(3) ඒ විභාගයේ දී පෞද්ගලිකව හෝ නියෝජිතයකු මගින් කරුණු කියා සිටීමේ අවස්ථාවක්, කෘෂිකාර්මික ඉඩම අයිති ඉඩම්හිමි ගොවියාට හෝ එහි බුත්තිකරුට සහ නියමිත බැංකුවට දිය යුතු ය.

(4) කෘෂිකාර්මික ඉඩම අයිති ඉඩම්හිමි ගොවියාගෙන් හෝ එහි බුත්තිකරුගෙන් නියමිත බැංකුවකට යම් මුදලක් අයවිය යුතු බවට ඒ විභාගයේ දී කොමසාරිස්වරයා සෑහීමට පත් වුව හොත් නියමිත බැංකුවට අයවිය යුතු මුදල විධානයෙන් නියම කරනු ලැබිය හැකි කාලය තුළ දී ගෙවන ලෙස කොමසාරිස් වරයා විසින් ඒ කෘෂිකාර්මික ඉඩම අයිති ඉඩම් හිමි ගොවියාට හෝ එහි බුත්තිකරුට හෝ කෘෂිකාර්මික ඉඩම අයිති ඉඩම් හිමි ගොවියාගේ හෝ එහි බුත්තිකරුගේ උරුමක්කාරයකුට හෝ නීත්‍යානුකූල නියෝජිතයකුට හෝ නියම කළ යුතු ය.

(5) නියමිත බැංකුවට ගෙවීමට තමාට නියම වූ යම් මුදලක් සම්බන්ධයෙන් (4) වන උප වගන්තිය යටතේ කරන ලද නියමයකට අනුකූලව ක්‍රියා කිරීම කෘෂිකාර්මික ඉඩමක ඉඩම් හිමි ගොවියා හෝ එහි බුත්තිකරු පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන අවස්ථාවක, එම කෘෂිකාර්මික ඉඩම පිහිටි ස්ථානය විෂයෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණයට

නියමිත බැංකුව වෙනුවෙන් යම් තැනැත්තකු විසින් කරන ලද ඉල්ලීමක් අනුව එම මුදල, එම අධිකරණය විසින් ස්වකීය සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී නියම කළ හැකි දඩ ප්‍රමාණය ඉක්මවන්නේ වුව ද, ඒ අධිකරණය විසින් නියම කරන ලද දඩයක් අය කර ගන්නා ආකාරයෙන් අයකර ගත හැකි ය.

(6) (5) වන උපවගන්තියේ කාර්ය සඳහා යම් පැහැරහරින්නකුගෙන්, යම් මුදලක් නියමිත බැංකුවට අයවිය යුතු බවට වූ සහතිකයක් නිකුත් කිරීමට බලය දෙනු ලැබූ නිලධරයකු විසින් ඒ මුදල අයවිය යුතු බවට තම අත්සන යටතේ සහතිකයක් නිකුත් කරනු ලැබූ විට ඒ මුදල ඒ තැනැත්තාගෙන් ඒ බැංකුවට අයවිය යුතු බවට එය තීරණාත්මක සාක්ෂියක් විය යුතු ය:

එසේ වුව ද ඒ බුත්තිකරු අඳ ගොවියකු වී, (5) වන උපවගන්තියෙහි විධිවිධාන සලසනු ලැබූ ආකාරයෙන් ඒ මුදල අයකර ගැනීම කළ නොහැකි බව හෝ අවසථාවෝචිත නොවන බව නියමිත බැංකුව විසින් කොමසාරිස්වරයා වෙත වාර්තා කරනු ලබන අවස්ථාවක, විධිවිධාන සලසනු ලැබ ඇති ආකාරයෙන් ඒ මුදල අයකර ගැනීමට නොහැකි බව කොමසාරිස්වරයා සෑහීමට පත්වන විට, ඒ මුදල නියමිත බැංකුවට ගෙවනු ලබන තෙක් ඒ පැහැර හරින්නාගේ අඳ අයිතිවාසිකම් කොමසාරිස්වරයා විසින් අත්හිටුවිය හැකි ය.

**30.** තත්කාලයෙහි බලපවත්වන යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, නියමිත බැංකුවක් විසින් යම් කෘෂිකාර්මික ඉඩමක ඉඩම් හිමි ගොවියකුට හෝ එහි බුත්තිකරුවකුට දෙන ලද ණයක් සම්බන්ධයෙන් යම් ඉඩමක් හෝ එහි සම්බන්ධතාවක් කෙරෙහි නියමිත බැංකුවක වාසියට ඇති කරන ලද යම් බැඳීමක් හෝ උකසක්, එම බැඳීම හෝ උකස ඇති කරන ලද දිනයට පෙරාතුව එම ඉඩම හෝ එහි සම්බන්ධතාව කෙරෙහි යම් තැනැත්තකුගේ වාසියට ඇති කරනු ලැබ තිබිය හැකි වෙනත් යම් බැඳීමකට හෝ උකසකට වඩා ප්‍රමුඛත්වය ලැබිය යුතු ය.

**31.** නියමිත බැංකුවකට අය විය යුතු මුදල වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනුකූලව එම බැංකුව විසින් ආපසු අයකර ගැනීම 29 වන වගන්තියේ කිසිවකින් වැළැක්වෙතැයි නොසැළකිය යුතු ය.

**32.** ණය සහනදයක ආඥපනතේ කිසිවක් යම් නියමිත බැංකුවකට අයවිය යුතු ණයකට අදළ නොවන අතර, ඒ කිසිවක් ඒ ණයට අදළ වන ලෙස හෝ ඒ ණය ආපසු අයකර ගැනීම සම්බන්ධයෙන් යම් නියමිත බැංකුවකට ඇති අයිතිවාසිකම්වලට ඉන් හානියක් වන ලෙස හෝ ඒ අයිතිවාසිකම් කෙරෙහි එය බලපාන ලෙස හෝ සලකනු නොලැබිය යුතු ය.

---

## 1979 අංක 71 දරන විසර්ජන පනත

[සහතිකය සටහන් කළේ 1979 දෙසැම්බර් මස 22 වැනි දින]

**1980 මුදල් වර්ෂයේ සේවා වියදම් සඳහා විධිවිධාන සැලසීමත්, එම සේවා වියදම් සඳහා ශ්‍රී ලංකාවෙන් හෝ පිටරටින් හෝ ණය ලබාගැනීමට බලය දීමත්, ඒ මුදල් වර්ෂය තුළ ආණ්ඩුවේ යම් යම් කටයුතු වෙනුවෙන් මුදල් සැපයීමත්, එම කටයුතු වෙනුවෙන් ඒ මුදල් වර්ෂය තුළ අවශ්‍ය වන මුදල් ඒකාබද්ධ අරමුදලෙන් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට ඉඩ සැලසීමත්, ඒකාබද්ධ අරමුදලට ඒ මුදල් ආපසු ගෙවීමට විධිවිධාන සැලසීම සහ යථෝක්ත කරුණු හා සම්බන්ධ වූ හෝ එයට ආනුෂංගික වූ කරුණු සඳහා විධිවිධාන සැලසීමත් සඳහා වූ පනතකි.**

1. මේ පනත 1979 අංක 71 දරන විසර්ජන පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** (I) යම් මුදලක් වැය කිරීමට බලය දෙන්නා වූ අන්කිසි නීතියකට හානියක් නොමැතිව මේ පනතෙහි "1980 මුදල් වර්ෂය" යනුවෙන් සඳහන් කරනු ලබන 1980 ජනවාරි 1 වන දිනෙන් ආරම්භව 1980 දෙසැම්බර් 31 වන දින අවසන් වන කාලසීමාවේ සේවා වියදම් සඳහා අවශ්‍යවේ යයි තක්සේරු කර ඇති රුපියල් දෙදහස් හතලිස්පන් කෝටි පනස්අටදහස් හයසිය අටක් වූ ආණ්ඩුවේ වියදම—

(අ) ඒකාබද්ධ අරමුදලෙන් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල්වලින් ගෙවීම සඳහා මෙයින් බලය දෙනු ලබන ගෙවීම් වලින්; හා

(ආ) ණය වශයෙන් ලබා ගන්නා මුදල්වල සමස්තය රුපියල් එක්දහස් එකසිය විසි කෝටි දශ ලක්ෂයක් නොඉක්මවන සේ ආණ්ඩුව සඳහා හා ආණ්ඩුව වෙනුවෙන් ශ්‍රී ලංකාවෙන් හෝ පිටරටින් ලබා ගැනීමට මෙයින් බලය දෙනු ලබන ණය වශයෙන් ගන්නා මුදල්වලින්

පියවිය යුතු ය.

මෙහි ඉහත සඳහන් කළ රුපියල් දෙදහස් හතලිස් පන්කෝටි පනස්අටදහස් හයසියඅටක් වූ මුදල මේ පනතේ පළමුවන උපලේඛනයේ නියමිත පරිදි වැය කළ හැකි ය.

(2) මේ වගන්තියේ (I) වන උපවගන්තියෙහි විධිවිධාන, ආණ්ඩුව සඳහා හා ආණ්ඩුව වෙනුවෙන් ණය ලබා ගැනීමට බලය දෙනු ලබන අන්කිසි ලිඛිත නීතියක විධිවිධානවලට හානි යක් නොමැතිව බල පැවැත්විය යුතු ය.

3. (I) මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දක්වෙන එක් එක් කටයුත්තෙන් 2 වන වගන්තියෙහි සඳහන් මුදල් වර්ෂය තුළ දී ආණ්ඩුවට ලැබෙන ලැබීම් එම කටයුත්තේ ගිණුමට බැර කළ යුතුය. එහෙත් එසේ බැර කරනු ලබන ලැබීම්වල සමස්තය එම උපලේඛනයේ III වන තීරයේ අනුරූප සටහනේ දක්වෙන අවම සීමාව නොඉක්මවිය යුතු ය. එවැනි කටයුත්තකින් ඒ අවම සීමාව ඉක්මවා ලැබෙන ලැබීම් කිසිවක් වෙතොත් එය ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු ය.

(2) මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දක්වෙන එක් එක් කටයුත්ත සම්බන්ධයෙන් 2 වන වගන්තියේ සඳහන් මුදල් වර්ෂය තුළ ආණ්ඩුව විසින් දරනු ලබන වියදම් ඒ මුදල් වර්ෂය තුළ දී එම කටයුත්තෙන් ආණ්ඩුව ලබන ලැබීම් වලින් ගෙවිය යුතු ය. එහෙත් එම වියදම් එම උපලේඛනයේ II වන තීරයෙහි අනුරූප සටහනේ දක්වෙන උපරිම සීමාව නොඉක්ම විය යුතු ය.

(3) මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දක්වෙන කිසි යම් කටයුත්තක් සම්බන්ධයෙන්, 2 වන වගන්තියේ සඳහන් මුදල් වර්ෂය අවසානයේ දී හිඟව ඇති හර ශේෂය එම උපලේඛනයේ IV වන තීරයෙහි අනුරූප සටහනේ දක්වෙන උපරිම සීමාව නො ඉක්මවිය යුතු ය. තවද, ඒ මුදල් වර්ෂය අවසානයේ දී එම කටයුත්තේ මුළු බැරකම් එම උපලේඛනයේ V වන තීරයෙහි අනුරූප සටහනේ දක්වෙන උපරිම සීමාව නොඉක්මවිය යුතු ය.

4. 2 වන වගන්තියේ සඳහන් මුදල් වර්ෂය තුළ යම් අවස්ථාවක මේ පනතේ දෙවන උපලේඛනයේ I වන තීරයෙහි දක්වෙන යම් කටයුත්තකින් ආණ්ඩුවට ලැබෙන ලැබීම් ඒ කටයුත්ත සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් දරනු ලැබූ වියදම් පියවීමට ප්‍රමාණවත් නොවේ නම්, එම වියදම් පියවීම සඳහා අමාත්‍යවරයා අවශ්‍ය යයි සලකන මුදල් ඒකාබද්ධ අරමුදලෙන් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල් වලින් අත්තිකාරම් වශයෙන් ගෙවිය යුතුයයි ඔහු විසින් නියමයක් මගින් කලින් කල විධාන කළ හැකි ය. එහෙත් එසේ දෙනු ලබන අත්තිකාරම් මුදල්වල සමස්තය එම උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ දක්වෙන උපරිම වියදම් සීමාව නොඉක්මවිය යුතු ය. එකී කටයුත්ත වෙනුවෙන් අත්තිකාරම් වශයෙන් එසේ දෙන ලද මුදල් කිසිවක් අමාත්‍යවරයා විසින් නියමයක් මගින් විධාන කරනු ලබන ආකාරයට ඒකාබද්ධ අරමුදලට ආපසු ගෙවිය යුතු ය.

5. (I) යථෝක්ත උපලේඛනයේ සඳහන් කිසි යම් ශීර්ෂයක් යටතේ දක්වෙන යම් කිසි වැඩ සටහනක් යටතේ වූ පුනරාවර්තන වියදම්වලට මේ පනතේ පළමුවන උපලේඛනයෙහි විධි විධාන ප්‍රකාර, වෙන් කරනු ලැබුවා වූද, එහෙත් වියදම් නොකරන ලද්ද වූ හෝ මතුවට වියදම් නොකෙරෙනු ඇතැයි බලාපොරොත්තු විය හැකි වූද, යම් මුදලක් එම වැඩ සටහනේම මූලධන

වියදමේ වෙන් කිරීමකට හෝ එම ශීර්ෂයේම වෙන යම් වැඩ සටහනක් යටතේ පුනරාවර්තන වියදමේ හෝ මූලධන වියදමේ හෝ වෙන් කිරීමකට හෝ භාණ්ඩාගාරයේ ලේකම්ගේ හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් නිලධරයකුගේ හෝ නියමය අනුව මාරු කළ හැකි ය.

(2) මේ පනතේ පළමුවන උපලේඛනයෙහි සඳහන් යම් ශීර්ෂයක් යටතේ දක්වෙන යම් වැඩ සටහනක් යටතේ වූ මූලධන වියදමට වෙන් කරන ලද කිසිම මුදලක් ඒ වෙන් කිරීමෙන් පිටතට මාරු කරනු නොලැබිය යුතු ය.

6. (1) බලය දෙනු ලැබූ වියදම් දැරීමට බදුවලින් සහ වෙනත් ප්‍රභවයන්ගෙන් ලැබෙන ලැබීම් බලාපොරොත්තු වූ මුදල්වලට වඩා අඩු විය හැකි බවට; හෝ

(2) යම් කිසි කාර්යයක් හෝ කාර්යයන් සඳහා මුලින් විසර්ජිත මුදල් තවදුරටත් අවශ්‍ය නොවන බවට,

අමාත්‍යවරයා සෑහීමකට පත් වූ අවස්ථාවක, ඒකාබද්ධ අරමුදලින් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළහැකි වෙනත් අරමුදලකින් හෝ මුදල්වලින්, තමා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය යටතේ වියදම් කිරීම සඳහා කලින් මුදහරින ලද මුදල් සම්පූර්ණයෙන් හෝ කොටසක් ඉවත්කර ගැනීම අමාත්‍යවරයා විසින් ආණ්ඩුවේ අනුමතය ඇතිව කළ හැකි ය.

7. මේ පනතේ දෙවන උපලේඛනයේ II වන තීරයෙහි, IV වන තීරයෙහි හෝ V වන තීරයෙහි දක්වෙන යම් උපරිම සීමාවක් හෝ III වන තීරයෙහි නියමිත අවම සීමාව හෝ ආණ්ඩුවේ අනුමතය ඇතිව 1981 මැයි 31 වන දින හෝ ඊට පෙර අමාත්‍යවරයා විසින් නිය මයක් මගින් වෙනස් කළ හැකිය. නැතහොත් අහෝසි කළ හැකිය. එබඳු යම් නියමයක්, එහි එසේ ප්‍රකාශිතව ම සඳහන් කරනු ලැබුවහොත්, ඒ නියමය කරනු ලැබූ දිනයට කලින් වූ සහ එහි දක්වනු ලබන දිනයක සිට බලපැවැත්වූ ලෙස සැලකිය යුතු ය.

8. මේ පනතේ දෙවන උපලේඛනයෙහි උචිත තීරවලට යම් කටයුත්තක් හා ඒ කටයුත්ත සම්බන්ධයෙන් වූ සියලුම උපරිම සීමා හෝ ඉන් යම් සීමාවක් එකතු කිරීමෙන් පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයක් මගින් ඒ උපලේඛනය සංශෝධනය කළ හැකි ය.